අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

ඇගයීම් වාර්තාව

32 - ව්‍යාපාර අධ්‍යයනය

Curriculum
Assessment & Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

අ.පො.ස.(උ.පෙළ) විභාගය -2018

ඇගයීම් වාර්තාව

32 - ව්‍යාපාර අධ්‍යයනය

Curriculum
Assessment & Evaluation
Teaching Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

ව්‍යාපාර අධ්‍යයනය

ඇගයීම් වාර්තාව - අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2018

හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්වවිද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන්ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පො.ස.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන්ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2018 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 218191 ක් පාසල් අයදුම්කරුවෝ ද 48920 ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද ඇඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පො.ස.(උ.පෙළ) ව්‍යාපාර අධ්‍යයනය විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව, ඔවුන් ලකුණු ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද ව්‍යාපාර අධ්‍යයනය විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය හා එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පො.ස.(උ.පෙළ) 2018 විභාගයේ ව්‍යාපාර අධ්‍යයනය විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් මාගේ හෘදයාංගම ස්තූතිය පළ කරමි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

2020.05.28
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.

උපදේශකත්වය	:	බී. සනත් පූජිත විභාග කොමසාරිස් ජනරාල්
මෙහෙයවීම හා සංවිධානය	:	ගයාත්‍රි අබේගුණසේකර විභාග කොමසාරිස් පර්යේෂණ හා සංවර්ධන
සම්බන්ධීකරණය	:	එස්. ප්‍රනවදාසන් නියෝජ්‍ය විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන)
විෂය සම්බන්ධීකරණය	:	පී.ඒ. වෙනුර චන්දික සහකාර විභාග කොමසාරිස්
සංස්කරණය	:	මහාචාර්ය ගාමිනී ද අල්විස් කොළඹ විශ්ව විද්‍යාලය ආචාර්ය එම්. ඩී. පුෂ්පකුමාරි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයන අංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
සැකසුම් කමිටුව	:	ඩබ්ලිව්. එම්. සුදුබණ්ඩා වාණිජ - ගුරු උපදේශක කලාප අධ්‍යාපන කාර්යාලය, පස්සර
	:	ඩබ්ලිව්. එම්. ඒකනායක වාණිජ - ගුරු උපදේශක කලාප අධ්‍යාපන කාර්යාලය, ශ්‍රී ජයවර්ධනපුර වසන්ත ගාමිණී අබේසිංහ ශ්‍රී ලංකා ගුරු සේවය I විශාඛා විද්‍යාලය, කොළඹ 05. ෂෙරීන් කණ්ඩම්බි ශ්‍රී ලංකා ගුරු සේවය I අනුලා විද්‍යාලය, නුගේගොඩ එම්. එන්. එෆ්. වී අකීදා නියෝජ්‍ය විදුහල්පති කො/ මුස්ලිම් කාන්තා විදුහල කොළඹ 04
පරිගණක පිටපත සැකසුම	:	ඩී.ජී.චමේෂි මධුෂිකා වීරසිරි පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු
පිටකවර නිර්මාණය	:	ඒ.එල්.කේ. චතුරාණි කළමනාකරණ සේවා නිලධාරි

ඇතුළත පිටු

පිටු අංකය

I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු
1.1 ව්‍යාපාර අධ්‍යයන විෂයෙහි අභිමතාර්ථ 1
1.2 විෂය සාධනය පිළිබඳ තොරතුරු
1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය
1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 5
1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 6
1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 6
1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 7

II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
2.1 **I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**
2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 9
2.1.2 I ප්‍රශ්න පත්‍රය (ප්‍රශ්න අංක 1 සිට 30 දක්වා) 10
2.1.3 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 16
2.1.4 I ප්‍රශ්න පත්‍රයේ අංක 1-30 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ 17
2.1.5 I ප්‍රශ්න පත්‍රයේ අංක 1-30 තෙක් ප්‍රශ්න සඳහා වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස 18
2.1.6 I ප්‍රශ්න පත්‍රයේ අංක 1-30 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිගමන හා යෝජනා 19
2.1.7 I ප්‍රශ්න පත්‍රයේ අංක 31- 50 තෙක් ප්‍රශ්න, අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 21
2.1.8 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 - 50 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ 28
2.1.9 I ප්‍රශ්න පත්‍රයේ අංක 31-50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබා ඇති ආකාරය 29
2.1.10 I ප්‍රශ්න පත්‍රයේ අංක 31-50 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිගමන හා යෝජනා 30

2. 2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 32
2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 33
2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 70

III කොටස

3. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා
3.1 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 83
3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 84

I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 ව්‍යාපාර අධ්‍යයනය විෂයයෙහි අභිමතාර්ථ

මෙම පාඨමාලාව හැදෑරීමෙන් ශිෂ්‍යයා,

- මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීම හා සම්බන්ධ ගැටලුවලට, ආයතන හෝ සංවිධාන පදනම් කරගෙන විසඳුම් සෙවිය හැකි ආකාර පිළිබඳ ව නිපුණතා වර්ධනය කර ගනියි.
- ගතික ව්‍යාපාර පරිසරය අවබෝධ කර ගැනීම මගින් එයට අනුවර්තනය වීමට අවශ්‍ය කුසලතා ලබා ගනියි.
- ව්‍යාපාර හා ඊට සම්බන්ධ උපකාරක සේවා පිළිබඳ ව ලබාගන්නා න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව භාවිත කරයි.
- ව්‍යාපාර හා සම්බන්ධ සංකල්ප හා මූලධර්ම අධ්‍යයනය කිරීමටත්, සංකීර්ණ විෂය කරුණු සරල ව ග්‍රහණය කර ගැනීමටත් නිපුණතා වර්ධනය කර ගනියි.
- ව්‍යවසායකත්ව හා කළමනාකරණ කුසලතා වර්ධනය කර ගනියි.
- ව්‍යාපාර පද්ධතියක ශ්‍රිත අතර සමෝධානිත බව පෙන්වා දෙයි.
- දේශීය, කලාපීය හා ගෝලීය වශයෙන් ව්‍යාපාරවල නිරත වීමට අවශ්‍ය මූලික නිපුණතා ලබා ගනියි.
- ශ්‍රී ලංකාව තුළ යහපත් ව්‍යාපාර සංස්කෘතියක් ඇති කිරීම සඳහා අවශ්‍ය ආකල්ප ගොඩනගා ගනියි.
- සැලසුම් සහගතව ව්‍යාපාර ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට අවශ්‍ය කුසලතා ලබාගනියි.
- වෘත්තීය භූමිකාවල සාර්ථක ව කටයුතු කිරීමට අවශ්‍ය නිපුණතා ලබා ගනියි.
- සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා කළමනාකරණය හා නූතන තාක්ෂණය භාවිත කිරීමේ කුසලතා වර්ධනය කරගනියි.
- උසස් අධ්‍යාපනයට යොමු වීම උදෙසා ප්‍රවේශයක් ලබා ගනියි.

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1 විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

මාධ්‍යය	පාසල්	පෞද්ගලික	එකතුව
සිංහල	39005	4058	43063
දෙමළ	6968	1009	7977
ඉංග්‍රීසි	1911	1001	2912
එකතුව	**47884**	**6068**	**53952**

වගුව **1**

1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

ශ්‍රේණිය	පාසල් අයදුම්කරුවන්		පෞද්ගලික අයදුම්කරුවන්		එකතුව	ප්‍රතිශතය
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය		
A	2943	6.15	118	1.94	3061	5.67
B	8122	16.96	564	9.29	8686	16.10
C	17323	36.18	1566	25.81	18889	35.01
S	14310	29.88	2147	35.38	16457	30.50
F	5186	10.83	1673	27.57	6859	12.71
එකතුව	**47884**	**100.00**	**6068**	**100.00**	**53952**	**100.00**

වගුව **2**

1.2.3 ප්‍රථම වරට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

දිස්ත්‍රික්කය	පෙනී සිටි සංඛ්‍යාව	විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ		අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ		සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ		සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ		සමත් (A+B+C+S)		අසමත් (F)	
		සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
1. කොළඹ	7568	607	8.02	1263	16.69	2603	34.39	2289	30.25	6762	89.35	806	10.65
2. ගම්පහ	4621	330	7.14	774	16.75	1659	35.90	1360	29.43	4123	89.22	498	10.78
3. කළුතර	2235	150	6.71	372	16.64	775	34.68	652	29.17	1949	87.20	286	12.80
4. මහනුවර	2742	109	3.98	331	12.07	907	33.08	957	34.90	2304	84.03	438	15.97
5. මාතලේ	736	24	3.26	119	16.17	262	35.60	226	30.71	631	85.73	105	14.27
6. නුවරඑළිය	922	32	3.47	134	14.53	388	42.08	283	30.69	837	90.78	85	9.22
7. ගාල්ල	2063	141	6.83	361	17.50	702	34.03	623	30.20	1827	88.56	236	11.44
8. මාතර	1362	128	9.40	230	16.89	501	36.78	371	27.24	1230	90.31	132	9.69
9. හම්බන්තොට	756	37	4.89	106	14.02	225	29.76	238	31.48	606	80.16	150	19.84
10. යාපනය	904	56	6.19	197	21.79	319	35.29	229	25.33	801	88.61	103	11.39
11. කිලිනොච්චි	156	8	5.13	34	21.79	56	35.90	47	30.13	145	92.95	11	7.05
12. මන්නාරම	173	10	5.78	24	13.87	65	37.57	52	30.06	151	87.28	22	12.72
13. වව්නියාව	294	12	4.08	62	21.09	96	32.65	86	29.25	256	87.07	38	12.93
14. මුලතිව්	139	7	5.04	27	19.42	54	38.85	36	25.90	124	89.21	15	10.79
15. මඩකලපුව	618	26	4.21	119	19.26	247	39.97	155	25.08	547	88.51	71	11.49
16. අම්පාර	750	20	2.67	116	15.47	247	32.93	234	31.20	617	82.27	133	17.73
17. ත්‍රිකුණාමලය	494	35	7.09	77	15.59	150	30.36	141	28.54	403	81.58	91	18.42
18. කුරුණෑගල	2118	230	10.86	406	19.17	796	37.58	529	24.98	1961	92.59	157	7.41
19. පුත්තලම	1166	55	4.72	194	16.64	442	37.91	366	31.39	1057	90.65	109	9.35
20. අනුරාධපුරය	1108	55	4.96	151	13.63	426	38.45	346	31.23	978	88.27	130	11.73
21. පොළොන්නරුව	501	56	11.18	98	19.56	166	33.13	135	26.95	455	90.82	46	9.18
22. බදුල්ල	1239	58	4.68	154	12.43	415	33.49	419	33.82	1046	84.42	193	15.58
23. මොනරාගල	611	35	5.73	109	17.84	203	33.22	190	31.10	537	87.89	74	12.11
24. රත්නපුරය	1448	107	7.39	246	16.99	498	34.39	419	28.94	1270	87.71	178	12.29
25. කෑගල්ල	1173	63	5.37	162	13.81	453	38.62	355	30.26	1033	88.06	140	11.94
සමස්ත දිවයින	**35897**	**2391**	**6.66**	**5866**	**16.34**	**12655**	**35.25**	**10738**	**29.91**	**31650**	**88.17**	**4247**	**11.83**

වගුව **3**

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

පන්ති ප්‍රාන්තරය	සංඛ්‍යාතය	සංඛ්‍යාත ප්‍රතිශතය	සමුච්චිත සංඛ්‍යාතය	සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය
91-100	13	0.02	53952	100.00
81-90	704	1.30	53939	99.98
71-80	5101	9.45	53235	98.67
61-70	10597	19.64	48134	89.22
51-60	12952	24.01	37537	69.57
41-50	12155	22.53	24585	45.57
31-40	8258	15.31	12430	23.04
21-30	3343	6.20	4172	7.73
11-20	749	1.39	829	1.54
01-10	77	0.14	80	0.15
00-00	3	0.01	3	0.01

වගුව **4**

ඉහත වගුව අනුව මෙම විෂයය සඳහා පෙනී සිටි 53952 දෙනා අතුරෙන්, 31- 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇති සංඛ්‍යාව 8258කි. එය ප්‍රතිශතයක් වශයෙන් 15.31% කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 12430ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 23.04%කි.

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



ප්‍රස්තාරය 1 (RD/16/05/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයට අනුව 1වන ප්‍රශ්නයට ඉහළ පහසුතා දර්ශකයක් පෙන්නුම් කරයි. අපේක්ෂකයන්ගෙන් 98%ක් එම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇත. එබැවින් මෙම ප්‍රශ්නය අපේක්ෂකයන්ට පහසුතාව වැඩි ප්‍රශ්නයක් වන අතර එහි පහසුතා දර්ශකය 0.98කි. 27වන ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන් වැඩි දුෂ්කරතාවක් දක්වන අතර එහි පහසුතා දර්ශකය 0.14කි.

1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය



උදාහරණයක් වශයෙන් ගතහොත්, පිළිතුරු සැපයීම සඳහා ප්‍රශ්න තෝරා ගැනීමේදී 1 ප්‍රශ්නය 96%ක් පමණ පිරිසක් තෝරාගෙන ඇත. සිසුන් 41%ක් පමණ 8 ප්‍රශ්නය තෝරාගෙන ඇත.

ප්‍රස්තාරය **2** (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය



උදාහරණයක් වශයෙන් මෙහ පළමු ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20කි. මෙම ප්‍රස්තාරයට අනුව එම ලකුණුවලින් 16 - 20 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අපේක්ෂකයන් 06%ක් පමණ වේ. 11 - 15 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අපේක්ෂකයන් 40%ක් පමණ වේ. 6 - 10 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අපේක්ෂකයන් 38%ක් පමණ වේ. 0 - 05 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අපේක්ෂකයින් 16%ක් පමණ වේ.

ප්‍රස්තාරය **3** (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



ප්‍රස්තාරය 4.1 (RD/16/05/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයට අනුව අපේක්ෂකයන් වැඩිම සංඛ්‍යාවක් සාර්ථකව පිළිතුරු සපයා ඇති 1 (i) (අ) අනුකොටසෙහි පහසුතා දර්ශකය 0.86%කි. එනම් එම අනුකොටස සඳහා අපේක්ෂකයන්ගෙන් 86%ක් සාර්ථකව පිළිතුරු සපයා ඇත. ඒ අනුව එහි පහසුතාව 86%කි. අපේක්ෂකයන් අතුරෙන් අවම සංඛ්‍යාවක් සාර්ථකව පිළිතුරු සපයා ඇත්තේ 1 (v) කොටසටය. එහි පහසුතා දර්ශකය 0.22කි. ඒ අනුව එහි පහසුතාව 22%කි.

අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2018
32 - ව්‍යාපාර අධ්‍යයනය - II පත්‍රය - II කොටස
ප්‍රශ්නවල පහසුතා දර්ශකය



ප්‍රස්තාරය 4.2

ඉහත ප්‍රස්තාරයට අනුව 5වන ප්‍රශ්නයේ iv(.) අනු කොටසට හා 6වන ප්‍රශ්නයේ (ii) කොටසට ඉහළ පහසුතා දර්ශකයක් පෙන්වයි. අපේක්ෂකයන්ගෙන් 70%ක් එම අනු කොටස් සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇත. එහි පහසුතා දර්ශකය 0.70කි. 6වන ප්‍රශ්නයෙහි (i) (අ) අනු කොටස සඳහා අපේක්ෂකයන් වැඩි දුෂ්කරතාවක් දක්වන අතර එහි පහසුතා දර්ශකය 0.15කි.

II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 02 කි. මුළු ලකුණු 100කි.

- **1 - 30** දක්වා බහුවරණ ප්‍රශ්න **30**කින් ද **31 - 40** දක්වා සුදුසු වචන යොදා හිස්තැන් පිරවීමේ ප්‍රශ්න **10**කින්ද, **41 - 50** දක්වා නිශ්චිත පිළිතුරු සැපයීමේ ප්‍රශ්න **10**කින්ද සමන්විතය.
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයීම අපේක්ෂිතය.
- එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** කි.

1.2.2 ප්‍රශ්න පත්‍රය (ප්‍රශ්න අංක **1** සිට **30** දක්වා)

1. මිනිස් අවශ්‍යතා හා වුවමනා පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) පුද්ගලයෙකුට අවශ්‍යතා අසීමිත ප්‍රමාණයක් ඇති අතර වුවමනා ඇත්තේ සීමිත ප්‍රමාණයක් වේ.
(2) ව්‍යාපාරිකයකුට අවශ්‍යතා නිර්මාණය කළ හැකි අතර වුවමනා නිර්මාණය කළ නොහැකි වේ.
(3) අවශ්‍යතා පොදුවන අතර වුවමනා පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ.
(4) ආදරය, ආහාර, ආරක්ෂාව, කාර්මික අධ්‍යාපනය අවශ්‍යතාවලට නිදසුන් කිහිපයක් වේ.
(5) වුවමනා තෘප්තිමත් කර ගැනීමට පුද්ගලයෙකු යම් නිෂ්පාදිතයක් තෝරා ගැනීම අවශ්‍යතාව වේ. (……)

2. ඕනෑම සංවිධානයකට පොදු **නොවන** ලක්ෂණයක් වන්නේ,
(1) සම්පත් භාවිතා කිරීම ය. (2) මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම ය.
(3) භාණ්ඩ හෝ සේවා සැපයීම ය. (4) ලාභ ඉපැයීමේ අභිප්‍රායක් තිබීම ය.
(5) රජයේ ප්‍රතිපත්ති හා නීතිරීතිවලට අනුගත වීම ය. (……)

3. නිෂ්පාදිත වර්ගීකරණයේ ගලායෑම හා එයට අදාළ උදාහරණය නිවැරදිව දක්වා ඇති පිළිතුර කුමක් ද?
(1) ස්පෘශ්‍ය → භාණ්ඩ → කල් නොපවතින - මෝටර් වාහන
(2) ස්පෘශ්‍ය → භාණ්ඩ → පාරිභෝගික සේවා - ප්‍රවාහනය
(3) අස්පෘශ්‍ය → සේවා → සෘජු සේවා - බැංකු
(4) අස්පෘශ්‍ය → භාණ්ඩ → භාවිතය අනුව - ගෘහ භාණ්ඩ
(5) ස්පෘශ්‍ය → භාණ්ඩ → භාවිතය අනුව - රක්ෂණය (……)

4. ව්‍යාපාර පරිසර බලවේග, සාධක හා ඒවායේ බලපෑම නිවැරදිව සඳහන් කර ඇති ප්‍රකාශය කුමක් ද?
(1) ව්‍යාපාරයක පරිගණක ක්‍රියාකරුවන් අභ්‍යන්තර සාධකයක් වන අතර ඔවුන්ගේ කුසලතා අඩුකම ව්‍යාපාරයට තර්ජනයක් වේ.
(2) තරගකරුවන් වැඩි වීම ව්‍යාපාරයට තර්ජනයක් වන අතර එය ආසන්න බාහිර පරිසර බලවේගයක් වේ.
(3) විදේශ විනිමය අනුපාතය පහත වැටීම අපනයනකරුවන්ට අවස්ථාවක් වන අතර එය ආසන්න බාහිර පරිසර බලවේගයක් වේ.
(4) මූල්‍ය ආයතන සාර්ව පරිසර බලවේගයක් වන අතර ඔවුන්ගේ ඇඩි තරගකාරිත්වය ව්‍යාපාරවලට අවස්ථාවක් වේ.
(5) සංවිධාන ව්‍යුහය තුළ සන්නිවේදනය නිසි පරිදි සිදු වීම සංවිධානයට ශක්තියක් වන අතර එය ආසන්න බාහිර පරිසර බලවේගයක් වේ. (……)

5. පාරිභෝගික ආරක්ෂණය තුළින් ලැබෙන ප්‍රතිලාභ කිහිපයක් පහත දැක්වේ.
A - ගෙවන මුදලට සරිලන වටිනාකමක් ඇති භාණ්ඩ පරිභෝජනය කිරීමට හැකි වීම
B - පාරිභෝගික විශ්වාසය දිනා ගැනීමට හැකි වීම
C - භාණ්ඩයේ ප්‍රවර්ධන පිරිවැය අඩු කර ගැනීමට හැකි වීම
D - භාණ්ඩයේ ප්‍රමිතිය තහවුරු කර ගැනීමට හැකි වීම
E - විකුණුම් පිරිවැටුම වැඩි කර ගැනීමට හැකි වීම
F - වෙළෙඳ විෂමාචාරවලට එරෙහි වීමට හැකි වීම

ඉහත ඇ අතුරෙන් ව්‍යාපාරිකයකුට පමණක් ලැබෙන ප්‍රතිලාභ ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) ABC (2) ADF (3) BCE (4) BCF (5) BDF (……)

6. නිමල් හා කමල් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන නමුත් ඔවුන් අතර හවුල් ගිවිසුමක් නොතිබුණි. පසුගිය වසරේදී ඔවුන් විසින් යෙදූ ප්‍රාග්ධනයට මෙන්ම අමතරව යෙදූ ණය මුදල්වලට ද 5% ක පොලියක් ලබාගෙන ඇති අතර නිමල් තම මිතුරෙකු වූ සුනිල්ව හුදෙක් සිය කැමැත්ත මත පමණක් හවුල්කරුවෙකු ලෙස සම්බන්ධ කර ගන්නා ලදී. කමල් ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් තමන්ට දැනට ලැබෙන වැටුප ප්‍රමාණවත් නොවන බව පවසා එය වැඩි කිරීමට ඉල්ලීමක් කර ඇත.
ඉහත සිද්ධියේ දැක්වෙන පරිදි මෙම හවුල් ව්‍යාපාරය හවුල් ව්‍යාපාර ආඥා පනතට අනුව උල්ලංඝනය කර ඇති කොන්දේසි ගණන කොපමණ ද?
(1) එකකි. (2) දෙකකි. (3) තුනකි. (4) හතරකි. (5) කිසිවක් නැත.(……)

7. ඇපයෙන් සීමිත සමාගමක ලක්ෂණයක් **නොවන්නේ**,
(1) මහජනතාවට කොටස් නිකුත් කිරීමක් සිදු නොකිරීම ය.
(2) අවම වශයෙන් සාමාජිකයින් දෙදෙනෙකුවත් සිටීම ය.
(3) ලාභාංශ බෙදාහැරීමක් සිදු නොකිරීම ය.
(4) ලාභ අභිප්‍රායෙන් ආරම්භ කිරීම ය.
(5) සමාගම ඈවර කිරීමේදී එක් එක් සාමාජිකයා දායක විය යුතු මුදල සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් කිරීම ය.
(......)

8. සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීමේදී සමුපකාර සංවර්ධන කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය **නොවන්නේ**,
(1) අතුරු ව්‍යවස්ථාවේ පිටපත් දෙකක් ය.
(2) යෝජිත ආර්ථික කටයුතුවල යෝග්‍යතා වාර්තාව ය.
(3) යෝජනා සම්මත වූ වාර්ෂික මහා සභා වාර්තාව ය.
(4) සමිතිය පිහිටි ස්ථානයට ළඟාවන මාර්ග සිතියම ය.
(5) ඉල්ලුම් පත්‍රයට අත්සන් තැබූ සාමාජිකයින්ගේ පෞද්ගලික තොරතුරු ය. (......)

9. සිසිල් විධිමත් සැලසුම්කරණයට වඩා තම හැකියා මත විශ්වාසය තබා ඇති අතර අසීරු කාර්යයක් වුවත් ආරම්භ කර අඛණ්ඩව ක්‍රියාත්මක කරගෙන යාමට හැකියාවක් ඇත්තෙකි. ඔහු ව්‍යාපාරයේ පරමාර්ථ ඉටු කර ගැනීමට නව අදහස් මත කටයුතු කරයි.
ඉහත තොරතුරු අනුව සිසිල් සතු ව්‍යවසායකත්ව නිපුණතා සංඛ්‍යාව,
(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි. (5) 5 කි. (......)

10. සුළු පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපානු ලබන සාධක කිහිපයක් පහත දැක්වේ.
A - අධි තරගකාරිත්වය
B - නිවැරදිව ගිණුම් පවත්වාගෙන නොයෑම
C - යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම
D - නිවැරදි සේවකයින් බඳවා නොගැනීම
E - නව නිෂ්පාදිත කරා යොමු නොවීම
F - කර්මාන්තයේ නිෂ්පාදන තාක්ෂණය වෙනස් වීම
G - ව්‍යාපාර කාර්යඵල විශ්ලේෂණය නොකිරීම
H - රජයේ බදු සහන අඩු කිරීම
ඉහත ඇ අකුරෙන් සුළු පරිමාණ ව්‍යවසායකයකුට පාලනය කළ හැකි සාධක පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) ACEH (2) ACFH (3) BCDG (4) BDEF (5) BDEG (......)

11. මෙහි දැක්වෙන වගුවේ **X** තීරුව මගින් විවිධ මුදල් වර්ග ද, **Y** තීරුව මගින් ඊට අදාළ නිදසුන් කිහිපයක් ද දැක්වේ.
මුදල් වර්ග හා උදාහරණ නිවැරදිව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

X	Y
A. විද්‍යුත් මුදල්	1. භාණ්ඩාගාර බිල්පත
B. ආසන්න මුදල්	2. රත්‍රං
C. ව්‍යවහාර මුදල්	3. ඉල්ලුම් තැන්පත්
D. බැංකු මුදල්	4. කාසි හා නෝට්ටු
E. ද්‍රව්‍ය මුදල්	5. ණය කාඩ්පත්

(1) A-1, B-3, C-2, D-4, E-5
(2) A-2, B-4, C-3, D-1, E-5
(3) A-2, B-1, C-4, D-3, E-5
(4) A-5, B-3, C-4, D-1, E-2
(5) A-5, B-1, C-4, D-3, E-2
(......)

12. වාණිජ බැංකුවක් මගින් ලබාගත හැකි ප්‍රතිලාභ හා පහසුකම් කිහිපයක් පහත දැක්වේ.

A - පොලියක් ලබා ගැනීමට හැකි වීම
B - චෙක්පත් තැන්පත් කිරීමට හැකි වීම
C - නිත්‍ය නියෝග මත ගෙවීම් කළ හැකි වීම
D - ණයපත් ලබා ගැනීමට හැකි වීම
E - අයිරා පහසුකම් ලබා ගැනීමට හැකි වීම

ඉහත දැ අතුරෙන් ඉතිරිකිරීමේ ගිණුම් හිමියෙකුට ලබා ගත හැකි ප්‍රතිලාභ හා පහසුකම් ගණන,
(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි. (5) 5 කි. (......)

13. බණ්ඩාර ඔහුගේ මෝටර් රථය සඳහා තෙවෙනි පාර්ශ්ව රක්ෂණයක් ලබා ගෙන තිබුණි. ඔහුගේ පුතා විසින් එම වාහනය පදවාගෙන යන අවස්ථාවකදී එය නිවසක වැදී වාහනයටත් එම නිවසටත් අලාභහානි සිදු වූ අතර පුතාට ද තුවාල සිදු විය.
ඉහත සිද්ධිය අනුව රක්ෂණ වන්දි ලබාගත හැකි වන්නේ,
(1) වාහනයට පමණි. (2) නිවසට පමණි. (3) පුතාට පමණි.
(4) වාහනයට හා නිවසට පමණි. (5) නිවසට හා පුතාට පමණි. (......)

14. බිමල් කථා පැවැත්වීමට කැමති අයෙකි. ඔහුගේ කථා සාමාන්‍යයෙන් දිගු ය. ඔහු කථාවේදී බැරෑරුම් වචන භාවිච්චි කරන අතර සමහර විට පුද්ගලයින්ට ද අපහාස කරයි. ඔහු තමාගේ මතය දැඩි විශ්වාසයකින් ඉදිරිපත් කරන නමුත් ඇතැම් තොරතුරු සාවද්‍ය වේ. කෙසේ වුවත් ඔහුගේ කථා විලාසය සිත් ඇදගන්නා සුළු ය.
ඉහත විස්තර අනුව බිමල් විසින් කඩකරන්නා වූ සඵලදායී සන්නිවේදනයක ගුණාංග සංඛ්‍යාව,
(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි. (5) 5 කි. (......)

15. පහත වගුවේ **X** තීරුවේ විද්‍යුත් මාධ්‍ය හරහා කරනු ලැබූ ව්‍යාපාර ක්‍රියාකාරකම් කිහිපයක් ද, **Y** තීරුවේ විද්‍යුත් වෙළෙඳ ආකෘති කිහිපයක් ද දැක්වේ.

X	Y
A - ආගමන විගමන දෙපාර්තමේන්තුව විදේශ ගමන් බලපත් සඳහා ඉල්ලුම් පත් භාර ගැනීම	1. B2 C
B - **M** සමාගම **S** සමාගමට සහල් තොග අලෙවි කිරීම	2. C2 C
C - ගුවන් ගමන් නියෝජිතයෙකු විසින් සමන්ට ගුවන් ටිකට්පතක් අලෙවි කිරීම	3. B2 G
D - සීමාසහිත **A** සමාගම රාජ්‍ය සංස්ථාවකට පරිගණක සැපයීම	4. G2 C
E - **R** විසින් තමාගේ ඉඩම **D** නමැති පුද්ගලයාට විකිණීම	5. B2 B

විද්‍යුත් ව්‍යාපාර ක්‍රියාකාරකම් හා විද්‍යුත් වෙළෙඳ ආකෘති නිවැරදි ලෙස ගළපා ඇති පිළිතුර තෝරන්න.
(1) A-1, B-3, C-2, D-4, E-5 (2) A-2, B-4, C-3, D-1, E-5
(3) A-3, B-5, C-1, D-4, E-2 (4) A-4, B-5, C-1, D-3, E-2
(5) A-5, B-4, C-1, D-2, E-3 (......)

16. කළමනාකරණයට හා කළමනාකරණ ක්‍රියාවලියේ කාර්යයන්ට (functions) අදාළ **වඩාත්** නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) කිසියම් ගැටලුවකට ගනු ලැබූ නිශ්චිත විසඳුමක් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය 'කළමනාකරණය' වේ.
(2) ආයතනයක පරමාර්ථ හා අරමුණු ඉටු කර ගැනීමට ගනු ලබන පියවර ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය 'සැලසුම්කරණය' වේ.
(3) ආයතනයක පරමාර්ථ හා අරමුණු ඉටුකර ගැනීමට සම්පත් බෙදාහැරීමේ ක්‍රියාවලිය 'සංවිධානකරණය' වේ.
(4) ආයතනයක පරමාර්ථ හා අරමුණු ඉටුකර ගැනීම සඳහා සේවකයින්ට බලපෑම් කිරීමේ ක්‍රියාවලිය 'මෙහෙයවීම' වේ
(5) ආයතනයක පරමාර්ථ හා අරමුණු ඉටුකර ගන්නා ආකාරයට, සැලසුම්ගත හා සත්‍ය ප්‍රතිඵල අතර වෙනස්කම් නිවැරදි කිරීමට පියවර ගැනීමේ ක්‍රියාවලිය 'පාලනය' වේ. (......)

17. පහත වගුවේ **X** තීරුව මගින් තීරණ ගැනීමේ පියවර ද, **Y** තීරුව මගින් කිසියම් ආයතනයකට සම්බන්ධව එම පියවරවලට අදාළ තොරතුරු ද දැක්වේ.

X	Y
A. ගැටලුව හඳුනා ගැනීම	1. සේවා ප්‍රවර්ධන අංශයක් ස්ථාපිත කිරීම
B. විකල්ප විසඳුම් හඳුනා ගැනීම	2. අලෙවියෙන් පසු සේවා සැපයුම් ප්‍රවර්ධනය
C. විකල්ප ඇගයීම	3. විවිධ පාර්ශ්වයන්ගෙන් යෝජනා කැඳවීම
D. හොඳම විකල්පය තෝරා ගැනීම	4. පාරිභෝගික වුවමනා තෘප්තිමත් කිරීමට අපොහොසත් වීම
E. තීරණය ක්‍රියාත්මක කිරීම	5. දෙන ලද යෝජනා කළමනාකරණ කමිටුවක විශ්ලේෂණය කිරීම

තීරණ ගැනීමේ පියවර හා ඊට අදාළ තොරතුරු නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

(1) A-1, B-2, C-4, D-3, E-5 (2) A-2, B-1, C-3, D-5, E-4
(3) A-4, B-3, C-5, D-2, E-1 (4) A-4, B-2, C-3, D-1, E-5
(5) A-5, B-1, C-4, D-3, E-2 (......)

18. ඉවත්ව යාමේ සම්මුඛ පරීක්ෂණයේදී කළමනාකරුවෙකු විසින් ඉදිරිපත් කළ ප්‍රකාශය අනුව ඔහු ආයතනයෙන් ඉවත්වීමට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ, වැටුප ප්‍රමාණවත් නොවීම, විශාල සේවක සංඛ්‍යාවකගේ වැඩ අධීක්ෂණය කිරීමට සිදු වීම, එකවර විවිධ පාර්ශ්වයන්ගෙන් විධාන ලැබීම, තීරණ ගැනීමට නිදහසක් නොමැති වීම හා අවිධිමත් සම්බන්ධතා ප්‍රබල වීම හේතුවෙන් විධිමත් අධිකාරිත්වය ස්ථාපිත නොවීම වැනි කරුණු නිසා ඇති වූ මානසික ආතතියයි.

ඉහත ප්‍රකාශයට අනුව මෙම ආයතනයේ සංවිධානකරණයට අදාළ දුර්වලතා සංඛ්‍යාව,

(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි. (5) 5 කි. (......)

19. 'ක්‍රියාවලි පිරියත' යන්න නිවැරදිව විස්තර කෙරෙන ප්‍රකාශය තෝරන්න.

(1) සමාන ශ්‍රිත හෝ ක්‍රියාවලි පදනම් කරමින් සිදු කරන පිරියතයි.
(2) නිෂ්පාදන කාර්යයන් රේඛීයව ගලා යන ක්‍රමයට පදනම්ව සකස් වී ඇති පිරියතයි.
(3) කොටසක් රේඛීයව ගලා යන ක්‍රමයටත්, තව කොටසක් නම්‍ය ලෙස ගලා යන ක්‍රමයටත් පදනම්ව සකස් වී ඇති පිරියතයි.
(4) සමාන යන්ත්‍ර හා විෂම යන්ත්‍ර වෙන වෙන ම කුටිවල සවි කර සකස් වී ඇති පිරියතයි.
(5) නිෂ්පාදනය සිදු කරන නිශ්චිත ස්ථානයට සියලුම උපකරණ හා අවශ්‍ය සෙසු ද්‍රව්‍ය ගෙනවිත් සකස් කෙරෙන පිරියතයි. (......)

20. පහත සඳහන් වන්නේ තොග සම්බන්ධ වියදම් කිහිපයකි.

A - ගබඩා වියදම් E - පරීක්ෂා කිරීමේ වියදම්
B - තොග හානිවීම් F - ආරක්ෂක වියදම්
C - රක්ෂණ ගාස්තු G - මිල දී ගැනීමේ පිරිවැය
D - ගෙන ඒමේ වියදම් H - තොග හිඟ වීමේ පිරිවැය

ඉහත සඳහන් ඇ අතුරෙන් තොග පවත්වා ගැනීමට අදාළ වියදම් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ABCF (2) ABCH (3) BCDE (4) BCFH (5) CDEG (......)

21. පහත දැක්වෙන්නේ ඵලදායිතාව වැඩි කර ගැනීමට අනුගමනය කළ හැකි යැයි කළමනාකරුවන් විසින් අදහස් කෙරෙන ක්‍රම කිහිපයකි.

A - නව තාක්ෂණය භාවිත කිරීම E - නිෂ්පාදිත විවිධාංගීකරණය කිරීම
B - සහභාගීත්ව තීරණ ගැනීම හඳුන්වා දීම F - සේවක සුභසාධන වියදම් අඩු කිරීම
C - සේවක කප්පාදුව G - නිෂ්පාදිතවල ලාභාන්තිකය වැඩි කිරීම
D - සම්පත් නාස්තිය අවම කිරීම

ඉහත ඇ අතුරෙන් ඵලදායිතාව වැඩි කර ගැනීමට යෝග්‍ය **නොවන** ක්‍රම මොනවා ද?

(1) ABC (2) CDE (3) CFG (4) DEF (5) DFG (......)

22. ආයුර්වේදීය දන්තාලේප නිෂ්පාදකයකුගේ අදහස අනුව සිය නිෂ්පාදිත ස්වාභාවික වර්ණයකින්, රසයකින්, පෙනුමකින් මෙන් ම ඉහළ ගුණත්වයකින් ද සමන්විත විය යුතු ය. මෙම අදහසට වඩාත් ම ගැළපෙන අලෙවිකරණ සංකල්පය කුමක් ද?

(1) නිෂ්පාදන සංකල්පය (2) නිෂ්පාදිත සංකල්පය (3) විකුණුම් සංකල්පය
(4) අලෙවිකරණ සංකල්පය (5) සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පය (......)

23. පහත දැක්වෙන්නේ මූල්‍ය අනුපාත කිහිපයක් ගණනය කරනු ලබන ආකාර වේ.

A - ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය = $\frac{\text{බදු පසු ශුද්ධ ලාභය + පොලිය}}{\text{ස්ථාවර වත්කම්}} \times 100$

B - හිමිකම් ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය = $\frac{\text{බදු පසු ශුද්ධ ලාභය + වරණීය ලාභාංශ}}{\text{හිමිකම් ප්‍රාග්ධනය}} \times 100$

C - මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය = $\frac{\text{විකුණුම්}}{\text{මුළු වත්කම්}}$

D - ණයගැති පිරිවැටුම් අනුපාතය = $\frac{\text{විකුණුම්}}{\text{සාමාන්‍ය ණයගැතියෝ}}$

E - ජංගම අනුපාතය = $\frac{\text{ජංගම වත්කම්}}{\text{ජංගම වගකීම්}}$

ඉහත ද අතුරෙන් නිවැරදිව ගණනය කර ඇති අනුපාත ගණන,

(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි. (5) 5 කි. (......)

24. පහත වගුවේ **X** තීරුව මගින් කොළඹ කොටස් හුවමාරුවේ ගනුදෙනු වන සුරැකුම්පත් වර්ග කිහිපයක් ද, **Y** තීරුව මගින් ඒවා සඳහා ලැබෙන ප්‍රතිලාභ ද දැක්වේ.

X	Y
A. සාමාන්‍ය කොටස්	1. ප්‍රාග්ධන ලාභ ලබා ගැනීමට හැකි වීම
B. වරණීය කොටස්	2. ස්ථිර පොලී ප්‍රතිශතයක් හිමි වීම
C. කොටස් බලපත්‍ර	3. සමාගමේ අයිතිය හිමි වීම
D. සාංගමික ණයකර	4. ආයෝජනයට වැඩි ආරක්ෂාවක් ලැබීම
E. රජයේ ණය සුරැකුම්පත්	5. ස්ථිර ලාභ ප්‍රතිශතයක් ලැබීම

සුරැකුම්පත් වර්ග හා ප්‍රතිලාභ නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

(1) A-1, B-3, C-2, D-4, E-5 (2) A-3, B-2, C-1, D-5, E-4
(3) A-3, B-5, C-1, D-2, E-4 (4) A-2, B-3, C-1, D-5, E-4
(5) A-4, B-5, C-2, D-1, E-3 (......)

25. මානව සම්පත් කළමනාකරණයට අදාළ **වඩාත්** නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) නිශ්චිත අරමුණක් ඉටු කිරීම සඳහා ආයතනයේ වැඩ ඒකකවලට බෙදීම රැකියා නිර්මාණය වේ.
(2) රැකියාවක ලක්ෂණ පිළිබඳව ක්‍රමානුකූල අධ්‍යයනයක් කිරීම රැකියා විශ්ලේෂණය වේ.
(3) සේවකයකුගේ සුදුසුකම් විස්තර කෙරෙන ප්‍රකාශය රැකියා විස්තරය වේ.
(4) කිසියම් රැකියාවක් තුළ පවතින ගුණාංග විස්තර කෙරෙන ප්‍රකාශය රැකියා පිරිවිතරය වේ.
(5) රැකියා පිරිවිතරය හා රැකියා විස්තරය සකස් කිරීමට පදනම් වන්නේ රැකියා විශ්ලේෂණය වේ. (......)

26. සේවක ආකර්ෂණ ක්‍රම තුළින් ඇති විය හැකි වාසි හා අවාසි කිහිපයක් පහත දැක්වේ.

A - සේවකයින් අභිප්‍රේරණය වීම

B - සේවකයින් රඳවා ගැනීමට පහසු වීම

C - ආකර්ෂණ පිරිවැය අඩු වීම

D - නව දැනුම ආයතනයට ලබා ගැනීමට හැකි වීම

E - සේවකයන් අතර තරගයක් ඇති වීම

F - විශාල අයදුම්පත් සංඛ්‍යාවක් ලබා ගැනීමට හැකි වීම

G - සේවක කැපවීම වැඩි වීම

H - සේවක අනුස්ථාපන පුහුණු වියදම් වැඩි වීම

ඉහත ද අතුරෙන් අභ්‍යන්තර ආකර්ෂණය මගින් විය හැකි වාසි පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ABCG (2) ACDG (3) BCGH (4) CEFG (5) DEFH (......)

27. ගුවන් නියමුවකු ලෙස පුහුණුවන්නකුට ප්‍රායෝගික පුහුණුව ලබා දීම සඳහා වඩාත් ම යෝග්‍ය පුහුණු කිරීමේ ක්‍රමය වන්නේ,

(1) දේශන හා සාකච්ඡා ය. (2) සමාකරණ පුහුණුව ය. (3) සීමාවාසික පුහුණුව ය.
(4) භූමිකා රංගනය ය. (5) ආධුනික පුහුණුව ය. (......)

28. පහත වගුවේ **X** තීරුව මගින් තොරතුරු පද්ධතියක උපාංග ද **Y** තීරුව මගින් ඊට අදාළ නිදසුන් ද දැක්වේ.

X	Y
A. දෘඪාංග	1. සේවක අර්ථසාධක අරමුදල් ලිපි ගොනුව
B. මෘදුකාංග	2. පරිගණක ක්‍රියාකරු
C. ජීවාංග	3. ක්‍රියාකාරී පද්ධතිය
D. දත්ත	4. අනුමත කළ දත්ත පමණක් ඇතුළත් කිරීම
E. ක්‍රියාපටිපාටි	5. යතුරු පුවරුව

උපාංග හා නිදසුන් නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

(1) A-1, B-3, C-2, D-4, E-5 (2) A-2, B-4, C-5, D-3, E-1
(3) A-3, B-1, C-4, D-2, E-5 (4) A-5, B-3, C-1, D-4, E-2
(5) A-5, B-3, C-2, D-1, E-4 (......)

29. විද්‍යුත් (ඉලෙක්ට්‍රොනික්) තාක්ෂණය උපයෝගී කරගත් ව්‍යාපාර සම්බන්ධව දැක්වෙන නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) විද්‍යුත් ව්‍යාපාර විද්‍යුත් වාණිජ්‍යයේ උපකුලකයකි.
(2) විද්‍යුත් වාණිජ්‍යය හා විද්‍යුත් අලෙවිකරණය යනු එකම දෙයකි.
(3) විද්‍යුත් ව්‍යාපාර හා විද්‍යුත් වාණිජ්‍යය අතර සම්බන්ධයක් නැත.
(4) විද්‍යුත් වාණිජ්‍යය හා විද්‍යුත් ව්‍යාපාර යනු එකම දෙයකි.
(5) විද්‍යුත් වාණිජ්‍යය හා විද්‍යුත් අලෙවිකරණය විද්‍යුත් ව්‍යාපාරයේ උපකුලක වේ. (......)

30. ව්‍යාපාර සැලසුමක අංගයක් නිවැරදිව විස්තර කෙරෙන ප්‍රකාශය තෝරන්න.

(1) තරගකාරී හා වෙළඳපොළ අත්පත් කර ගැනීමේ (විනිවිදයාමේ) උපායමාර්ග අඩංගු වන්නේ නිෂ්පාදන සැලැස්මෙහි ය.
(2) අවශ්‍ය සම්පත් ප්‍රමාණය හා නිෂ්පාදන ප්‍රමිති අඩංගු වන්නේ මෙහෙයුම් සැලැස්මෙහි ය.
(3) අවශ්‍ය මානව සම්පත අඩංගු වන්නේ මූල්‍ය සැලැස්මෙහි ය.
(4) අවශ්‍ය සියලු ම ඇස්තමේන්තුගත තොරතුරු අඩංගු වන්නේ අලෙවි සැලැස්මෙහි ය.
(5) ව්‍යාපාර උපායමාර්ග හා සංවිධාන ව්‍යුහය විස්තර කෙරෙන්නේ මානව සම්පත් සැලැස්මෙහි ය. (......)

2.1.3 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
01.	3	16.	5
02.	4	17.	3
03.	1/ 3	18.	4
04.	2	19.	1
05.	3	20.	1
06.	3	21.	3
07.	4	22.	2
08.	5	23.	2
09.	4	24.	3
10.	5	25.	5
11.	5	26.	1
12.	3	27.	2
13.	2	28.	5
14.	4	29.	5
15.	4	30.	2

වගුව **5**

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 60කි.

2.1.4 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 - 30 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ



ප්‍රස්තාරය **5**

ඉහත ප්‍රස්තාරයට අනුව අපේක්ෂකයන්ගෙන් වැඩි ම ප්‍රතිශතයක් නිවැරදි ප්‍රතිචාර දක්වා ඇති ප්‍රශ්නය වන්නේ 1 වැනි ප්‍රශ්නයවන අතර එහි පහසුතාව 98% කි. අඩුම ප්‍රතිශතයක් නිවැරදි ප්‍රතිචාර දක්වා ඇත්තේ 27වැනි ප්‍රශ්නයටයි. එහි පහසුතාව 15%කි.

2.1.5 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 - 30 තෙක් ප්‍රශ්න සඳහා වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

ප්‍රශ්න අංකය	නිවැරදි වරණය	එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය					
		1	2	3	4	5	Missing
1	3	0.63	0.57	**97.7**	0.47	0.57	0.07
2	4	5.37	3.37	1.27	**77.03**	12.63	0.33
3	1, 3	**8.13**	15.87	**69.17**	3.2	3.43	0.2
4	2	6.27	**81.3**	3.53	4.47	4	0.43
5	3	1.37	4.97	**83.5**	3.57	6.43	0.17
6	3	6.97	30.5	**40.57**	17.53	3.87	0.57
7	4	13.13	10.83	16.67	**37.03**	21.63	0.7
8	5	5.67	12.5	12.23	10.43	**58.77**	0.4
9	4	1.13	9.13	46.33	**33.93**	9.13	0.33
10	5	2.6	2.73	9.27	19.83	**65.13**	0.43
11	5	0.2	1.2	0.87	21.23	**76.43**	0.07
12	3	20.63	41.67	**23.77**	8.4	5.03	0.5
13	2	9.8	**62.63**	2.7	19.27	5.27	0.33
14	4	2.37	11.23	30.67	**48.1**	7.4	0.23
15	4	2.03	2.8	7.03	**85.4**	2.27	0.47
16	5	4.37	13.73	12.6	10.5	**58**	0.8
17	3	1.4	1.5	**87.2**	7.4	2.37	0.13
18	4	3.3	9.7	21.53	**33.97**	30.83	0.67
19	1	**23.93**	37.7	13.93	5.77	17.9	0.77
20	1	**77.37**	12.63	3.8	4.03	1.87	0.3
21	3	2.6	4.9	**86.4**	2.5	3.3	0.3
22	2	13.6	**57.13**	7.7	10.73	10.37	0.47
23	2	4.4	**26.57**	42.67	18.7	6.9	0.77
24	3	3.03	18.57	**68.23**	7.97	2.03	0.17
25	5	20.43	16.27	7.03	7.4	**48.63**	0.23
26	1	**81.7**	9.97	3.13	2.53	2.47	0.2
27	2	1.37	**14.47**	13.6	12.3	57.83	0.43
28	5	2.2	1.67	1.57	3.1	**91.37**	0.1
29	5	26.07	7.3	3.5	7.8	**55.03**	0.3
30	2	14.03	**65.97**	2.7	9.17	7.6	0.53

වගුව 06

* එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

* Missing යනුවෙන් දක්වා ඇත්තේ, ප්‍රශ්නය සඳහා වරණ තෝරා නැති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය යි.

* I පත්‍රයේ ප්‍රශ්න අංක 1 සිට 30 දක්වා පිළිතුරු සැපයීමේ දී, වරණ තෝරා ඇති ප්‍රතිශතික අගය දක්වා ඇත.
උදා:- 1වන ප්‍රශ්නය සඳහා අපේක්ෂකයින්ගෙන් වැඩි ම ප්‍රතිශතයක් එනම් 97.7%ක් නිවැරදි ප්‍රතිචාර දක්වා තිබේ.

2.1.6 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 - 30 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිගමන හා යෝජනා

1-30 දක්වා බහුවරණ ප්‍රශ්න සැලකූ විට ප්‍රශ්න අංක 7, 9, 12, 18, 19, 23, හා 27 යන ප්‍රශ්නවල පහසුතාව 40%කට වඩා අඩු ය. එම ප්‍රශ්නවලට අදාළ ඒකක හා එක් එක් ප්‍රශ්නවල පහසුතාව පහත දැක්වේ.

ප්‍රශ්න අංක	පාඩම් ඒකක	පහසුතාව
07	ව්‍යාපාර සංවිධාන	37%
09	ව්‍යවසායකත්වය	34%
12	මුදල් හා බැංකු	24%
18	කළමනාකරණය	34%
19	මෙහෙයුම් කළමනාකරණය	24%
23	මූල්‍ය කළමනාකරණය	27%
27	මානව සම්පත් කළමනාකරණය	14%

ප්‍රශ්න අංක 7 (ඒකකය - ව්‍යාපාර සංවිධාන)

මෙම ප්‍රශ්නයේ නිවැරදි පිළිතුර වූ 4වන වරණය තෝරාගෙන ඇත්තේ අපේක්ෂකයින් 37.03%කි. පස්වන වරණය අපේක්ෂකයින් 21.63%ක් ද තෙවන වරණය 16.67%ක් ද තෝරාගෙන ඇත.

මෙසේ අපේක්ෂකයින් වැඩි පිරිසක් වැරදි වරණ තෝරාගැනීමට හේතුව නම් ඇපයෙන් සීමිත සමාගමකට අදාළ ලක්ෂණ හා අදාළ නොවන ලක්ෂණ වෙන්කර හඳුනාගැනීමේ හැකියාවක් අපේක්ෂකයින් තුළ නොතිබීමයි. ඒ අනුව ව්‍යාපාර සංවිධාන ඒකකයේ විෂය අභිමතාර්ථ කරා ළඟා වීමට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය අඩු දායකත්වයක් දක්වා ඇති බව පෙනේ. එබැවින් සිසුන් එම අභිමතාර්ථ කරා යොමු කළ යුතු ය.

ප්‍රශ්න අංක 9 (ඒකකය - ව්‍යවසායකත්වය)

මෙම ප්‍රශ්නයේ නිවැරදි වරණය 4වන වරණය වන අතර එය අපේක්ෂකයින් 33. 93%ක් තෝරාගෙන ඇත. එහෙත් වැරදි වරණ අතුරෙන් තෙවන වරණය 46.33%ක් වන අතර දෙවන සහ පස්වන වරණ 9.13% ක් බැගින් තෝරාගෙන ඇත. ඒ අනුව අපේක්ෂකයන්ගෙන් 66%ක් පමණ වැරදි වරණ තෝරාගෙන තිබුණි. මෙහි දී සිද්ධිය හොඳින් අධ්‍යයනය කර, එහි වැදගත් කරුණු හඳුනාගැනීමට අපොහොසත් වීම හේතුවෙන් නිවැරදි වරණය තෝරාගැනීමට නොහැකි වී ඇත.

ඒ අනුව දී ඇති සිද්ධිය හොඳින් කියවා එය ඇසුරෙන් පිළිතුර සැපයීමට අපේක්ෂකයින් පුරුදු පුහුණු කිරීමට ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ය.

ප්‍රශ්න අංක 12 (ඒකකය - මුදල් හා බැංකු)

මෙම ප්‍රශ්නයේ තුන්වන වරණය නිවැරදි වරණයවන අතර එය අපේක්ෂකයින් 23.77%ක් තෝරාගෙන ඇත. එහෙත් වැරදි වරණ අතරින් දෙවන වරණය, අපේක්ෂයින් 41.67%ක් ද පළමුවන වරණය අපේක්ෂකයින් 20.63%ක් ද තෝරාගෙන තිබුණි.

මෙහිදී අපේක්ෂකයින් තුළ වාණිජ බැංකුවල ප්‍රායෝගික භාවිතයන් පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැති බව පෙනේ. පන්ති කාමරය තුළ විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කිරීමෙන් මේ පිළිබඳ ව ශිෂ්‍යයන් දැනුවත් කළ යුතු ය.

ප්‍රශ්න අංක 18 (ඒකකය - කළමණාකරණය)

මෙම ප්‍රශ්නයේ 4වන වරණය නිවැරදි වරණය වන අතර එය අපේක්ෂකයින් 33. 97%ක් තෝරාගෙන ඇත. එහෙත් වැරදි වරණ අතරින් පස්වන වරණය අපේක්ෂකයන් 30.83%ක් ද තෙවන වරණය 21.53%ක් ද තෝරාගෙන තිබුණි.

මෙහිදී අපේක්ෂයන් තුළ විෂය ඒකකය පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැති බව පෙනේ. ඒ අනුව කළමණාකරණ සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ය.

ප්‍රශ්න අංක 19 (ඒකකය - මෙහෙයුම් කළමණාකරණය)

මෙම ප්‍රශ්නයේ පළමු වරණය නිවැරදි වරණය වන අතර එය අපේක්ෂකයින් 23. 93%ක් තෝරාගෙන ඇත. එහෙත් වැරදි වරණ අතරින් 37. 7%ක් දෙවන වරණය ද 17.9%ක් පස්වන වරණය ද තෝරාගෙන තිබුණි.

මෙහිදී අපේක්ෂකයන් තුළ මෙහෙයුම් කළමණාකරණ ඒකකයේ නිෂ්පාදන ක්‍රමයන් පිළිබඳ දී ඇති ප්‍රකාශ තුළින් නිවැරදි පිළිතුර තෝරාගැනීමට අවබෝධය නොතිබුණු බව පෙනේ. ඒ අනුව ප්‍රයෝගික භාවිතයන් තුළින් දැනුම හා අවබෝධය තහවුරු කර ගැනීමට අපේක්ෂකයන් යොමු කළ යුතු ය.

ප්‍රශ්න අංක 23 (ඒකකය - මූල්‍ය කළමණාකරණය)

මෙම ප්‍රශ්නයේ නිවැරදි වරණය දෙවන වරණය වන අතර එය අපේක්ෂකයින් 26.57%ක් තෝරාගෙන ඇත. එහෙත් වැරදි වරණ අතුරෙන් තෙවන වරණය අපේක්ෂකයින් 42.67%ක් ද හතරවන වරණය අපේක්ෂකයින් 18.7%ක් ද තෝරාගෙන තිබුණි.

මෙයට හේතුව මූල්‍ය අනුපාත ගණනය කිරීමේ දී අපේක්ෂකයින් ප්‍රශ්නය නිශ්චිතව හඳුනා ගැනීමෙන් තොරව පිළිතුරු සැපයීමයි. එම නිසා ශිෂ්‍යයින් මූල්‍ය අනුපාත වර්ග ගණනය කිරීම පිළිබඳ ව පන්ති කාමරය තුළ දී අභ්‍යාසවල නිරත කළ යුතු ය.

ප්‍රශ්න අංක 27 (ඒකකය - මානව සම්පත් කළමණාකරණය)

මෙම ප්‍රශ්නයේ නිවැරදි වරණය වූ දෙවන වරණය අපේක්ෂකයින් 14.47%ක් තෝරාගෙන ඇත. එහෙත් වැරදි වරණ අතුරෙන් පස්වන වරණය අපේක්ෂකයින් 57.83%ක් ද තුන්වන වරණය අපේක්ෂකයින් 13.6%ක් ද තෝරාගෙන තිබුණි.

මෙයට හේතුව මානව සම්පත් කළමණාකරණ කටයුතු හා සම්බන්ධ පුහුණුව හා සංවර්ධනයට අදාළ ප්‍රායෝගික භාවිතයන් පිළිබඳව අපේක්ෂකයින් තුළ පවතින දැනුම හා අවබෝධය අඩුවීම බව පෙනේ. එම නිසා මෙවැනි ගැටළුවලට පිළිතුරු සැපයීමේ දී ගැටළුව හොඳින් අධ්‍යයනය කර නිශ්චිතව පිළිතුරු සැපයීමට අපේක්ෂකයින් පුරුදු පුහුණු කළ යුතු ය.

2.1.7 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා ප්‍රශ්න, අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

- අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

31. (අ) ශ්‍රම විභජනයෙහි ප්‍රතිඵලයක් ලෙස පුද්ගල .... ඇති වන අතර අතිරික්ත නිෂ්පාදන හුවමාරුව තුළින් .... බිහි වේ.

(ආ) අයිතිකරුවන්ගේ වටිනාකම් හා විශ්වාසය මත සංවිධාන .... ගොඩනැගෙන අතර, එහි නොගැළපීම සංවිධානයට .... වේ.

පිළිතුරු

(අ) විශේෂීකරණය, වෙළෙඳාම (අනුපිළිවෙළින්)

(ආ) සංස්කෘතිය, දුර්වලතා (අනුපිළිවෙළින්)

32. (අ) තිරසාර සංවර්ධනය මූලික කරගත් ව්‍යාපාර ආයතන විසින් ලාභය මෙන්ම .... හා .... සැලකිලිමත් විය යුතු ය.

(ආ) නිෂ්පාදනයේ සිට බෙදාහැරීම දක්වා ඇති සෑම අදියරේ ම වර්ධක අගය මත අය කරන බදු .... වන අතර සේවා නියුක්තිකයෙකුගේ පාරිශ්‍රමිකය (ලාභය) මත අය කරනු බදු .... වේ.

පිළිතුරු

(අ) (පුද්ගලයින්/ සමාජය/ පරිසරය/ විශ්වය), (People , Plannet), (මානව/ ප්‍රජා/ පෘථිවිය) (ආ) එකතු කළ අගය මත බදු (VAT), උපයන විට ගෙවීම් බදු (PAYE) (අනුපිළිවෙළින්)

33. (අ) කේවල ස්වාමි ව්‍යාපාරයක හිමිකරු.. ට තනිව මුහුණ දෙන අතර ව්‍යාපාරයේ.. මත බදු ගෙවයි.

(ආ) හවුල්කරුවන්ට ව්‍යාපාරයේ වෙළඳ කටයුතුවලට සහභාගීවීමේ.. ඇති අතර ඔහු සෑම විටම .... නොවේ.

පිළිතුරු

(අ) අවධානම, ආදායම

(ආ) අයිතිවාසිකම, යුතුකම/ වගකීම

34. (අ) අවධානමක් දරමින්.. ඇති කරන පුද්ගලයා ව්‍යවසායකයකු වන අතර ඔහු සෑම විටම.. නොවේ.

(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකුවලට මුදල් .... හැකි අතර මුදල් .... කළ නොහැකි ය.

පිළිතුරු

(අ) නවෝත්පාදනය/ නව නිපැයුම්/ ව්‍යාපාරිකයකු/ කළමණාකරුවකු
(ආ) මැවීමට/ මැවීම කළ, නිකුතුව/ නිකුත් කිරීම

35. (අ) රක්ෂණ ගිවිසුමක ක්‍රියාකාරීත්වය තුළින් මතු වන බාහිර පක්ෂය.. පාර්ශ්වය වන අතර සේවයේ යෙදී සිටිය දී සේවකයින්ට සිදුවන අනතුරු සඳහා වන්දි ගෙවීමට සේව්‍ය පක්ෂය විසින් ලබා ගන්නා රක්ෂණය.. රක්ෂණය වේ.

(ආ) ප්‍රවාහන පද්ධතියට අයත් මූලිකාංග අතුරින් .... මූලිකාංගයට වරාය අයත් වන අතර දුම්රිය මාර්ගය .... මූලාකාංගයට අයත් වේ.

පිළිතුරු

(අ) තෙවන, සේවායෝජක වගකීම්/ සේව්‍ය වගකීම්
(ආ) පර්යන්තය, මාර්ග

36. (අ) අදහසක් කිසිම පණිවිඩයකට පරිවර්ථනය කිරීමේ ක්‍රියාවලිය .... නමින් හඳුන්වන අතර පණිවුඩලාභියා විසින් එම අදහස පරිවර්ථනය කරගන්නා ක්‍රියාවලිය .... වේ.

(ආ) මූල්‍ය සැලසුම්කරණය හා පාලනයේ දී.. අයවැය හා.................... .... අයවැය භාවිත වේ.

පිළිතුරු

(අ) ආකේතනය හා විකේතනය, සංකේතකරණය, විසංකේතනය
(ආ) මුදල්, ප්‍රාග්ධන, ප්‍රාග්ධන මුදල්

37. (අ) "කළමණාකරණ"යන්න ගතික ව්‍යාපාර ....තුළ ව්‍යාපාරයේ අරමුණු සඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කර ගැනීමට ආයතනයේ.. මෙහෙයවීම ලෙස හැඳින්විය හැක.

(ආ) අධිකාරිය.. මත නීත්‍යානුකූලව ලැබෙන බලයක් වන අතර විශේෂඥ බලය .... මත ලැබෙන්නෙකි.

පිළිතුරු

(අ) පරිසරය, සම්පත්
(ආ) තනතුර (නිලය), පුද්ගලයා,

38. (අ) අවමතොගමට්ටම =...................මට්ටම-(සාමාන්‍යතොගභාවිතය × සාමාන්‍ය ....)

(ආ) මුදල් ගෙවා පෞද්ගලිකව භාණ්ඩ හා සේවා ප්‍රවර්ධනය කිරීම .... වන අතර අදහස් ඇති කරගත් ගනුදෙනුකරුවන් පෙළඹවීම සඳහා කරනු ලබන කෙටි කාලීන දිරිගැන්වීම් වැඩසටහන්.. වේ.

පිළිතුරු

(අ) යළි ඇණවුම්, ඇණවුම් කාලය/ පොරොත්තු කාලය
(ආ) ප්‍රචාරණය, විකුණුම් ප්‍රවර්ධනය/ පාරිභෝගික විකුණුම් ප්‍රවර්ධනය

39. (අ) දත්ත ඒවායේ ලක්ෂණ අනුව වෙන් කර ගැනීම..වන අතර අදහස් ඇති කර ගත හැකි පරිදි එම දත්ත කෙටි කර ඉදිරිපත් කිරීම.. වේ.

(ආ) සැලසුම් සකස් කිරීමේ දී විකුණුම් ප්‍රමාණය ඇස්තමේන්තු කිරීම.. පුරෝකථනයට ඇතුළත් වන අතර යන්ත්‍ර උපකරණ අවශ්‍යතා .... සැලැස්මට අයත් වේ.

පිළිතුරු

(අ) වර්ගීකරණය, සාරාංශකරණය
(ආ) විකුණුම්, අලෙවි, මෙහෙයුම්/ නිෂ්පාදිත

40. පහත සඳහන් වගන්තිවල **සත්‍ය** හෝ **අසත්‍ය** බව සඳහන් කරන්න.

සත්‍ය/ අසත්‍ය

1. දැනට සිටින සාමාන්‍ය කොටස් හිමියන්ට මුදල් අයකර කොටස් ලබා දීම ප්‍රසාද කොටස් නිකුතුව වේ. :.........................
2. මුදල් අය කිරීමෙන් තොරව ලබා දෙන කොටස්, හිමිකම් නිකුතුව වේ. :.........................
3. සිය අයිතීන් රැකගැනීමට වෘත්තීය සමිති කළමනාකාරීත්වය සමග සාකච්ඡා කිරීම සාමූහික කේවල් කිරීම වේ. :.........................
4. සාමූහික කේවල් කිරීමේ ක්‍රියාවලියකින් පසු යම්කිසි ආරවුලක් සම්බන්ධව සේව්‍ය සේවක දෙපාර්ශ්වය අතර ඇති කරගන්නා එකඟතාවය සාමූහික ගිවිසුම වේ. :.........................

පිළිතුරු

1. අසත්‍ය
2. අසත්‍ය
3. සත්‍ය
4. සත්‍ය

● අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **නිශ්චිත පිළිතුරු** සපයන්න.

41. පහසු භාණ්ඩවල ගුණාංග හතරක් ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

1. සුලභතාව
2. අඩු මිල/ අඩු ලාභාන්තිකය
3. ප්‍රචාරණ ආකර්ශනය/ විකුණුම් ප්‍රවර්ධනයට
4. පැවැත්ම කෙටි කාලීන වීම.
5. අඩු ප්‍රමාණයන්ගෙන් මිල දී ගැනීම.
6. කෙටි කාලීන ගැණුම් තීරණ
7. නිතර නිතර මිල දී ගැනීම.
8. විකල්ප බහුලව පැවතීම.
9. පහසුවෙන් මිල දී ගත හැකි වීම.
10. පුරුද්දට මිල දී ගැනීම, පූර්ණ සැලසුම් නොමැතිව මිල දී ගනී.
11. මිල දී ගැනීමේ දී අවදානම අඩු බව.

42. ඇල්මැති පාර්ශ්වකරුවෙකු ලෙස රජය, පාසල් කෙරෙහි අවධානය යොමු කිරීමට බලපාන හේතු හතරක් ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

1. අධ්‍යාපන ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට.
2. ළමයින්ගේ අධ්‍යාපන අයිතීන් තහවරු කිරීමට.
3. පාසල් පද්ධතියේ විනය ආරක්ෂා කිරීමට.
4. සමාජ සංවර්ධනය සඳහා.
5. අධ්‍යාපන ප්‍රමිතීන් සංවර්ධනය.
6. අධ්‍යයන හා අනධ්‍යයන සේවක අයිතීන් තහවුරු කිරීමට.
7. අධ්‍යාපන පරිපාලනය සඵලදායී කිරීමට
8. සම්පත් භාවිතය කාර්යක්ෂම කිරීමට.
9. ළමයින්ගේ කායික හා මානසික සංවර්ධනය

43. පාරිභෝගිකයා සතු වගකීම් හතරක් සඳහන් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

1. විචාරාත්මක දැනුවත් භාවය.
2. සක්‍රීය සහභාගීත්වය.
3. සමාජය ගැන සැලකිලිමත් වීම.
4. පරිසරය ගැන සැලකිලිමක් වීම.
5. සහයෝගීතාව

44. විද්‍යුත් (ඉලෙක්ට්‍රොනික්) ගෙවීම් පහසු කිරීම සඳහා ඇති පහසුකම් හතරක් ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

1. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM/ CDM)
2. වෙළෙඳසැල් ගෙවීම් විද්‍යුත් පැවරුම් ජාල (EFT POS)
3. ටෙලි බැංකු පහසුකම් (Tele Banking)
4. අන්තර්ජාල බැංකු කටයුතු (Internet Banking)
5. ජංගම දුරකථන ජාල පහසුකම් (Mobile Banking)

45. චෙක්පත් ලිවීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු හතරක් ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

1. ලිවීමේ දී නොමැකෙන තීන්ත වර්ගයක් භාවිත කළ යුතු ය.
2. පිටපතෙහි අදාළ විස්තර සටහන් කළ යුතු ය.
3. ලිවීමේ දී සිදු වන වැරදි තනි ඉරකින් කපා අණකරුගේ සම්පූර්ණ අත්සන යෙදිය යුතු ය.
4. අණකරුගේ අත්සන නියාමනයෙන් යෙදිය යුතු ය.
5. චෙක්පතට යොදන දිනය හා ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් විය යුතු වීම.
6. හිස් චෙක්පතක් සඳහා අත්සනක් නොයෙදිය යුතු ය.
7. වටිනාකම ඉලක්කමෙන් හා අකුරෙන් ලිවීමේ දී වැඩි හිස්තැන් නොතබන්න.
8. ආදායකයාගේ නම නිවැරදිව යෙදිය යුතු ය.
9. එකම භාෂාවකින් ලිවිය යුතු ය.

46. ජාත්‍යන්තර වෙළෙඳාමෙහි වර්ධනයට බලපා ඇති කරුණු හතරක් ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

1. ගෝලීයකරණය
2. තාක්ෂණික හා සන්නිවේදන දියුණුව, ප්‍රවාහන දියුණුව (යටිතල පහසුකම් හා උපකාරක සේවා වර්ග)
3. වෙළෙඳ බාධක අවම වීම, නිදහසු වෙළෙඳාම
4. වෙළෙඳ ගිවිසුම් හා ජාත්‍යන්තර වෙළෙඳ සංවිධාන බිහි වීම
5. ලෝකයේ විවිධ ජාතීන් අතර දැනුම, ආකල්ප හා චර්යාවන්වල වෙනස්කම් අවම වීම.

47. පාලන ක්‍රියාවලියක් ආයතනයකට වැදගත් වන හේතු හතරක් ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

1. නිෂ්පාදිතයේ ගුණත්වය ආරක්ෂා කරගැනීමට
2. පිරිවැය අවම කර ගැනීමට, කාර්යක්ෂම කිරීමට
3. වැරදි අවම කරගැනීමට හෝ ශුන්‍ය මට්ටමකට ගෙන ඒම
4. පරිසරයේ වෙනස්වීම්වලට අනුව ගැලපීමට
5. ආයතනයේ ප්‍රගතිය නිරීක්ෂණයට සහ වැරදි නිවැරදි කිරීමට
6. ආයතනයේ කාර්ය සාධනය අපේක්ෂිත මට්ටමින් සිදුවන බව තහවුරු කර ගැනීමට
7. විචලනයන් ක්ෂණිකවම හඳුනාගෙන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වීම පහසු වීම.

48. සන්නමකින් යුතුව භාණ්ඩ වෙළෙඳපොලට ඉදිරිපත් කිරීමෙන් නිෂ්පාදකයෙකුට ලැබෙන වාසි හතරක් ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

1. අනෙකුත් තරගකාරී සන්නම්වලින් තම ආයතනයේ සන්නම වෙන් කොට ප්‍රවර්ධනය කළ හැකි වීම
2. ඇණවුම් ලබා ගැනීමේ පහසුව
3. නීතිමය ආරක්ෂාව
4. පාරිභෝගිකයන් අතර සන්නම් පක්ෂපාතීත්වයක් ඇතිකර ගත හැකි වීම.
5. හොඳ සන්නමක් මගින් ආයතනයේ සමස්ත ප්‍රතිරූපය වැඩි කර ගත හැකි වීම
6. ව්‍යාපාරයට සන්නම් වටිනාකමක් නිර්මාණය වීම
7. සන්නම පාරිභෝගික මනසෙහි ස්ථාපිත කළ හැකි වීම

49. සාමාන්‍ය කොටස් හිමියෙකු වෙත ලාභාංශවලට අමතරව සමාගමකින් ලැබෙන ප්‍රතිලාභ හතරක් ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

1. හිමිකම් නිකුතුව
2. ප්‍රාග්ධන ලාභ
3. සංචිත ප්‍රාග්ධනීකරණය, ප්‍රසාද කොටස්
4. ඡන්ද බලය හිමිවීම, අධ්‍යක්ෂකවරයෙකු වීමට ඇති හැකියාව
5. ඇප සුරැකුම් ලෙස භාවිත කළ හැකි වීම
6. කොටස් විභජනය, කොටස් විභේදනය

50. පහත සඳහන් සංකේතවලින් අදහස් කෙරෙන්නේ කුමක් ද?

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

1. මුහුණුපොත (Face book)
2. ට්විටර් (Twittter)
3. ප්‍රතිචක්‍රීකරණය (Recycling)
4. විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් සඳහා පහසුකම් ඇති බව

2.1.8 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 - 50 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ



ප්‍රස්තාරය 06

ඉහත ප්‍රස්තාරයට අනුව ප්‍රශ්න අංක 50 ඉහළ පහසුතාවක් දක්වයි. එහි පහසුතාව 85%කි. අඩුම පහසුතාවක් දක්වා ඇත්තේ 42වන ප්‍රශ්නයටයි. එහි පහසුතාව 85%කි. අඩුම පහසුතාවක් ඇත්තේ 42 ප්‍රශ්නයටයි. එහි පහසුතාව 28%කි.

2.1.9 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 - 50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබා ඇති ආකාරය

ප්‍රශ්න අංකය	ලකුණු ලබාගත් ප්‍රතිශතය					
	ලකුණු 0	ලකුණු 0.5	ලකුණු 1	ලකුණු 1.5	ලකුණු 2	ප්‍රතිචාර නොදැක්වූ
31	6.73%	15.07%	24.93%	28.23%	23.80%	1.23%
32	30.23%	27.70%	24.67%	13.93%	1.33%	2.13%
33	20.13%	19.90%	29.97%	23.43%	4.80%	1.77%
34	13.80%	26.03%	29.73%	18.63%	10.30%	1.50%
35	9.93%	11.50%	15.70%	46.63%	14.40%	1.83%
36	38.27%	8.07%	29.83%	8.17%	11.97%	3.70%
37	23.27%	22.63%	25.20%	22.47%	3.10%	3.33%
38	24.60%	23.57%	21.37%	17.17%	9.63%	3.67%
39	28.40%	25.50%	20.97%	13.30%	8.47%	3.37%
40	2.30%	7.97%	23.10%	24.57%	41.20%	0.87%
41	9.97%	12.93%	25.33%	29.33%	20.57%	1.87%
42	28.93%	33.87%	22.97%	8.87%	2.83%	2.53%
43	42.87%	11.60%	9.67%	10.87%	22.40%	2.60%
44	25.77%	27.50%	23.37%	12.80%	8.13%	2.43%
45	17.97%	21.83%	22.73%	20.87%	15.47%	1.13%
46	18.57%	24.63%	32.43%	17.17%	4.97%	2.23%
47	27.27%	27.47%	23.90%	12.30%	6.20%	2.87%
48	11.50%	25.83%	32.43%	18.80%	10.07%	1.37%
49	29.20%	26.93%	21.30%	12.67%	6.90%	3.00%
50	1.03%	3.23%	10.30%	26.30%	58.57%	0.57%

වගුව **07**

* I පත්‍රයේ ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා ප්‍රශ්නවලට ලකුණු ලබාගත් ප්‍රතිශතය ලකුණු 0, ලකුණු 0.5, ලකුණු 01, ලකුණු 1.5 හා ලකුණු 02 තීරුවලින් දැක්වේ.

* ''ප්‍රතිචාර නොදැක්වූ'' යනුවෙන් දක්වා ඇත්තේ ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා නොමැති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතයයි.

උදා :-අපේක්ෂකයන්ගෙන් 59%ක් ප්‍රශ්න අංක 50 සඳහා ප්‍රශ්නයට හිමි සම්පූර්ණ ලකුණු ලබාගෙන ඇති අතර, අඅපේක්ෂකයන්ගෙන් ප්‍රශ්න අංක 32ට හිමි සම්පූර්ණ ලකුණු ලබාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 1.3%ක් වැනි අඩු ප්‍රතිශතයකි.

2.1.10 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 - 50 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිගමන හා යෝජනා

31-50 දක්වා පිළිතුරු සැපයීමේ ප්‍රශ්න සැළකූ විට ප්‍රශ්න අංක 32,36,37,39,42,43,44,47, සහ 49 යන ප්‍රශ්නවල පහසුතාව 40% වඩා අඩු ය.

පාඩම් ඒකක	ප්‍රශ්න අංක	පහසුතාව
රජය සහ ව්‍යාපාර	32	31%
සන්නිවේදනය	36	35%
කළමනාකරණය	37	38%
මෙහෙයුම් හා අලෙවි කළමනාකරණය	38	39%
තොරතුරු පද්ධති ව්‍යාපාර සැලැස්ම	39	35%
ව්‍යාපාර පදනම	42	29%
රජය සහ ව්‍යාපාර	43	39%
මුදල් හා බැංකු	44	36%
කළමනාකරණය	47	34%
තොරතුරු සංවිධානය	49	34%

ප්‍රශ්න අංක 32 (රජය හා ව්‍යාපාර)

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන්ගෙන් 30%ක් කිසිදු ලකුණක් ලබා ගෙන නොතිබුණි. සම්පූර්ණ ලකුණු ලබා ගෙන ඇත්තේ 1%ක් පමණි. මෙයට හේතුව වන්නේ ව්‍යාපාර නව ප්‍රවනණතා පිළිබඳව නිවැරදි දැනුමක් අපේක්‍ෂකයන් තුළ නොතිබීමයි. මෙම කරුණු පිළිබඳව විශේෂ අවධනායක් යොමු කරමින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතු ය.

ප්‍රශ්න අංක 36 (සන්නිවේදනය)

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන්ගෙන් 38%ක් කිසිදු ලකුණක් ලබා ගෙන නොතිබුණි. සම්පූර්ණ ලකුණු ලබා ගෙන ඇත්තේ 12%ක් පමණි. මෙයට හේතුවක් වන්නේ අපේක්ෂකයන් තුළ සන්නිවේදන ක්‍රියාවලිය පිළිබඳ මනා දැනුමක් හා අවබෝධයක් නොතිබීමයි. ඒ නිසා සන්නිවේදන ක්‍රියාවලිය න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව අවබෝධ කර දීමට සුදුසු අභ්‍යාසවල අපේක්ෂකයන් නිරත කරවිය යුතුය.

ප්‍රශ්න අංක 37 (කළමනාකරණය)

මෙම ප්‍රශ්ණයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයින්ගෙන් 23%ක් කිසිදු ලකුණක් ලබා ගෙන නොතිබුණි. සම්පූර්ණ ලකුණු ලබා ගෙන ඇත්තේ 3% ක් පමණි. අඩු සාධන මට්ටමක් ලැබීමට හේතුව වනුයේ කළමනාකරණ සංකල්ප පිළිබඳ අපේක්‍ෂකයන් තුළ ඇති දැනුම පහළ මට්ටමක පැවතීමයි. එහෙයින් කළමනාකරණය පිළිබඳව පුළුල් අවබෝධයක් අපේක්‍ෂකයන්ට ලබා දීමට සැලසුම් කළ යුතු යි.

ප්‍රශ්න අංක 38 (මෙහෙයුම් කළමණාකරණය)

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන්ගෙන් 25%ක් කිසිදු ලකුණක් ලබා ගෙන නොතිබුණි. සම්පූර්ණ ලකුණු ලබා ගෙන ඇත්තේ 10%ක් පමණි. මෙසේ අඩු පහසුතාවක් ලබා ගැනීමට හේතුව වන්නේ තොග මට්ටම් ගණනය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු සාධක පිළිබඳ ව අපේක්ෂකයන් තුළ අවබෝධයක් නොමැති වීමයි. එහෙයින් පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මේ පිළිබඳ අභ්‍යාසවල අපේක්ෂකයන් නිරත කරවීමෙන් ප්‍රායෝගික දැනුම ලබා දිය යුතුය.

ප්‍රශ්න අංක 39 (තොරතුරු පද්ධති හා ව්‍යාපාර සැලසුම්)

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන්ගෙන් 28%ක් කිසිදු ලකුණක් ලබා ගෙන නොතිබුණි. සම්පූර්ණ ලකුණු ලබා ගෙන ඇත්තේ 8%ක් පමණි. තොරතුරු පද්ධති හා ව්‍යාපාර සැලැස්ම පිළිබඳ න්‍යායාත්මක දැනුම අඩුබව පහසුතාව අඩුවීමට හේතු වී ඇත. විෂය කරුණු මනාව තහවුරු කරගත හැකි වන සේ අපේක්ෂකයින් අභ්‍යාසවල නිරත කරවිය යුතු ය.

ප්‍රශ්න අංක 42 (ව්‍යාපාර පදනම)

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන්ගෙන් 29%ක් කිසිදු ලකුණක් ලබා ගෙන නොතිබුණි. සම්පූර්ණ ලකුණු ලබා ගෙන ඇත්තේ 3%ක් පමණි. මෙසේ අඩු පහසුතාවට හේතු වන්නේ න්‍යායාත්මක ඉගෙනගත් කරුණු තුළින් ප්‍රායෝගිකව යොදා ගැනීමට අපේක්ෂකයන් අපොහොසත් වීමයි. විෂය කරුණු පිළිබඳ න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව යොදා ගැනීමට අපේක්ෂයින් හුරු කළ යුතු ය.

ප්‍රශ්න අංක 43 (රජය හා ව්‍යාපාර)

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන්ගෙන් 43%ක් කිසිදු ලකුණක් ලබා ගෙන නොතිබුණි. සම්පූර්ණ ලකුණු ලබා ගෙන ඇත්තේ 22%ක් පමණි. මෙයට හේතුව වන්නේ විෂය කරුණු පිළිබඳ මනා දැනුමක් නොතිබීමයි. විෂය කරුණු න්‍යායාත්මකව තහවුරු වන සේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැකසිය යුතු වේ.

ප්‍රශ්න අංක 44 (මුදල් හා බැංකු)

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන්ගෙන් 26%ක් කිසිදු ලකුණක් ලබා ගෙන නොතිබුණි. සම්පූර්ණ ලකුණු ලබා ගෙන ඇත්තේ 8%ක් පමණි. මෙසේ අඩු පහසුතාවයට හේතුව නූතන විද්‍යුත් ගෙවීම් ක්‍රම හා එහි පහසුකම් පිළිබඳ අපේක්ෂකයන් තුළ ප්‍රායෝගික දැනුමක් නොතිබීමයි. නව විද්‍යුත් ක්‍රම හා ඉන් ලැබෙන පහසුකම් පිළිබඳ ප්‍රායෝගික දැනුම ලැබෙන පරිදි ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කළ යුතුය.

ප්‍රශ්න අංක 47 (කළමනාකරණය)

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන්ගෙන් 27%ක් කිසිදු ලකුණක් ලබා ගෙන නොතිබුණි. සම්පූර්ණ ලකුණු ලබා ගෙන ඇත්තේ 6%ක් පමණි. මෙයට හේතුව වන්නේ පාලන ක්‍රියාවලියක් ආයතනයට වැදගත් වන හේතු පිළිබඳ අපේක්ෂකයන් තුළ මනා දැනුමක් නොතිබීමයි. පන්ති කාමරය තුළ පාලන ක්‍රියාවලිය සම්බන්ධ න්‍යායාත්මක දැනුම තහවුරු වන සේ අභ්‍යාස කරවිය යුතු වේ.

ප්‍රශ්න අංක 49 (ව්‍යාපාර සංවිධාන)

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන්ගෙන් 29%ක් කිසිදු ලකුණක් ලබා ගෙන නොතිබුණි. සම්පූර්ණ ලකුණු ලබා ගෙන ඇත්තේ 7%ක් පමණි. මෙම අඩු පහසුතාවයට හේතුව සාමාන්‍ය කොටස් හිමියෙකු වෙත ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ න්‍යායාත්මක දැනුම අපේක්ෂකයන්ට නොතිබීමයි. මෙහිදී අපේක්ෂකයන්ගේ න්‍යායාත්මක දැනුම තහවුරු වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැකසිය යුතුය.

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03 කි. මුළු ලකුණු 100 කි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තය.

I කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 4 කි.

II කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 4 කි.

* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සැපයිය යුතුය.

* එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් මුළු ලකුණු 100කි.

* ප්‍රශ්න පත්‍ර දෙක සඳහා අවසාන ලකුණු ගණනය කිරීම

I පත්‍රය සඳහා ලකුණු	=	100
II පත්‍රය සඳහා ලකුණු	=	100
අවසාන ලකුණු	=	200 / 2
	=	100

2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

II පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර 2, 3, 4.1 හා 4.2 ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමඟ දක්වා ඇත.

II පත්‍රය

I කොටස

1 ප්‍රශ්නය

1. (i) (අ) අවශ්‍යතා, වුවමනා සහ නිෂ්පාදිත යන පද නිර්වචනය කර, ඒවා අතර පවතින සම්බන්ධතාව පැහැදිලි කරන්න.

අවශ්‍යතාවය - මිනිසාට ජීවත් වීම සඳහා පැවතිය යුතු මූලික ඇ

වුවමනා - අවශ්‍යතා තෘප්තිමත් කර ගැනීමට කිසියම් පුද්ගලයකු යම්කිසි නිෂ්පාදිතයකට දක්වන විශේෂ කැමැත්ත / පුද්ගලයෙකු සිය අවශ්‍යතාවය තෘප්තිමත් කර ගන්නා ආකාරය

නිෂ්පාදිත - අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීමට වෙළෙඳපොලට කෙරෙන ඕනෑම දෙයකි.

(½ × 3 = ලකුණු 01 ½ යි)

අවශ්‍යතා තෘප්තිමත් කර ගැනීමට පුද්ගලයින් පදනම් කර ගන්නා විවිධ ක්‍රම වුවමනා වන අතර ඒ සඳහා ඇති විසඳුම් නිෂ්පාදිත වේ.

අවශ්‍යතා (පදනම) ⟶ වුවමනා (ක්‍රමය) ⟶ නිෂ්පාදිතය (විසඳුම)

(ලකුණු ½ යි)

(ආ) නිෂ්පාදන ක්‍රමය ඍජු නිෂ්පාදනයේ සිට වක්‍ර නිෂ්පාදනය දක්වා මාරු වීමට බලපෑ ප්‍රධාන හේතු හතරක් දක්වන්න.

(1) පුද්ගල විශේෂීකරණය
(2) අතිරික්ත නිෂ්පාදනය
(3) භාණ්ඩ හුවමාරුව
(4) වෙළෙඳාම **(½ × 4 = ලකුණු 02යි)**

(ii) (අ) නව පරපුර කෘෂිකර්මාන්තයේ නියුක්ත වීමට අකමැත්තක් දක්වනු ලැබේ. මෙසේ වීමට බලපා ඇති හේතු **හතරක්** දක්වන්න.

(1) අස්වැන්නේ ආදායමේ ඇති අවිනිශ්චිතතාව
(2) වෘත්තිමය වශයෙන් යහපත් ප්‍රතිරූපයක් ඇති නොවීම.
(3) සමාජ පිළිගැනීමක් ඇති නොවීම.
(4) ප්‍රාග්ධන ගැටළු පැන නැගීම.
(5) හොඳ වෙළෙඳපොලක් නොමැති වීම.
(6) කෘෂි කර්මාන්තය සඳහා අවශ්‍ය කුසලතා නොමැති වීම.

(7) අධ්‍යාපන ක්‍රමයෙන් කෘෂි කර්මාන්තය පිළිබඳව දැනුම හා ආකල්ප හා කුසලතා අවශ්‍ය පරිදි නොලැබීම.
(8) පුද්ගල ආකල්ප
(9) රාජ්‍ය අනුග්‍රහය හා යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම.
(10) සේවා අංශයේ හා වෙනත් රැකියා අවස්ථා බහුල වීම.
(11) කෙටි කාලීන ලාභ අපේක්ෂාව.

(½ × 4 = ලකුණු 02යි)

(ආ) සාර්ව පරිසරයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ **දෙකක්** ලියන්න.

(1) වේගයෙන් වෙනස් වන බව
(2) ගතික බව/ අවිනිශ්චිත බව
(3) විවිධාකාරයේ බලපෑම් ඇති කරන බව
(4) සංකීර්ණ බව
(5) තරගකාරී බව
(6) ගෝලීය බව
(7) අන්තර් සම්බන්ධතාවයක් පවතින බව
(8) පාලනය කළ නොහැකි බව **(1 × 2 = ලකුණු 02යි)**

(iii) ගෝලීයකරණය යනු කුමක් දැයි අර්ථකතනය කර, එය දේශීය ව්‍යාපාර කෙරෙහි ඇති කරන ධනාත්මක හා සෘණාත්මක බලපෑම් **දෙක** බැගින් විස්තර කරන්න.

ආර්ථික, දේශපාලනමය , සමාජ හා සංස්කෘතිමය වශයෙන් රටවල් අතර ඇති අන්තර් සම්බන්ධතාවය/ පුද්ගලයන්, රාජ්‍යයන් හා සංවිධාන ජාත්‍යන්තර වශයෙන් ගොඩනගන සම්බන්ධතාව

* රටවල් අතර ප්‍රාග්ධනය, භාණ්ඩ, සේවා, තාක්ෂණය නිදහසේ හුවමාරු වීම/ සංචලනය වීම/ ගලා යාම.

* දේශ සීමාවලින් සම්බාධක තොරව ලෝකයේ පොදු වෙළෙඳපොලක් වීම.

ධනාත්මක බලපෑම් **(ලකුණු 02යි)**

(1) පුළුල් වෙළෙඳපොලක් නිර්මාණය වීම.
(2) නව තාක්‍ෂණය ගලා ඒම.
(3) නව දැනුම හුවමාරු වීම.
(4) ආර්ථික පිරිමැසුම් ලබා ගත හැකි වීම.
(5) යටිතල පහසුකම් සහ ව්‍යාපාරික සේවා දියුණු වීම.
(6) රැකියා අවස්ථා බිහි වීම.
(7) ගුණාත්මක යෙදවුම් ලබා ගැනීමට හැකි වීම.
(8) ආයෝජන අවස්ථා වැඩි වීම.

සෘණාත්මක බලපෑම්

(1) ගෝලීය තරගයට මුහුණ දිය යුතු වීම/ දේශීය කර්මාන්ත අඩපණ වීම
(2) බුද්ධි ගලනය නිසා පුහුණු ශ්‍රම හිඟය
(3) අලෙවිකරණ පිරිවැය ඉහළ යාම
(4) ජීවන රටාව හා සංස්කෘතික වටිනාකම් වෙනස් වීම නිසා සාම්ප්‍රදායික කර්මාන්ත අඩපණවීම

(½ × 2 = ලකුණු 01යි)

(iv) (අ) 'සංවිධාන සංස්කෘතිය' යන්න අර්ථකතනය කරන්න.

සංවිධානයක් තුළ පොදු හැසිරීම් රටාවක් ඇති කර ගැනීම සඳහා ස්ථාපිත කරගත් පොදුවේ පිළිගැනීමට ලක් වූ විශ්වාස, ආකල්ප, ප්‍රතිමාන, වටිනාකම් හා සාරධර්ම මාලාවකි.

(මෙම අදහස ඇතුළත් පිළිතුරකට ලකුණු 02යි)

(ආ) සංවිධාන සංස්කෘතිය තුළ ඇති ශක්තියක් හා දුර්වලතාවයක් එක් උදාහරණය බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

ශක්තීන් - උදාහරණ

(1) පොදු ධනාත්මක චර්යා පද්ධතියක් පැවතීම
උදා : ආයතනය තුළ පොදු හැසිරීම් රටාවක් ඇති වීම

(2) විශ්වාසය පදනම් කරගත් සම්බන්ධතා ඇති වීම
උදා : පක්ෂපාතී සේවකයන් ගැටුම් ඇති නොවීම

(3) සහයෝගීතාවය
උදා : කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම

(4) අන්‍යොන්‍යතාවයට අන් අයට ගරු කිරීම
උදා : ඇගයීම හා එකිනෙකාට ගරු කිරීම

(5) වෙනත් පිළිගත හැකි

(ශක්තියකට ලකුණු ½යි)
(උදාහරණයකට ලකුණු ½යි)
(ලකුණු 01යි)

දුර්වලතා - උදාහරණ

(1) සංස්කෘතික බැඳියාව
උදා : වෙනස් වීමට ඇති අකමැත්ත/ කොටු වූ මානසිකත්වය

(2) අසමානව සැලකීම
උදා : ධූරාවලි මානසිකත්වයක් පැවතීම සහ පක්ෂග්‍රාහීව සැලකීම

(3) විශ්වාසය, වටිනාකම්, සාරධර්මවල අපැහැදිලි බව/ නොපිළිගැනීම
උදා : පිළිනොගැනීම උප සංස්කෘතීන් බිහි වීම හා සේවකයින් අතර ගැටුම් ඇති වීම

(දුර්වලතාවයකට ලකුණු ½යි)
(උදාහරණයකට ලකුණු ½යි)
(ලකුණු 01යි)

(v) ව්‍යාපාර සමාජ වගකීම් යනු කුමක් දැයි පැහැදිලි කර, වර්තමාන සමාජය තුළ එය වැදගත් වීමට හේතු **තුනක්** ලියන්න.

ආර්ථික, සමාජීය හා පරිසරය සමඟ ව්‍යාපාරයේ ඇති බැඳීමයි. ව්‍යාපාරයක් සිය පාරිභෝගිකයන්ට පමණක් නොව සියළුම පාර්ශවයන්ට සාධාරණයක් වන අයුරින් කටයුතු කිරීමට ඇති බැඳීමයි.

(ඉහත අදහස ඇතුළත් අර්ථකථනයට ලකුණු 01යි)

වැදගත් වීමට හේතු

(1) පරිසර දූෂණය ඉහළ යාම නිසා පරිසරය ආරක්ෂා කිරීම අවශ්‍ය වීම
(2) වංචා, දූෂණ අවම කිරීමට හා වැළැක්වීමට
(3) දිළිඳුබව හා කුසගින්න අවම කර සමාජ සාධාරණත්වය ඇති කිරීම
(4) සමාජය තුළ ආචාරධර්ම පිරිහීම නිසා ආචාර ධර්ම ප්‍රවර්ධනයට
(5) ලෝකයේ සම්පත් හිඟවීම නිසා කාර්යක්ෂම ලෙස සම්පත් භාවිතයට

(01 × 3 = ලකුණු 01යි)

1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



II ප්‍රශ්න පත්‍රයෙහි I කොටසින් වැඩිම සිසුන් පිරිසක් තෝරාගත් ප්‍රශ්නය මෙයයි. එක ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 96%කි. (ප්‍රස්තාරය 2) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 16%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 38%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 40%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 6%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 46%කි.



මෙම ප්‍රශ්නයට අයත් කොටස් සහ අනුකොටස් අතරින් පහසුතාව වැඩිම අනුකොටස (I) (අ) වන අතර එහි පහසුතාව 86%කි.

එසේම පහසුතාව අඩුම අනුකොටස වන්නේ (v) වන අතර එහි පහසුතාව 22%කි. සෙසු ප්‍රශ්න අනු කොටස්වල පහසුතාව පිළිබඳව මෙම ප්‍රස්තාරයෙන් පැහැදිලි වේ.

පළමුවන ප්‍රශ්නයේ (i) (ආ) අනුකොටසෙහි පහසුතාව 42%කි. මෙසේ පහසුතාව පහළ යාමට හේතුව වන්නේ අපේක්ෂකයින් ප්‍රශ්නය නිවැරදිව තේරුම්ගෙන නොතිබීමයි. නිෂ්පාදන ක්‍රමය, ඍජු නිෂ්පාදනයේ සිට වක්‍ර නිෂ්පාදනය දක්වා මාරු වීමට බලපෑ ප්‍රධාන හේතුන් පිළිබඳව පිළිතුරු සැපයීමට අපේක්ෂකයින් අපොහොසත් වී ඇත. එමනිසා ව්‍යාපාර විකාශනයේ පියවරයන්හි අන්තර්ගත සංකල්ප අනාවරණය වන පරිදි සිසුන්ට පන්ති කාමරය තුළ දී ලිඛිත පැවරුම් භාවිත කිරීම සුදුසු වේ.

පළමුවන ප්‍රශ්නයේ (iv) (ආ) අනුකොටසෙහි පහසුතාව 37%කි. මෙම පහසුතාව පහළ යාමට හේතුව වන්නේ අපේක්ෂකයින් ප්‍රශ්නය නිවැරදිව තේරුම්ගෙන නොතිබීමයි. එනම්, සංවිධාන සංස්කෘතිය යන සංකල්පය පිළිබඳ දැනුමක් අපේක්ෂකයන් තුළ තිබුණ ද සංවිධාන සංස්කෘතියක ඇති ලක්ෂණ හා එහි ශක්තීන් හා දුර්වලතා උදාහරණයක් මඟින් පෙන්වා දීමට අපේක්ෂකයින් අපොහොසත් වී ඇත. එබැවින් ව්‍යාපාර අභ්‍යන්තර පරිසරයේ සාධකයක් වන සංවිධාන සංස්කෘතිය එමගින් ඇති කරන බලපෑම පිළිබඳව නිදසුන් මගින් අවබෝධය ලබා දිය යුතු ය.

පළමුවන ප්‍රශ්නයේ (v) අනු කොටසට පිළිතුරු සැපයීමේ දී සමාජ වගකීම් යන්න අර්ථ දැක්වීමට අපේක්ෂකයින්ගෙන් 66%ක් සමත් වී ඇත. එහෙත් ව්‍යාපාර සමාජ වගකීම් වර්තමාන සමාජය තුළ වැදගත් වීමට හේතු දැක්වීමට සමත් වී ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 22%කි. එම නිසා ව්‍යාපාර සමාජ වගකීම් වර්තමාන සමාජයට වැදගත් වන ආකාරය තහවුරු වන සේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ය.

2 ප්‍රශ්නය

(i) ආහාර ද්‍රව්‍ය නිෂ්පාදකයෙකු සිය නිෂ්පාදන වල ගුණාත්වය තහවුරු කිරීම සඳහා ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේ දී, ඔහු විසින් සැලකිල්ලට ගත යුතු සාධක හතරක් සඳහන් කර, එම සාධක සැලකිල්ලට ගත යුත්තේ ඇයි දැයි පැහැදිලි කරන්න.

	සාධක	හේතු
1	ප්‍රතිපෝෂකයන් - (ගනුදෙනුකරු) (සංස්කෘතික සාධක)	ගැනුම් චර්යාව හා මිලදී ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු සම්බන්ධ ආචාරධර්ම ගොඩ නැගීම/ චර්යාව
2	අමුද්‍රව්‍ය හා අනෙකුත් යෙදවුම් (සැපයුම්කරු)	අමුද්‍රව්‍යවල ගුණාත්වය තහවුරු කර ගැනීමට අවශ්‍ය ආචාර ධර්ම ගොඩ නැගීමට
3	නිෂ්පාදන ක්‍රියාවලිය (සේවකයින් / කළමනාකරුවන් මෙහෙයුම් ක්‍රියාවලිය පිළිබඳ සොයා බැලීම.	සේවක චර්යාව හා සේවක විනය මෙන්ම සේවක දායකත්වය (ගුණාත්වය ඉහළ නැංවීමට අදාළව) සම්බන්ධ ආචාර ධර්ම ගොඩ නැගීමට
4	ලාභයට වඩා සමාජ වගකීම (අයිතිකරුවන්)	ගුණාත්වය හා ලාභය පිළිබඳ සමබරතාවය ගොඩ නැගීමට සම්බන්ධ ආචාර ධර්ම ගොඩ නැගීමට
5	ආචාර ධර්ම සුරැකීම (තරගකරුවන්)	තරගකාරීත්ව ප්‍රතිචාර හා උපාය මාර්ග සම්බන්ධ ආචාර ධර්ම ගොඩ නැගීමට
6	කළමනාකරුවන්	අධීක්ෂණය සම්බන්ධව
7	සංස්කෘතිය	ආගම්/ ජාතීන් අනුව

(සාධක හතරට ලකුණු ½ × 4 = ලකුණු 02යි)
(විස්තර කිරීමට ලකුණු ½ × 4 = ලකුණු 02යි)

(ii) කෘෂි නිෂ්පාදන සඳහා පනවනු ලබන ආනයන බදු තුළින් බලපෑම් ඇති වන පාර්ශ්ව හතරක් නම් කර, එමගින් එක් එක් පාර්ශ්වයට ලැබෙන වාසි එක බැගින් ලියන්න.

1. දේශීය කෘෂි නිෂ්පාදකයා
   - තම වෙළෙඳපොල ආරක්ෂා වේ.
   - ජාත්‍යන්තර තරගය අඩු වේ.
   - ඉහළ මිළක් ලැබේ.

2. දේශීය කෘෂි පාරිභෝගිකයා
   - නැවුම් භාණ්ඩ පරිභෝජනයට අවස්ථාව ලැබීම

3. දේශීය කෘෂි නිෂ්පාදන බෙදා හරින්නන්/ ව්‍යාපාරිකයන්
   - විකුණුම් වැඩි වී ලාභය ඉහළ යාම

4. රජය

- බදු ආදායම ඉහළ යාම.
- ආනයන අඩු වීම නිසා ගෙවුම් ශේෂ හිඟය අවම වීම.
- විදේශ විනිමය ඉතිරි වීම.
- දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම.

5. සමාජය

- දේශීය කර්මාන්ත දියුණු වීම.
- රැකියා අවස්ථා හා නව ආදායම් මාර්ග වර්ධනය.

6. විභව කෘෂි ආයෝජකයන්

- ආයෝජනය කිරීමට පෙළඹීම.

(පාර්ශව නම් කිරීමට ½ × 4 = ලකුණු 02යි)
(වාසි නම් කිරීමට ½ × 4 = ලකුණු 02යි)

(iii) ව්‍යාපාර සාර්ථකව කරගෙන යාමට රජයක් විසින් විවිධාකාරයෙන් මැදිහත් වීම් සිදු කරනු ලැබේ.එසේ මැදිහත්වීමේ ක්‍රම හතරක් දක්වා, එම එක් එක් ක්‍රමය තුළින් අපේක්ෂා කරන්නේ කුමක් දැයි විස්තර කරන්න.

	ක්‍රම	අපේක්ෂාවන්
1	යටිතල පහසුකම් සැපයීම	ආයෝජන ප්‍රවර්ධන කිරීම.
2	ඒකාධිකාරීත්වය පාලනය කිරීම	තරගකාරී මිලට පාරිභෝගිකයාට වඩා හොඳ සේවාවක් ලබා දීම.
3	ප්‍රතිපත්ති සම්පාදනය කිරීම. (නියාමනය)	විධිමත්ව හා ක්‍රමවත්ව ව්‍යාපාර කටයුතු කරගෙන යාම.
4	නීති රීති පැනවීම.	නාස්තිය හා දූෂණය අඩුකර අවශ්‍ය පහසුකම් තහවුරු කිරීමට
5	දිරිගැන්වීම් ලබා දීම.	නව ව්‍යාපාර අද්දවා ගැනීම හා දැනට සිටින ව්‍යාපාර රඳවා ගැනීමට
6	බදු සහන ලබා දීම.	ආයෝජන ධෛර්යමත් කිරීම
7	ගනුදෙනුකරුවකු වීම	නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාමට සහ තිරසාර සංවර්ධනයට සහාය වීම.

(සාධක හතරට ලකුණු ½ × 4 = ලකුණු 02යි)
(විස්තර කිරීමට ලකුණු ½ × 4 = ලකුණු 02යි)

(iv)(අ) හවුල්කරුවන් අතර ආරවුල් හටගැනීමට බලපානු ලබන කරුණු හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න.

- පහත සඳහන් අවස්ථාවන්හි දී ඇතිවන ගැටළු

(1) කළමනාකරණ තීරණ ගැනීමේ දී
(2) ව්‍යාපාර කටයුතු සඳහා සහභාගී වීමේ දී
(3) ලාභ/ අලාභ බෙදා ගැනීමේ දී
(4) ණය ප්‍රාග්ධනය සඳහා පොළී ලබා ගැනීමේ දී
(5) යෙදූ ප්‍රාග්ධනයට පොළී ලබා ගැනීමේ දී
(6) හවුල් ව්‍යාපාරයේ දේපළ පරිහරණයේ දී
(7) වරප්‍රසාද භුක්ති විඳීමේ දී/ ගැනිලි සම්බන්ධව
(8) හවුල් ව්‍යාපාරයේ අයිතිය වෙනස් වීමේ දී
(9) හවුල විසුරුවා හැරීමේ දී **(½ × 4 = ලකුණු 02යි)**

(ආ) ජනතාවට අවශ්‍ය නිෂ්පාදිත රාජ්‍ය ආයතන තුළින් ලබා දීමට රජය විසින් කටයුතු කරනු ලැබේ. එවැනි රාජ්‍ය ආයතන වර්ග හතරක් නම් කරන්න.

(1) රාජ්‍ය සංස්ථා/ අධිකාරි/ මණ්ඩල/ කොමිෂන් සභා
(2) රාජ්‍ය දෙපාර්තමේන්තු
(3) රාජ්‍ය සමාගම්
(4) ප්‍රාදේශීය අධිකාරිය යටතේ පවතින ව්‍යාපාර/ පළාත් සභා/ ප්‍රාදේශීය සභා/ නගර සභා

(½ × 4 = ලකුණු 02යි)

(v) වරලත්හිමියාට මෙන් ම වරලත්ලාභියාට ද ඉටු කළ යුතු කාර්ය සමූහයක් පවතී. වරලත්ලාභියකු විසින් ඉටු කළ යුතු කාර්ය හතරක් කෙටියෙන් විස්තර කරන්න.

(1) වරලත්හිමියා පනවනු ලබන කොන්දේසි අනුව කටයුතු කිරීම.
(2) ප්‍රාග්ධනය ආයෝජනය කිරීම.
(3) වරලත්හිමියාගෙන් හෝ ඔහු විසින් නිර්දේශ කරන ලද සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ මිලදී ගැනීම.
(4) වරලත්හිමියාට ගිවිසගත් පරිදි පුරස්කාරය ගෙවීම.බ

(½ × 4 = ලකුණු 02යි)

2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



2 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 59%කි. (ප්‍රස්තාරය 2) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 14%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 42%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 37%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 07%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 44%කි.



මෙම ප්‍රශ්නයට අයත් කොටස් හා අනුකොටස් අතරින් පහසුතාව වැඩිම කොටස ii අනුකොටසවන අතර එහි පහසුතාව 75%කි.

එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (i) වන අනු කොටස වන අතර එහි පහසුතාව 27%කි. සෙසු ප්‍රශ්න අනු කොටස්වල පහසුතාවය පිළිබඳ මෙම ප්‍රස්තාරයෙන් පැහැදිලි වේ.

දෙවන ප්‍රශ්නයෙහි (i) අනුකොටසෙහි නිෂ්පාදකයෙකු සිය නිෂ්පාදිතවල ගුණත්වය තහවුරු කිරීම සඳහා ආචාර ධර්ම සකස් කිරීමේ දී සැලකිය යුතු සාධක නම් කිරීමට අපේක්ෂකයන්ගෙන් 41%ක් සමත් වී තිබුන ද, එම සාධක සැලකිල්ලට ගතයුත්තේ ඇයි දැයි පැහැදිලි කිරීමට හැකියාව ලැබී තිබුණේ අපේක්ෂකයන්ගෙන් 27%කට පමණි.

දෙවන ප්‍රශ්නයෙහි (iv) අනුකොටසෙහි පහසුතාව 31%කි. එසේ පහසුතාව පහළ යාමට හේතුව වන්නේ ව්‍යාපාර සංවිධාන වර්ගීකරණයේ දී රාජ්‍ය අංශයට අයත් ව්‍යාපාර හා එමගින් ඉටුකරනු ලබන කාර්යන් පිළිබඳ අපේක්ෂකයින්ට පැහැදිලි දැනුමක් නොතිබීමයි. මෙහි දී සිසුන්ට පන්තිකාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමට හා ඊට අදාළ උදාහරණය වෙන් කර අවබෝධ කර දීමට අවකාශ ලබා දිය යුතු ය.

දෙවන ප්‍රශ්නයෙහි (v) කොටසෙහි පහසුතාව 37%කි. එසේ පහසුතාව පහළ යාමට හේතුව වරලත් ව්‍යාපාර පිළිබඳ පැහැදිලි දැනුමක් නොතිබීම නිසා වරලත් ලාභියෙකු විසින් ඉටු කළ යුතු කාර්යයන් විස්තර කිරීමට නොහැකි වීමයි. වරලත් හිමියා සහ වරලත් ලාභියාගේ කාර්යයන් වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමට සිසුන්ට හැකියාව ලැබෙන පරිදි ක්‍රියාකාරකම්වල යෙදවිය යුතු ය

3 ප්‍රශ්නය

(i) රැකියාවක් කිරීමට වඩා තමාගේ ම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ඔබගේ මිතුරෙකුට කැමැත්තක් පවතින නමුත් ඔහු තුළ ඒ සඳහා බියක් ද පවතී. රැකියාවක් කිරීමට වඩා ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ වාසි ඔහුට පැහැදිලි කිරීමට කරුණු හතරක් සඳහන් කරන්න.

(1) තම හැකියා හා දක්ෂතා වලින් ප්‍රයෝජන ගත හැකි වීම.
(2) ස්වාධීනව හා තම අභිමතය පරිදි කටයුතු කළ හැකි වීම.
(3) තම කැපවීම හා උනන්දුව මත ඉහළ ප්‍රතිලාභ ලබා ගත හැකි වීම.
(4) රැකියාවකින් යැපෙන්නෙකු නොව රැකියා ජනිත කරන්නෙකු විය හැකි වීම.
(5) සමාජ තත්වය හා ඉහළ පිළිගැනීමක් ඇති වීම.
(6) තමන්ගේ ප්‍රධානියා තමන් ම වීම.
(7) ආත්ම තෘප්තියක් ලබාගත හැකි වීම.
(8) රැකියාවකින් ලබන වැටුප නිශ්චිතව වුවත් තම ව්‍යාපාරයකින් ලබන ආදායම් සීමාවක් නොමැති වීම.
(9) සමාජයට වැඩි සේවයක් කළ හැකි වීම.

(1 × 4 = ලකුණු 04යි)

(ii) ව්‍යවසායකයින් විශාල වශයෙන් රටකට අවශ්‍ය වුවත් ඔවුන් බිහිවන්නේ සුළු වශයෙනි. එසේ සුළු වශයෙන් ව්‍යවසායකයින් බිහිවීමට බලපානු ලබන සාධක හතරක් කෙටියෙන් විස්තර කරන්න.

(1) ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය සඳහා අධ්‍යාපන ක්‍රමයේ සහයෝගය අඩු වීම.
(2) ව්‍යවසායකත්ව සංවර්ධනයට අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම.
(3) මූල්‍ය සහයෝගය සහ වෙනත් රාජ්‍ය අනුග්‍රහයන් විධිමත් නොවීම.
(4) නෛතික හා බදු ප්‍රතිපත්ති රාමුව ව්‍යවසායකයන් ඇති කිරීමට යෝග්‍ය නොවීම.
(5) ව්‍යවසායකත්වය පිළිබඳව ඇති සංස්කෘතික වටිනාකම් හා සමාජ ආකල්ප යහපත් නොවීම.
(6) අවදානම් දැරීමට ඇති අකැමැත්ත.
(7) නිර්මාණශීලීව හා නවෝත්පාදන හැකියාවකින් යුත් පුද්ගලයන් බිහි වීමේ අඩුකම/ ව්‍යවසායකත්ව පෞරුෂත්වයකින් යුත් පුද්ගලයින්ගේ අඩුකම
(8) පර්යේෂණ හා සංවර්ධන සඳහා වැඩි අවධානයක් යොමු නොවීම.

(1 × 4 = ලකුණු 04යි)

(iii) බොහෝ රටවල මහා පරිමාණ ව්‍යාපාරවලට වඩා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංඛ්‍යාව විශාල වේ. එම සංඛ්‍යාව ඉහළ යාමට බලපානු ලබන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ආවේණික වූ ලක්ෂණ හතරක් ලියන්න.

(1) කුඩා ප්‍රාග්ධනයක් ආයෝජනයෙන් ආරම්භ කළ හැකි වීම/ ශ්‍රම සූක්ෂම වීම
(2) ඕනෑම ස්ථානයක ආරම්භ කළ හැකි වීම.
(3) මහා පරිමාණ ව්‍යාපාර අත නොගසන ව්‍යාපාර ක්ෂෙත්‍රයන්ට යොමු වීම.
(4) දැඩි නෛතික කොන්දේසි බල නොපැවැත්වීම.
(5) ඕනෑම ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් යටතේ වුව ද ආරම්භ කළ හැකි වීම.
(6) මහා පරිමාණ ව්‍යාපාරවලට අවශ්‍ය අනෙකුත් සේවා හා යෙදවුම් සැපයීම.
(7) විවිධ දිරිගැන්වීම් හා අනුග්‍රහයන් ලැබීම.

මීට අමතරව

(8) අඩු සේවක සංඛ්‍යාවකින් පවත්වාගෙන යා හැකිවීම නිසා සේවක පිරිවැය අඩු වීම.
(9) ව්‍යාපාරයේ කළමනාකරණය ස්වාධීන වීම.

(1 × 4 = ලකුණු 04යි)

(iv) මූල්‍ය සමාගම් ව්‍යාපාර සංවර්ධනය සඳහා විවිධ සේවා සපයයි. ව්‍යාපාරවලට මූල්‍ය සමාගම් මගින් සපයන සේවා හතරක් විස්තර කරන්න.

(1) කුලීපිට ගැනුම් පහසුකම් සැපයීම
(2) කල්බදු මූල්‍යකරණය
(3) ණය සැපයීම
(4) කාලීන තැම්පතු භාර ගැනීම
(5) මුදල් හුවමාරුව සඳහා පහසුකම් සැපයීම
(6) කොටස් ප්‍රාරක්ෂණය
(7) උපදේශන සේවා සැපයීම

(නම් කිරීමට ලකුණු ½ × 4 = ලකුණු 02යි)
(විස්තර කිරීමට ලකුණු ½ × 4 = ලකුණු 02යි)

(v) "විද්‍යුත් මුදල් භාවිතය තුළින් වාසි මෙන් ම අවාසි ද සිදු වේ." මෙම ප්‍රකාශය විද්‍යුත් මුදල් භාවිතයේ වාසි හා අවාසි **දෙක** බැගින් දක්වමින් තහවුරු කරන්න.

වාසි

(1) ගනුදෙනු කිරීමේ පිරිවැය අඩු වීම
(2) මුදල් එහා මෙහා ගෙනයාමේ අවධානම ඉවත් වීම
(3) දවසේ පැය 24 පුරාම ගනුදෙනු කළ හැකි වීම
(4) ගෙවීම් කටයුතු පහසුවීම/ වේගවත් වීම.
(5) විවිධ ප්‍රතිලාභ හිමි වීම.
(6) විදේශ ගනුදෙනු සඳහා ද භාවිතා කළ හැකි වීම. (ගෝලීය පිවිසුම)
(7) ගනුදෙනුව තහවුරු වීම. (බිලක් ලැබීම/ සාක්ෂියක් ලැබීම.)

(1 × 2 = ලකුණු 02යි)

අවාසි

(1) පොලී, ප්‍රමාද ගාස්තු වැනි පිරිවැය දැරීමට සිදු වීම
(2) වංචනික ක්‍රියා සිදු විය හැකි වීම.
(3) අනවශ්‍ය පරිභෝජන රටාවකට හුරු වීම.
(4) තාක්ෂණික දෝෂ නිසා ගනුදෙනුවට බාධා සිදු වීම.
(5) සියළුම ගනුදෙනුකරුවන්ට විද්‍යුත් මුදලින් ගනුදෙනු කිරීමට හැකියාවක් හා ශක්තියක් නොමැති වීම.
(6) විද්‍යුත් මුදලින් ගනුදෙනු කළ හැකි අවස්ථා සීමිත වීම.
(7) විද්‍යුත් මුදලින් ගනුදෙනු කිරීමේ සීමාවන් පැවතීම.

(1 × 2 = ලකුණු 02යි)

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



3 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 78%කි. (ප්‍රස්තාරය 2) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 4%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 49%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 21%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 70%කි.



මෙම ප්‍රශ්නයට අයත් කොටස් අතරින් පහසුතාව වැඩිම කොටස (v) වන අතර එහි පහසුතාව 82%කි. එසේම පහසුතාව අඩුම කොටස (iv) වන අතර එහි පහසුතාව 49%කි. සෙසු ප්‍රශ්න කොටස්වල පහසුතාවය මෙම ප්‍රස්තාරයෙහි දැක් වේ.

තුන්වන ප්‍රශ්නයෙහි (iv) අනුකොටසෙහි පහසුතාව 49%කි. එසේ පහසුතාව අඩු වීමට හේතුව මූල්‍ය සමාගම් ව්‍යාපාර සංවර්ධනය සඳහා සපයන සේවා පිළිබඳ දැනුමක් තිබුණද එම සේවා නම් කර විස්තර කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වී තිබුණි.

ප්‍රශ්නයෙහි පැහැදිලි කිරීමක් බලාපොරොත්තු වූ විට හේතු පමණක් නොව ඒවා කෙටියෙන් පැහැදිලි කිරීමට අපේක්ෂකයින් හට මනා පරිචයක් ලබා දිය යුතු ය.

4 ප්‍රශ්නය

(i) (අ) රක්ෂණය කළ නොහැකි අවදානම් හතරක් සඳහා උදාහරණ සපයන්න.

(1) විභාග අසමත් වීම
(2) ආදරය සෙනෙහස අහිමි වීම.
(3) යල් පැනීම, ක්ෂය වීම, මල බැඳීම වැනි ස්වභාවික හේතු
(4) වැරදි කළමනාකරණ තීරණ නිසා සිදුවන ව්‍යාපාර අලාභ
(5) පුද්ගල හැකියා තක්සේරු කළ නොහැක
(6) ස්වාභාවික හේතු
(7) ව්‍යාපාර අලාභ **(½ × 4 = ලකුණු 02යි)**

(ආ) රක්ෂණ කර්මාන්තයේ සංවර්ධනයට දායක වීමට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය පිහිටුවා ඇත. මෙම මණ්ඩලය මගින් ඉටු කරන කාර්ය හතරක් සඳහන් කරන්න.

(1) රක්ෂණ සමාගම් ලියාපදිංචි කිරීම.
(2) රක්ෂණ බ්‍රෝකර්වරුන් ලියාපදිංචි කිරීම.
(3) රක්ෂණ සමාගම්වල ලියාපදිංචිය අත්හිටුවීම.
(4) රක්ෂණ අරමුදල් ආයෝජනය පිළිබඳ කඩඉම් නියම කිරීම
(5) රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීම හා සංවර්ධනය කිරීම සඳහා රජයට උපදෙස් දීම
(6) රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් රජයේ ප්‍රත්පත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
(7) රක්ෂණ ව්‍යාපාරයේ උන්නතිය සඳහා සෙස් බද්දක් පැනවීම.

(½ × 4 = ලකුණු 02යි)

(ii) (අ) නුවරඑළියේ සිට කොළඹට පළතුරු ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන සේවාවක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු ප්‍රධාන කරුණු හතරක් දක්වන්න.

(1) පළතුරුවල ස්වභාවය
(2) වේගවත් බව
(3) ධාරිතාව
(4) සුරක්ෂිත බව
(5) සුලබ බව
(6) පිරිවැය **(½ × 4 = ලකුණු 02යි)**

(ආ) දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය වර්ධනය කරලීම සඳහා ඔබ විසින් කරන යෝජනා හතරක් හේතු සහිතව විස්තර කරන්න.

(1) භාණ්ඩ ප්‍රවාහනයට සුදුසු දුම්රිය මැදිරි නවීකරණය කිරීම
(2) විශාල ප්‍රමාණයක් එකවර ප්‍රවාහනය කළ හැකි වන සේ දුම්රිය මැදිරි ප්‍රමාණය වැඩි කිරීම
(3) ගමනාන්තය දක්වා ගමන් කළ හැකි වන සේ අනෙකුත් මාධ්‍යයන්හි සම්බන්ධතා ගොඩනැගීම.
(4) GPS තාක්ෂණය මගින් ප්‍රවාහනය කරනු ලබන භාණ්ඩ පිළිබඳව තොරතුරු ලබා ගත හැකි සේ පහසුකම් සැපයීම
(5) විවිධ භාණ්ඩවලට ගැළපෙන සේ පහසුකම් ඇති දුම්රිය මැදිරි යොදා ගැනීම
උදා :- ශීතාගාර පහසුකම් සහිත මැදිරි
(6) ප්‍රධාන දුම්රිය ස්ථානවල සිට, ව්‍යාපාර ස්ථාන, බස් නැවතුම්පොළ ද ආදී ස්ථාන සම්බන්ධ කරන විද්‍යුත් දුම්රිය ජාලයක් ස්ථාපිත කිරීම.
(7) භාණ්ඩ පැටවීමේ දී හා බෑමේ දී සුරක්ෂිතව සිදු කළ හැකි නවීන තාක්ෂණික උපකරණ හඳුන්වා දීම.
(8) වෙනත් පිළිගත හැකි හේතු

($\frac{1}{2}$ × 4 = ලකුණු 02යි)

(iii)(අ) කළමනාකරණ සහකරුවන් සඳහා පැවැත්වූ පුහුණු සැසියක දී ලිපි ගොනු පවත්වා ගැනීම පිළිබඳ ඔබගේ දේශනයට සහභාගිවූවන්ගේ ප්‍රතිචාරය හොඳ මට්ටමක නොමැති බව කළමණාකාරීත්වය විසින් දන්වා ඇත. එවැනි ප්‍රතිචාරයක් ලැබීමට ඔබගේ දේශනයේ දී සිදු විය හැකි දුර්වලතා හතරක් සඳහන් කරන්න.

(1) පැහැදිලිව හා නිරවුල්ව මෙන් ම සරලව කරුණු ඉදිරිපත් නොකිරීම.
(2) අදාළ උදාහරණ භාවිතා නොකිරීම
(3) අනවශ්‍ය විස්තර කිරීම්
(4) හඬ පාලනය හා නිවැරදි උච්ඡාරණය නොමැති වීම.
(5) හැඟීම් හා ඉඟි පැහැදිලි නොවීම
(6) ප්‍රේක්ෂකයින් හා දේශකයා අතර සම්බන්ධතාවයක් නොමැති වීම.
(7) ප්‍රේක්ෂක අවධානය ලබා ගත නොහැකි වීම.
(8) ප්‍රතිපෝෂණය ලබා නොගැනීම.
(9) නිවැරදිව කාලය කළමනාකරණය කර නොගැනීම.

($\frac{1}{2}$ × 4 = ලකුණු 02යි)

(ආ) බොහෝ ආයතන සන්නිවේදන කටයුතු සඳහා විද්‍යුත් තැපැල භාවිත කරනු ලැබේ. විද්‍යුත් තැපැල භාවිත කිරීමේ වාසි හා අවාසි **දෙක** බැගින් සඳහන් කරන්න.

වාසි

(1) පිරිවැය අඩු වීම
(2) වේගවත් වීම
(3) විශ්වාසදායී වීම
(4) පණිවුඩ යැවූ බව තහවුරු කර ගත හැකි වීම.
(5) ඕනෑම ස්ථානයක සිට පණිවුඩ හුවමාරු කළ හැකි වීම.
(6) එකම අවස්ථාවක දී පාර්ශව කීපයකට පණිවිඩ හුවමාරු කළ හැකි වීම.
(7) තොරතුරු ගබඩා කරගත හැකිවීම.
(8) ශබ්ද හා රූප යැවීමට හැකි වීම.
(9) ඉක්මණින් ප්‍රතිචාර ලබාගත හැකි වීම.
(10) ලිපිද්‍රව්‍ය භාවිතයක් නොමැති වීම.
(11) විශාල තොරතුරු ප්‍රමාණයක් එකවර හුවමාරු කරගත හැකි වීම.

($\frac{1}{2}$ × 2 = ලකුණු 01යි)

අවාසි

(1) තාක්ෂණික බාධා ඇතිවිය හැකි වීම.
(2) පණිවුඩය නිවැරදිව තේරුම් නොගැනීම.
(3) අන්තර්ජාල පහසුකම් ව්‍යාප්තිය අඩු වීම.
(4) පරිගණක සාක්ෂරතාවය අඩු වීම.
(5) සජීවී නොවීම.
(6) වෛරස් බලපෑම් ඇතිවිය හැකි වීම.

($\frac{1}{2}$ × 2 = ලකුණු 01යි)

(iv)(අ) සාම්ප්‍රදායික සිල්ලර වෙළෙඳසැල් සඳහා සුපිරි වෙළෙඳසැල්වලින් දැඩි තර්ජනයක් පවතී. සුපිරි වෙළෙඳසැල් වෙත පාරිභෝගිකයින් වැඩි වශයෙන් ආකර්ෂණය වීමට හේතු හතරක් විස්තර කරන්න.

(1) ආකර්ශණීය බව, පිරිසිදු බව යන ගුණාංගවලින් යුක්ත වීම.
(2) රථ වාහන නතර කිරීමේ ස්ථාන වෙන් කර තිබීම.
(3) භාණ්ඩ තෝරා ගැනීමේ පහසුකම් පැවතීම
(4) බැංකු ශාඛා, ස්වයංක්‍රීය බැංකු සේවා වැනි පහසුකම් පැවතීම.
(5) විද්‍යුත් මුදල් මගින් ගනුදෙනු කළහැකි වීම.
(6) වායු සමනය කර තිබීම.
(7) අමතර පහසුකම් සලසා තිබීම.
(8) විවිධ භාණ්ඩ වර්ග එක් ස්ථානයකින් ලබාගත හැකි වීම.
(9) ප්‍රවර්ධනය කටයුතු සැකසීම.
(10) නිශ්චිත කාලයක් විවෘතව තිබීම. (රාත්‍රී 10 දක්වා)
(11) සමාජ තත්ත්වය /පිළිගැනීම නිසා

(½ × 4 = ලකුණු 02යි)

(ආ) ඇතැම් ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයින්ට ජාත්‍යන්තර වෙළෙඳපොල තුළ ඇති තරගකාරීත්වයට මුහුණ දීමට නොහැකිය. එසේ නොහැකි වීමට හේතු වන ව්‍යාපාරිකයකුට පාලනය කළ හැකි සහ පාලනය කළ නොහැකි සාධක දෙක බැගින් ලියන්න.

පාලනය කළ හැකි

(1) ජාත්‍යන්තර වෙළෙඳපොලට ගැළපෙන සේ ගුණත්වය පවත්වා ගැනීමට කටයුතු නොකිරීම.
(2) ජාත්‍යන්තර වෙළෙඳපොලට ගැළපෙන සේ භාණ්ඩ සැලසුම් කිරීම, මෝස්තරකරණය හා සංවර්ධනය සිදු නොකිරීම.
(3) යෝග්‍ය ප්‍රචාරණ හා ප්‍රවර්ධන ක්‍රම යොදා නොගැනීම.
(4) අයෝග්‍ය මිල ප්‍රතිපත්ති භාවිතය.
(5) ගනුදෙණුකාර සේවා ප්‍රමාණවත් නොවීම.
(6) අවශ්‍ය කුසලතා සහිත සේවකයන් නොමැති වීම.
(7) වෙළෙඳපොල නිවැරදිව හඳුනා නොගෙන වෙළෙඳපොලට පිවිසීම.
(8) නිවැරදි බෙදා හැරීමේ ක්‍රම යොදා නොගැනීම.

(½ × 2 = ලකුණු 01යි)

පාලනය කළ නොහැකි

(1) යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම.
(2) සහායක කර්මාන්ත දියුණු නොවීම.
(3) රජයේ ප්‍රත්පත්ති.
(4) රජයේ දුර්වල ජාත්‍යන්තර සම්බන්ධතා.
(5) රාජ්‍ය අනුග්‍රහය දුර්වල වීම.
(6) සේවක වැටුප් හා වෙනත් පිරිවැය ඉහළ යාම.
(7) ජාත්‍යන්තර වෙළෙඳාමට සහාය වන ආයතන හා පද්ධතිවල අකාර්යක්ෂමතාවය හා දැඩි නීතිරීති.

(v) (අ) 'ගනුදෙනු කළ නොහැක' යන රේඛනය යෙදීමෙන් අණකරුට විශේෂිත වූ වාසියක් හිමි නොවේ. මෙම අදහසට ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

එකඟ නොවේ.

"ගනුදෙනු කළ නොහැක" යන රේඛනයෙන් චෙක්පත ගනුදෙනු කළ හැකි ලියවිල්ලක් බවට පත් වුව ද එවැනි චෙක්පතක් ලබා ගන්නෙකු අයිතියේ ඉතිහාසය පරීක්ෂා කළ යුතු යැයි ඇඟවීමක් මින් කරයි. එම නිසා මෙවැනි චෙක්පතක් නිරායාසයෙන් එකිනෙකා අතර පැවරීම සීමා වන හෙයින් ආදායකයාම මුදල් ලබා ගැනීම තහවුරු වේ. එසේ ම චෙක්පත පැවරීමේ ඉතාහාසයේ වංචාවක් සිදු වී ඇත්නම් එහි දී අණකරුගේ වගකීමක් ද නැත. එමනිසා ප්‍රකාශයට එකඟ විය නොහැක.

<u>**අණකරු ආදායකයාට මුදල් ගෙවූ බවට මෙම රේඛනය මගින් සහතික කෙරේ. මෙමගින් චෙක්පත සොරකම් කිරීම් හා වංචා කිරීම් අණකරුගේ වගකීමෙන් නිදහස් වේ.**</u>

(ඉරි ඇඳි පද ඇත්නම් ලකුණු 01යි)

(ආ) විද්‍යුත් වෙළෙඳාම (e-trade) ප්‍රචලිත වීමට බලපා ඇති කරුණු හතරක් දක්වන්න.

(1) දවසේ ඕනෑම වේලාවක ව්‍යාපාර කටයුතු කළ හැකි වීම.
(2) ආරම්භක පිරිවැය අඩු වීම.
(3) ගනුදෙනු වේගවත් වීම.
(4) වෙළෙඳපොල පුළුල් වීම.
(5) මිල මට්ටම සාපේක්ෂව අඩු වීම/ අතරමැදියන් නොමැති වීම.
(6) භාණ්ඩ තෝරා ගැනීමට පුළුල් ඉඩකඩක් නොමැති වීම.
(7) ගනුදෙනුවලට අදාළ ක්‍රියාකාරී පිරිවැය අවම වීම.
(8) නව භාණ්ඩ පරිහරණයට අවස්ථාව ලැබීම.
(9) ලියකියවිලි භාවිතය අඩු වීම.
(10) ගනුදෙනු සම්පූර්ණයෙන් විනිවිද භාවයෙන් යුක්ත වීම.
(11) තොග පවත්වාගෙන යාමට අවශ්‍ය නොවීම.
(12) වැඩි ඉඩ ප්‍රමාණයක් අවශ්‍ය නොවීම.

(½ × 4 = ලකුණු 02යි)

4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



4 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 58%කි. (ප්‍රස්තාරය 2) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ. II ප්‍රශ්න පත්‍රයෙහි I වන කොටසෙන් අඩුම ප්‍රතිශතයක් තෝරාගත් ප්‍රශ්නය මෙයයි.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 8%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 43%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 41%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 8 %ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 49%කි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් අතරින් පහසුතාව වැඩිම අනු කොටස (iv) (අ) වන අතර එහි පහසුතාව 82%කි. එසේම පහසුතාව අඩුම අනුකොටස (v) (අ) වන අතර එහි පහසුතාව 29%කි. සෙසු ප්‍රශ්න අනුකොටස්වල පහසුතාවය මෙම ප්‍රස්තාරයෙහි දැක් වේ.

හතරවන ප්‍රශ්නයෙහි (i) (අ) කොටසෙහි පහසුතාව 48%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව රක්ෂණය කළ නොහැකි අවදානම් පිළිබඳ අවබෝධයක් අපේක්ෂකයන් තුළ නොතිබීම හා ඒ සඳහා උදාහරණ සැපයීමට තරම් දැනුමක් නොතිබීමයි. රක්ෂණය කළ හැකි හා රක්ෂණය කළ නොහැකි අවදානම් සඳහා වෙන වෙනම උදාහරණ සහිතව අපේක්ෂකයන්ට දැනුම ලබා දීම සඳහා විවෘත ග්‍රන්ථ පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කළ යුතු ය.

හතරවන ප්‍රශ්නයෙහි (i) (ආ) කොටසෙහි පහසුතාව 34%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව වූයේ රක්ෂණ කර්මාන්තයේ සංවර්ධනයට දායක වීමට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ දායකත්වය පිළිබඳ පුළුල් අවබෝධයක් අපේක්ෂකයන් තුළ නොතිබීමයි. ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයට අදාළ වන ආයතන පිළිබඳව සිසුන්ට තොරතුරු ගවේෂණය කිරීමට ව්‍යාපෘති මඟින් අවස්ථාව ලබා දිය යුතු ය.

හතරවන ප්‍රශ්නයෙහි (ii) (ආ) කොටසෙහි පහසුතාව 45%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතු වී ඇත්තේ දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය වර්ධනය කරලීමට අදාළව හේතු සහිතව යෝජනා ඉදිරිපත් කිරීමට අපේක්ෂකයන් අපොහොසත් වීමය. දුම්රියෙන් භාණ්ඩ ප්‍රවාහනයට අදාළව ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි යෝජනා නිශ්චිතව ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ය.

හතරවන ප්‍රශ්නයෙහි (iv) (ආ) අනුකොටසෙහි පහසුතාව 31%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයන්ට ජාත්‍යන්තර වෙළෙඳපොල තුළ ඇති තරගකාරීත්වයට මුහුණ දීමේ දී ව්‍යාපාරිකයෙකුට පාලනය කළ හැකි සහ පාලනය කළ නොහැකි සාධක පිළිබඳ මනා දැනුමක් නොතිබීමයි. ව්‍යාපාර අධ්‍යයනය විෂය සන්දර්භය තුළ විදේශ වෙළෙඳාම විෂය ඒකකය මඟින් හදාරනු ලබන විෂය කරුණු ප්‍රායෝගිකව ඉදිරිපත් කිරීමට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතු ය.

හතරවන ප්‍රශ්නයෙහි (v) (අ) අනුකොටසෙහි පහසුතාව 29%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව චෙක්පත් රේඛනය පිළිබඳ අපේක්ෂකයන් තුළ මනා අවබෝධයක් නොතිබීමයි. එනම් චෙක්පත් රේඛනයේ දී භාවිත කරන විවිධ සංකල්ප පිළිබඳව ද අපේක්ෂකයින්ට දැනුමක් නොතිබීමයි. එහෙයින් චෙක්පත් රේඛන වර්ග හා චෙක්පතට සම්බන්ධ පාර්ශ්ව අතර සම්බන්ධතාවය විදහා දැක්වෙන පරිදි සුදුසු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කළ යුතු ය.

හතරවන ප්‍රශ්නයෙහි (v) (ආ) අනුකොටසෙහි පහසුතාව 43%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව විද්‍යුත් වෙළෙඳාම පිළිබඳ මනා අවබෝධයක් නොතිබීමයි. එහෙයින් විද්‍යුත් වෙළඳාමෙහි නව ප්‍රවණතා පිළිබඳ දැනුම හා අවබෝධය ලැබෙන පරිදි ප්‍රායෝගික ක්‍රියාකාරකම් පන්ති කාමරය තුළ දී සංවිධානය කළ යුතු ය.

5 ප්‍රශ්නය

(i) (අ) "අන් අය ලවා වැඩ කරවා ගැනීමේ කලාව කළමනාකරණය වේ." මෙම නිර්වචනය පැහැදිලි කරන්න.

කළමණාකරුවෙකු කාර්යයන් ඉටුකරන්නෙකු නොව කාර්යයන් ඉටුකරවා ගන්නෙකි. ඒ සඳහා නිශ්චිත රටාවක් නොමැත. අවස්ථාව අනුව එම කාර්යයන් ඉටු කරවා ගැනීමට කළමණාකරුවෙකු සමත් විය යුතු ය. ඒ සඳහා විවිධ රටා හා ක්‍රම ඔහුට අනුගමනය කළ හැකිය. ආයතනයේ අරමුණු හා පරමාර්ථ සඵලදායීව ඉටු කරගත හැක්කේ කළමනාකරුවෙකුගේ ශෛලිය අනුව ය.

(ඉරි ඇඳි පද සහිත සම්පූර්ණ පිළිතුරකට ලකුණු 02යි)

(ආ) පසුගිය සතියේ ඔබේ පාසලේ පැවති වාණිජ දිනය සංවිධානය කිරීමේ කණ්ඩායම්හි ඔබ ද සාමාජිකයෙකු විය. එම දිනය පැවැත්වීම සඳහා ඔබ කණ්ඩායම විසින් ඉටු කරන ලද කාර්ය හතරක් උදාහරණ ලෙස යොදා ගනිමින් කළමනාකරණ ශ්‍රිත විස්තර කරන්න.

(1) සැලසුම්කරණය

- වාණිජ දිනයේ තේමාව අරමුණු ස්ථාපිත කිරීම
- වාණිජ දිනය තීරණය කිරීම.
- අමුත්තන් හා ආරාධිත පාසල් තීරණය කිරීම
- අනුග්‍රහකයන් හා අරමුදල් පිළිබඳ තීරණ
- පාසල් අනුමැතිය හා අවශ්‍ය ශාලා වෙන් කරගැනීමේ අනුමැතිය

(එක් කරුණකට ලකුණු ½යි)

(2) සංවිධානකරණය

- වාණිජ දිනට පෙර කාර්යයන් හඳුනා ගැනීම.
- වාණිජ දින කාර්යයන් වෙන්කර හඳුනා ගැනීම.
- ඒ ඒ කණ්ඩායම්වලට වැඩ බෙදීම.
- මුදල් කමිටුව, සංග්‍රහ කමිටුව, සන්නිවේදනය කමිටුව ආදී වශයෙන් වෙන් කිරීම.
- ඒ ඒ කමිටුවට බලතල වගකීම් පවරා දීම.

(එක් කරුණකට ලකුණු ½යි)

(3) මෙහෙයවීම

- මුදල් සංග්‍රහ සන්නිවේදන ආදී කමිටුවල වගකීම් දරන්නන්ගේ අවශ්‍යතා විමසීම්
- ඒ ඒ කමිටු අතර පොදු කරුණු පිළිබඳ දැනුවත් කිරීම
- ඒ ඒ කමිටුවල කටයුතු කරන සිසුන් උද්යෝගිමත් කිරීම හා වාණිජ දිනයේ කටයුතු කිරීමට යොමු කිරීම.

(එක් කරුණකට ලකුණු ½යි)

(4) පාලනය

- න්‍යාය පත්‍රයේ සඳහන් අයිතම ඒ ඒ වෙලාවට සිදුවීම සහතික කිරීම.
- අමුත්තන් පිළිගැනීම, සංග්‍රහ කිරීම සහ අනෙකුත් ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රතිපෝෂණයක් ලබා ගැනීම.

(එක් කරුණකට ලකුණු ½යි)

(ii) (අ) කළමණාකරුවකුගේ සංකල්පනාත්මක කුසලතා යන්නට ඇතුළත් වන හැකියා හතරක් සඳහන් කරන්න.

(1) අභ්‍යන්තර හා බාහිර පරිසර බලපෑම් හඳුනාගැනීමේ හැකියාව
(2) සමස්තය විශ්ලේෂණය කිරීමේ හැකියාව
(3) ගැටළු තේරුම් ගැනීමේ හා විසඳීමේ හැකියාව
(4) දූරදර්ශීභාවය
(5) තීක්ෂණව සිතීමේ හැකියාව/ නිර්මාණශීලී හැකියාව
(6) තීරණ ගැනීමේ හැකියාව/ උපාය මාර්ගික තීරණ ගැනීමේ හැකියාව

(½ × 4 = ලකුණු 02යි)

(ආ) හෙන්රි මින්ස්බර්ගර්ගේ කළමාකරණ භූමිකාවල නායකයා සහ ව්‍යවසායකයා යන උප භූමිකාවලට අයත් කාර්ය විස්තර කරන්න.

(1) නායකයා

- සේවක කටයුතු අගය කිරීම.
- ගුණදොස් දැක්වීම.
- සේවකයින් උසස් කිරීම හා ඉවත් කිරීම
- සේවක අභිප්‍රේරණය

(½ × 2 = ලකුණු 01යි)

(2) ව්‍යවසායකයා

- නව ව්‍යාපෘති හඳුන්වා දීම.
- ක්‍රියාවලි හඳුන්වා දීම.
- සංවිධාන ව්‍යුහය වෙනස් කිරීම.

(½ × 2 = ලකුණු 01යි)

(iii) ව්‍යාපාර උපදේශන සමාගම් විසින් ඔබට නිෂ්පාදන පිරිවැය අවම කරගැනීම සඳහා නව සූර්ය බලශක්ති පද්ධතියක් හා නිෂ්පාදනාගාර ස්වයංක්‍රියකරණය කිරීමේ පද්ධතියක් යෝජනා කර ඇත. මෙම විකල්පවලින් එකක් තෝරා ගැනීමට ඔබ අදහස් කරන අතර ඒ සඳහා මෙම විකල්ප ඇගයීමට යොදා ගත හැකි නිර්ණායක හතරක් විස්තර කරන්න.

(1) පිරිවැය	-	ක්‍රම දෙකකට අදාළ පිරිවැය සැසඳීම
(2) භාවිත කිරීමේ හැකියාව	-	අදාළ කාර්යයට යොදා ගත හැකි ද? යන්න
(3) භාවිත කිරීමේ යෝග්‍යතාවය	-	අදාළ කාර්යයට සුදුසු ද? යන්න
(4) සාපේක්ෂ වැදගත්කම	-	ආයතනයට සඵලදායී වන විකල්ප කුමක් ද?
(5) පරිසර හිතකාමී බව	-	පරිසරයට සිදු කරන බලපෑම
(6) කල් පැවැත්ම	-	කොතරම් කාලයක් පාවිච්චි කළ හැකිද? යන්න
(7) තාක්ෂණික ශක්‍යතාව	-	අමතර කොටස් පිළිබඳව අලුත්වැඩියාව හා ක්‍රියාකරවන්නන් පිළිබඳ
(8) පිළිගැනීම	-	ආයතනයේ පිළිබඳව අනෙකුත් පාර්ශවයන්ගේ කැමැත්ත
(9) පැවැත්ම	-	තාක්ෂණය යල් පැනීමට ඇති ඉඩකඩ

(නම් කිරීමට ලකුණු ½ × 4 = ලකුණු 02යි)
(හේතු විස්තර කිරීමට ලකුණු ½ × 4 = ලකුණු 02යි)

(iv) සංවිධානකරණයේ පියවර නම් කර, ඉන් පියවර තුනක් කෙටියෙන් විස්තර කරන්න.

(1) කාර්ය හඳුනා ගැනීම
(2) වැඩ බෙදීම
(3) දෙපාර්තමේන්තුකරණය
(4) අධිකාරිය හා වගකීම් පැවරීම
(5) වැඩ කිරීමේ ප්‍රමිති ඇති කිරීම
(6) සම්පත් බෙදා දීම
(7) සමායෝජනය

(පියවර 4ක් නම් කිරීමට ලකුණු ½)
(පියවර 7ම නම් කිරීමට ලකුණු ½)
(විස්තර කිරීමට ලකුණු 1 × 3 = ලකුණු 03යි)

(v) (අ) පිරියත සැලැස්මක් අවශ්‍ය වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න.

(1) ද්‍රව්‍ය හා යන්ත්‍ර භාවිත කිරීමේ කාර්යක්ෂමතාවය වර්ධනය වීම.
(2) ඉඩකඩවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට හැකි වීම.
(3) ද්‍රව්‍ය භාවිත කිරීමේ පිරිවැය අඩුකර ගැනීමට හැකි වීම.
(4) ද්‍රව්‍ය හා සේවකයින් චලනය වීමේ දී ඇතිවිය හැකි බාධා අවම වීම.
(5) අනතුරු අවම වීම.
(6) සමායෝජනය හා සුපරීක්ෂණය පහසු වීම.
(7) සේවකයින්ගේ චිත්ත ධෛර්ය ඉහළ යාම.
(8) කාර්යයන් පිළිවෙළ ක්‍රමානුකූලව කරගෙන යා හැකි වීම.
(9) අක්‍රිය කාලය අවම කරගත හැකි වීම.

(කරුණු හතරකට ½බැගින් ලකුණු 02 යි)

(ආ) වෙළෙඳ ආයතනයක මූල්‍ය විග්‍රහයේ දී අනාවරණය වූයේ ආයතනය අනවශ්‍ය ලෙස තොග පවත්වා ගැනීම නිසා පාඩු සිදු වී ඇති බවයි. එවැනි පාඩු අවම කර ගැනීම සඳහා තොග පාලනයේ දී අනුගමනය කළ හැකි උපක්‍රම හතරක් විස්තර කරන්න.

(1) තොග මට්ටම් නිශ්චය කිරීමේ ක්‍රමය
(2) ABC විශ්ලේෂණය
(3) ද්විත්ව භාජන ක්‍රමය
(4) පරිගණක වැඩසටහන් ක්‍රමය
(5) අඛණ්ඩ තොග වාර්තා කිරීමේ ක්‍රමය
(6) GIT ක්‍රමය
(7) MRP ක්‍රමය

(කරුණු හතරකට ½බැගින් ලකුණු 02 යි)

5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

5 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය



5 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 58%කි. (ප්‍රස්තාරය 2) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 30%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 33%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 8 %ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 37%කි.

5 ප්‍රශ්නයේ කොටස් හා අනුකොටස්වල පහසුතාව



5 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්

මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් අතුරෙන් පහසුතාව වැඩිම කොටස (iv) වේ. එහි පහසුතාව 70%කි. එසේම පහසුතාව අඩුම කොටස (iii) වන අතර එහි පහසුතාව 25%කි. සෙසු අනුකොටස්වල පහසුතාවය මෙම ප්‍රස්තාරයෙහි දැක් වේ.

පස්වන ප්‍රශ්නයෙහි (i) (අ) අනුකොටසෙහි පහසුතාව 47%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව කළමනාකරණ නිර්වචන තුළ ගැබ්ව ඇති කරුණු පිළිබඳ පැහැදිලි අවබෝධයක් අපේක්ෂකයන් හට නොමැති වීමයි. එහෙයින් ව්‍යාපාර සංවිධාන කළමනාකරණය පිළිබඳව නිර්වචනයන් පැහැදිලි කර ගැනීමට හා අර්ථකතනයන් ලබා දීමට හැකි වන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතු ය.

පස්වන ප්‍රශ්නයෙහි (ii) (අ) අනුකොටසෙහි පහසුතාව 36%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව කළමණාකරුවකුගේ සංකල්පනාත්මක කුසලතාවලට අයත්වන හැකියා නිශ්චිතව දැක්වීමට එම කුසලතා පිළිබඳ මනා අවබෝධයක් සිසුනට නොතිබීමයි. එහෙයින් කළමණාකරුවකු සතු විය යුතු කුසලතා වර්ග තුනටම අදාළ හැකියා පිළිබඳ වෙන් වෙන් ව හඳුනා ගැනීමට සිසුන් යොමු කිරීම සිදු කළ යුතු ය.

පස්වන ප්‍රශ්නයෙහි (ii) (ආ) අනුකොටසෙහි පහසුතාව 35%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව හෙන්රි මින්ස්බර්ග්ගේ කළමනාකරණ භූමිකා පිළිබඳ දැනුම හා අවබෝධය නොතිබීමයි. එහෙයින් හෙන්රි මින්ස්බර්ග්ගේ කළමනාකරණ භූමිකාවල නායකයා හා ව්‍යවසායකයා යන උපභූමිකාවලට අයත් කාර්යන් වෙන වෙනම වගු ගත කිරීමට සිසුන් පුරුදු පුහුණු කළ යුතු ය.

පස්වන ප්‍රශ්නයෙහි (iii) අනුකොටසෙහි පහසුතාව 25%කි. මෙසේ පහසුතාව අඩුවීමට හේතු වී ඇත්තේ විකල්ප ඇගයීමට යොදාගත හැකි නිර්ණායක පිළිබඳව නිශ්චිත අවබෝධයක් සිසුනට නොමැති වීමයි. ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල ඔවුන් නිරත කරවීම තුළින් මෙම හැකියා වර්ධනය කරගත හැකි වේ.

පස්වන ප්‍රශ්නයෙහි (iv) අනුකොටසෙහි පහසුතාව 47%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව කළමනාකරණ ශ්‍රිතයන්ගෙන් සංවිධානකරණය පිළිබඳ ව න්‍යායාත්මක දැනුම නොතිබීමයි. එහෙයින් කළමනාකරණ ශ්‍රිතවල න්‍යායාත්මක දැනුම තහවුරු වන පරිදි හා සවිස්තරාත්මක අවබෝධයක් ශිෂ්‍යයන්ට ලැබෙන පරිදි ක්‍රියාකාරකම්වල නිරත කරවිය යුතු ය.

පස්වන ප්‍රශ්නයෙහි (v) (අ) අනුකොටසෙහි පහසුතාව 38%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව මෙහෙයුම් කළමනාකරණයේ පිරියත සැලසුම් පිළිබඳ විස්තර කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වීමයි. එහෙයින් පිරියත සැලසුම් පිළිබඳව පුළුල් අවබෝධයක් ලැබෙන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කළ යුතු ය.

6 ප්‍රශ්නය

(i) (අ) ව්‍යාපාරයකට ඵලදායීතාවය වැදගත් වන්නේ ඇයි දැයි යන්න දැක්වීමට හේතු **හතරක්** සඳහන් කරන්න.

(1) ව්‍යාපාරයේ සම්පත් බෙදා හැරීම පිළිබඳ තීරණ ගැනීමට
(2) ව්‍යාපාරය පුළුල් කිරීම පිළිබඳ තීරණ ගැනීමට
(3) සෙසු සමාන ආයතන සමග ඵලදායීතාව සංසන්දනය කිරීමට
(4) ව්‍යාපාර ආයතනයේ ප්‍රගතිය අවබෝධ කර ගැනීමට **(ලකුණු 01යි)**

(ආ) ව්‍යාපාරයක ඵලදායීතාවය වැඩි කිරීමට යොදා ගනු ලබන පරිගණක ශිල්පීය ක්‍රමයක් වන 'පරිගණක ආධාරක නිර්මාණකරණය' (CAD) යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි දක්වා එහි ප්‍රතිලාභ දෙකක් ලියන්න.

පරිගණක මෘදුකාංග භාවිත කොට ගෙන භාණ්ඩ නිර්මාණය කිරීමයි

වාසි

- අපතේයාම් අවම කිරීම
- භාණ්ඩ නිපදවීමේ දී ත්‍රිමාණ හා ද්විමාන ආකෘති මගින් සංවර්ධනය කළ හැකි වීම
- ලෝකයේ විවිධ ස්ථානවල නිර්මාණය කරන භාණ්ඩ ඒ ඒ ස්ථානවල සිටම හෝ වෙනත් ස්ථානවල සිට වැඩි දියුණු කළ හැකි වීම
- භාණ්ඩ නිර්මාණය හා සංවර්ධනය කිරීමේ පිරිවැය අඩු වීම
- අවසාන නිෂ්පාදිතය නිපදවීමට පෙර අවශ්‍ය දියුණු කිරීම් කළ හැකි වීම
- ඵලදායීතාව වැඩිකර ගත හැකි වීම
- ගුණත්වය වැඩිකර ගත හැකි වීම
- සන්නිවේදනය වර්ධනය වීම
- නිෂ්පාදනයට අවශ්‍ය දත්ත පදනමක් ගොඩ නගා ගත හැකි වීම

(½ × 2 = ලකුණු 01යි)

(ii) ඉන්ද්‍රපාල තම ප්‍රදේශයේ පැවැත්වූ අලුත් අවුරුදු පොළෙහි වෙළෙඳ කුටියක් කුලියට ගත් අතර, ඔහුගේ භාණ්ඩ සියල්ල ඒ හා සමාන භාණ්ඩ විකුණූ අනෙක් වෙළෙඳ කුටිවලට වඩා ඉක්මනින් අලෙවි විය. ඉන්ද්‍රපාලගේ වෙළෙඳ කුටියේ භාණ්ඩ සියල්ල ඉක්මණින් අලෙවි වීමට හේතු විය හැකි කරුණු හතරක් විස්තර කරන්න.

(1)	මිල සාපේක්ෂව අඩුවිය හැකි බව	- අනෙකුත් භාණ්ඩ හා සසඳන විට මිල අඩු වීම
(2)	පෞද්ගලික අලෙවි නිපුණතා/ සේවක අලෙවි නිපුණතා	- ඔහුගේ පෞද්ගලික ආකර්ෂණීය ගුණාංග/ ඔහුගේ සේවකයින්ගේ ආකර්ෂණීය ගුණාංග
(3)	ආකර්ශණීයව ඉදිරිපත් කිරීම	- භාණ්ඩය පෙළ ගස්වා ඇති ආකාරය ආකර්ශණීය වීම
(4)	ප්‍රදර්ශන කුටිය පිහිටි ස්ථානය	- පාරිභෝගිකයන්ට වඩා පහසු ස්ථානයක පිහිටීම
(5)	ඔහු භාවිත කරනු ලැබූ ප්‍රවර්ධන ක්‍රමය	- අනෙකුත් විකුණුම්කරුවන්ගේ ප්‍රවර්ධන ක්‍රමවලට වඩා ගැනුම්කරුවන් ආකර්ශණය කරගත හැකි ක්‍රමයක් වීම
(6)	භාණ්ඩයේ ගුණත්වයේ විවිධතාව	- විවිධ ගුණයන් සහිත වීම

(නම් කිරීමට ලකුණු ½ × 4 = ලකුණු 02යි)
(විස්තර කිරීමට ලකුණු ½ × 4 = ලකුණු 02යි)

(iii)(අ) නිෂ්පාදකයකු තම භාණ්ඩවලට ඇසුරුමක් යෙදීමට මැලිකමක් දක්වයි. ඇසුරුමකින් යුක්තව තම භාණ්ඩ වෙළෙඳපොලට ඉදිරිපත් කිරීම සඳහා නිෂ්පාදකයා උනන්දු කිරීම සඳහා යොදා ගත හැකි කරුණු හතරක් සඳහන් කරන්න.

(1) ඇසුරුම් සහිත භාණ්ඩ සඳහා පාරිභෝගික ආකර්ෂණය ඉහළ වීම.
(2) ව්‍යාපාරයේ හා සන්නමෙහි ප්‍රතිරූපය ඉහළ යාම.
(3) භාණ්ඩයට ආරක්ෂාවක් ලැබීම.
(4) භාණ්ඩය පිළිබඳ තොරතුරු සැපයිය හැකි වීම.
(5) ප්‍රවර්ධනය පහසු වීම.
(6) භාණ්ඩ ප්‍රදර්ශනයට පහසු වීම.
(7) භාණ්ඩ ගබඩාකරණයට හා ප්‍රවාහනයට පහසු වීම.
(8) ස්වයං සේවා ක්‍රමයට අලෙවිය පහසු වීම.

(½ × 4 = ලකුණු 02යි)

(ආ) භාණ්ඩ හා සේවා මිල කිරීමේ අරමුණු හතරක් ලියන්න.

(1) වෙළෙඳපොල තුළ රැඳී සිටීම
(2) වර්තමාන ලාභ උපරිම කිරීම
(3) වෙළෙඳපොල කොටස උපරිම කිරීම
(4) වෙළෙඳපොල සාරය උරා ගැනීම
(5) නිෂ්පාදිත ගුණත්ව නායකත්වය ලැබීම

(½ × 4 = ලකුණු 02යි)

(iv) විවිධ අරමුණු සඳහා ව්‍යාපාර විසින් ප්‍රචාරණය භාවිත කරනු ලැබේ. ප්‍රචාරණයේ අරමුණු හතරක් පැහැදිලි කරන්න.

(1) දැනුම් දීම - නිෂ්පාදිතය පිළිබඳ පාරිභෝගිකයා දැනුවත් කිරීම
(2) පෙළඹවීම - මිලදී ගැනීමට උනන්දුවක් ඇති කිරීම
(3) දිරි ගැන්වීම - යෝග්‍යතාව තහවුරු කිරීම
(4) සිහි ගැන්වීම - පාරිභෝගිකයාගේ මතකයෙහි රඳවා තැබීම

(නම් කිරීමට ලකුණු ½ × 4 = ලකුණු 02යි)
(පැහැදිලි කිරීමට ලකුණු ½ × 4 = ලකුණු 02යි)

(v)(අ) ධනසිරි විසින් කරගෙන යනු ලබන අත්‍යන්ත්‍ර රෙදිපිළි ව්‍යාපාරය එතරම් සාර්ථක නොවන බැවින් ඔහු හෝටලයක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. මේ සඳහා ඔහුට අරමුදල් සපයා ගත හැකි මාර්ග හතරක් සඳහන් කරන්න.

(1) ඉතිරි කිරීම්
(2) බැංකු ණය
(3) වත්කම් විකිණීම
(4) පෞද්ගලික ණය
(5) හවුල්කරුවෙකු බඳවා ගැනීම
(6) කල්බදු
(7) කුලීපිට ගැනුම්

(½ × 4 = ලකුණු 02යි)

(v) (අ) නාමල්ගේ ව්‍යාපාරයේ ක්ෂණික අනුපාතය 2 : 4 වේ. මෙම තත්ත්වය ඇතිවීමට බලපෑ ඇති හේතු හතරක් දක්වන්න.

(1) ණයගැතියන්ගේ වටිනාකම වැඩි වීම.
(2) අතැති මුදල් ප්‍රමාණය වැඩි වීම.
(3) බැංකු ශේෂය ඉහළ වීම.
(4) ලැබිය යුතු ආදායම වැඩි වටිනාකමකින් යුක්ත වීම.
(5) ජංගම වගකීම් අඩු වීම (ණයහිමියන්, ගෙවිය යුතු බිල්)

(½ × 4 = ලකුණු 02යි)

6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



6 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 67%කි. (ප්‍රස්තාරය 2)
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 20%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 42%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 9 %ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 38%කි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් අතරින් පහසුතාව වැඩිම කොටස (ii) වන අතර එහි පහසුතාව 70%කි. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (i) (අ) අනුකොටස වන අතර එහි පහසුතාව 15%කි. සෙසු අනුකොටස්වල පහසුතාවය මෙම ප්‍රස්තාරයෙහි දැක් වේ.

හයවන ප්‍රශ්නයෙහි (i) (අ) අනුකොටසෙහි පහසුතාව 15%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව ඵලදායීතාවය පිළිබඳව අවබෝධයක් තිබුණ ද එය ව්‍යාපාරයකට වැදගත් වන ආකාරය පිළිබඳව හේතු ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් අපොහොසත් වීමයි. එමෙන්ම සංකල්ප පිළිබඳ දැනුම ලබාදීමේ දී එය ප්‍රායෝගිකව ව්‍යාපාරවලට වැදගත් වන ආකාරය හා අනෙකුත් සාධක සමඟ සම්බන්ධවන ආකාරය පැහැදිලිව අවබෝධවන පරිදි සුදුසු අභ්‍යාස තුළින් අවශ්‍ය දැනුම, කුසලතා සමඟ ආකල්ප වර්ධනය වන ආකාරයට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතු ය.

හයවන ප්‍රශ්නයෙහි (i) (ආ) අනුකොටසෙහි පහසුතාව 46%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව පරිගණක ශිල්පීය ක්‍රම තුළින් ව්‍යාපාරයක ඵලදායීතාවය වැඩි කිරීමට යොදවා ගනු ලබන ආකාරයන් සඳහන් කිරීමට අපොහොසත් වීමයි. එහෙයින් පරිගණක ශිල්පීය ක්‍රම පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් තුළින් දැනුම තහවුරු කළ යුතු ය.

හයවන ප්‍රශ්නයෙහි (iii) (ආ) අනුකොටසෙහි පහසුතාව 38%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව භාණ්ඩ හා සේවා මිල කිරීමේ අරමුණු පිළිබඳ නිශ්චිත අවබෝධයක් නොතිබීමයි. එහෙයින් විෂය කරුණු තහවුරු වන සේ සුදුසු අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරතකරවිය යුතු ය.

හයවන ප්‍රශ්නයෙහි (iv) වන අනුකොටසෙහි පහසුතාව 43%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව ප්‍රචාරණයේ අරමුණු පිළිබඳ දැනුම නොතිබීමයි. එහෙයින් විෂය කරුණු තහවුරු වන සේ ශිෂ්‍යයන් ක්‍රියාකාරකම්වල නිරත කරවිය යුතු ය.

හයවන ප්‍රශ්නයෙහි (v) (ආ) වන අනුකොටසෙහි පහසුතාව 25%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව මූල්‍ය අනුපාත සංසන්දනය පිළිබඳව නිශ්චිත අවබෝධයක් නොතිබීමයි. එහෙයින් ව්‍යාපාරයක මූල්‍ය අනුපාත ශිෂ්‍යයන් ලවා ගණනය කළ යුතු අතර අනුපාත විශ්ලේෂණය මඟින් ලැබෙන තොරතුරු ව්‍යාපාරවලට බලපාන ආකාර පිළිබඳ දැනුවත් කළ යුතු ය.

7 ප්‍රශ්නය

(i) (අ) ව්‍යාපාරයකට කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපයා ගත හැකි මාර්ග හතරක් සඳහන් කරන්න.

(1) බැංකු අයිරා
(2) වාණිජ පත්‍රිකා
(3) ගෙවිය යුතු වියදම් පමා කිරීම
(4) කෙටි කාලීන බැංකු ණය
(5) වෙළෙඳ ණය
(6) බදු වෙන් කිරීම
(7) ලාභාංශ වෙන් කිරීම
(8) ණයගැති ලැබීම (ලැබිය යුතු ආදායම් කලින් ලබා ගැනීම)
(9) ණයහිමියන්ට ගෙවීම් පමා කිරීම
(10) ව්‍යාපාරයට අයත් අතිරික්ත වත්කම් විකිණීම
(11) විකුණා නැවත කල්බදු ගැනීම

(½ × 4 = ලකුණු 02යි)

(ආ) කොළඹ කොටස් හුවමාරුව තුළින් ලැයිස්තුගත සමාගමකට ලැබිය හැකි වාසි හතරක් විස්තර කරන්න.

(1) සමාගම්වල කීර්තිනාමය හා ප්‍රතිරූපය ඉහළ වීම.
(2) සමාගම් කොටස්වලට වටිනාකමක් නිර්මාණය වීම.
(3) සමාගම් කොටස් සඳහා ද්විතීයික වෙළෙඳපොලක් හිමි වීම.
(4) උපාය මාර්ගික ආයෝජකයන් ආකර්ශනය කරගත හැකි වීම.
(5) ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහයක් ඇති කර ගත හැකි වීම.
(6) සමාගමේ විශ්වාසනීය බව ඉහළ යාම.

(½ × 4 = ලකුණු 02යි)

(ii) මානව සම්පත් කළමණාකරුවකු වශයෙන් ඔබ සේවය කරන ආයතනයට අලෙවි සහකරුවන් බඳවා ගැනීම සඳහා පිළියෙල කරන අයදුම්පත්‍රයක ඇතුළත් විය යුතු තොරතුරු වර්ග හතරක් විස්තර කරන්න.

(1) පුද්ගලික තොරතුරු - නම, උපන් දිනය, වයස, ලිපිනය වැනි
(2) අධ්‍යාපන සුදුසුකම් - විභාග සමත් වීම ආදිය
(3) වෘත්තිය සුදුසුකම් - රැකියාවට අදාළ වෙනත් සුදුසුකම්
(4) රැකියා ඉතිහාසය - රැකියාවට අදාළ කාර්යයන් කළ කාලය පිළිබඳ (පළපුරුද්ද)
(5) තොරතුරු ලබා ගත හැකි පුද්ගලයින් පිළිබඳ විස්තර - ඥාති සම්බන්ධතාවයක් නොමැති පුද්ගලයින්ගේ නම, තනතුර, ලිපිනය, දුරකථන අංකය ආදිය
(6) විශේෂිත දක්ෂතා / කුසලතා - ක්‍රීඩා, විවිධ භාෂා දැනුම.

(නම් කිරීමට ලකුණු ½ × 4 = ලකුණු 02යි)
(පැහැදිලි කිරීමට ලකුණු ½ × 4 = ලකුණු 02යි)

(iii) (අ) රැකියාවකට අයදුම්කරුවකු තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට අමතරව විවිධ පරීක්ෂණ පවත්වනු ලබයි. එසේ පවත්වනු ලබන පරීක්ෂණ ක්‍රම දෙකක් විස්තර කරන්න.

(1) සේවා නියුක්ත විභාග / IQ test
(2) වෛද්‍ය පරීක්ෂණ
(3) පසුබිම් පරීක්ෂණ
(4) ප්‍රායෝගික පරීෂණ
(5) පෞරුෂත්ව පරීෂණ

(නම් කිරීමට ලකුණු ½ × 2 = ලකුණු 01යි)
(පැහැදිලි කිරීමට ලකුණු ½ × 2 = ලකුණු 01යි)

(ආ) පත්වීම් ලිපියක අඩංගු තොරතුරු වර්ග කළ හැකි ආකාර හතරක් ලියන්න.

(1) රැකියාව පිළිබඳ කොන්දේසි
(2) රැකියාව පිළිබඳ නියමයන්
(3) කාර්යයන්
(4) යුතුකම් හා වගකීම්

(½ × 4 = ලකුණු 02යි)

(iv) පාඩු ලබන ආයතනයක් තම සේවක සංඛ්‍යාව අඩු කිරීමට අදහස් කරයි. එසේ සේවක සංඛ්‍යාව අඩු කළ හැකි ක්‍රම හතරක් කෙටියෙන් විස්තර කරන්න.

(1) ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීම
(2) වන්දි ලබා දී ඉවත් කිරීම.
(3) වෙනත් ආයතනයකට යොමු කිරීම
(4) නව බඳවා ගැනීම් නතර කිරීම
(5) නැවත පුහුණුව ලබා දී වෙනත් රැකියාවලට යොමු කිරීම

(නම් කිරීමට ලකුණු ½ × 4 = ලකුණු 02යි)
(පැහැදිලි කිරීමට ලකුණු ½ × 4 = ලකුණු 02යි)

(v) (අ) පහත දැක්වෙන්නේ ආයතනයක වෙළෙඳ ගිණුමෙන් උපුටාගත් දත්ත කිහිපයකි.

	රු.	රු.
විකුණුම්		500 000
ආරම්භක තොගය	80 000	
ගැනුම්	300 000	
	380 000	
අවසන් තොගය	(120 000)	260 000

ඉහත දත්ත ඇසුරෙන් ලබා ගත හැකි තොරතුරු හතරක් සඳහන් කරන්න.

(1) විකුණුම් පිරිවැය
(2) දළ ලාභය
(3) දළ ලාභ අනුපාතය
(4) තොග පිරිවැටුම් සීඝ්‍රතාවය / අනුපාතය
(5) තොග පිරිවැටුම් කාලය
(6) සාමාන්‍ය තොගය

(1 × 4 = ලකුණු 02යි)

7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



7 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 44%කි. (ප්‍රස්තාරය 2)
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 45%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 23%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 3 %ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 26%කි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් අතරින් පහසුතාව වැඩිම කොටස (iii) (අ) වන අතර එහි පහසුතාව 64%කි. එසේම පහසුතාව අඩුම අනුකොටස වන්නේ (iii) (ආ) කොටස වන අතර එහි පහසුතාව 25%කි. සෙසු අනුකොටස්වල පහසුතාවය මෙම ප්‍රස්තාරයෙහි දැක් වේ.

හත්වන ප්‍රශ්නයෙහි (i) (අ) අනුකොටසෙහි පහසුතාව 39%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව ව්‍යාපාරයකට කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපයා ගතහැකි මාර්ග පිළිබඳ දැනුම අපේක්ෂකයන් හට නොමැති වීමයි. එහෙයින් මූල්‍ය කළමනාකරණයේ දී ව්‍යාපාරයකට අවශ්‍ය කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපයා ගත හැකි මාර්ග පිළිබඳව පුළුල් දැනුමක් හා අවබෝධයක් ලැබෙන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කළ යුතු වේ.

හත්වන ප්‍රශ්නයෙහි (i) (ආ) අනුකොටසෙහි පහසුතාව 29%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව කොළඹ කොටස් හුවමාරුව තුළින් ලැයිස්තුගත සමාගමකට ලැබිය හැකි වාසි පිළිබඳව දැනුම අපේක්ෂකයන්ට හට නොමැති වීමයි. එහෙයින් මූල්‍ය කළමනාකරණ විෂයය ඒකකයේ කොළඹ කොටස් හුවමාරුව පිළිබඳව පුළුල් දැනුමක් හා අවබෝධයක් ලැබෙන පරිදි ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සංවිධානය කර එය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට ඇතුළත් කළ යුතු ය.

හත්වන ප්‍රශ්නයෙහි (iii) (ආ) අනුකොටසෙහි පහසුතාව 25%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව මානව සම්පත් විෂය ඒකකයේ රැකියාවකට අයදුම්කරුවකු තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට අමතරව ඇති, විවිධ පරීක්ෂණ ක්‍රම හා පත්වීම් ලිපියක අඩංගු තොරතුරු වර්ග කළ හැකි ආකාර පිළිබඳව අපේක්ෂකයන්ට මනා අවබෝධයක් නොතිබීමයි. එහෙයින් මානව සම්පත් කළමනාකරණ ඒකකයේ රැකියාවකට අයදුම්කරුවකු තෝරාගැනීමේ පරීක්ෂණ ක්‍රම පිළිබඳ විස්තර කිරීමට හා පත්වීමේ ලිපියක අඩංගු තොරතුරු අධ්‍යයනය කිරීමට හා අවබෝධ කිරීමට හැකි අයුරින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් යෙදවිය යුතු ය.

හත්වන ප්‍රශ්නයෙහි (iv) අනුකොටසෙහි පහසුතාව 29%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව පාඩු ලබන ආයතනයක් තම සේවක සංඛ්‍යාව අඩු කිරීමේ දී යොදාගනු ලබන ක්‍රම පිළිබඳව අපේක්ෂකයින්ට මනා දැනුමක් නොතිබීමය. එහෙයින් මානව සම්පත් ඒකකයේ සේවකයන් චලනය කිරීමේ ක්‍රම පිළිබඳව සිසුන්ගේ අවබෝධය වර්ධනය කළ යුතු ය.

හත්වන ප්‍රශ්නයෙහි (v) අනුකොටසෙහි පහසුතාව 42%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව වෙළෙඳ ගිණුම ඇසුරින් ලබා දී ඇති දත්ත මඟින් තොරතුරු සඳහන් කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වීමයි. එහෙයින් මූල්‍ය කළමනාකරණයේ දී ආදායම් ප්‍රකාශය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ඇසුරෙන් ලබා ගන්නා දත්ත මඟින් අදාළ තොරතුරු ප්‍රකාශ කිරීමේ හැකියාව පිළිබඳ අවබෝධයක් සිසුන්ට ලබා දීම නිශ්චිතව තහවුරු වන සේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය මඟින් පියවර ගත යුතු ය.

8 ප්‍රශ්නය

(i) (අ) තොරතුරු කළමනාකරණ තාක්ෂණය යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි විස්තර කරන්න.

ආයතනයක් සතු පරිගණක තාක්ෂණය හා සන්නිවේදන තාක්ෂණය මැනවින් හසුරවමින් තොරතුරු සම්පත කාර්යක්ෂමව හා සඵලදායීව භාවිත කිරීමේ ක්‍රියාවලිය තොරතුරු කළමණාකරණ තාක්ෂණයයි.

(ලකුණු 02යි)

(ආ) තොරතුරු තාක්ෂණය භාවිතයෙන් ආයතනයකට ලබා ගත හැකි වාසි හතරක් විස්තර කරන්න.

(1) වඩා නිවැරදි තීරණ ගත හැකි වීම.
(2) කටයුතුවල වැරදි අවම වීම.
(3) ක්‍රියාවලි කාර්යක්ෂමව සිදුකර ගත හැකි වීම.
(4) ක්‍රියාවලිය සඵලදායීව සිදු කර ගත හැකි වීම.
(5) නිමැවුම්වල ගුණාත්මක භාවය ඉහළ යාම.
(6) තොරතුරු සඳහා ඉතා විශාල ගබඩා ධාරිතාවයක් පැවතීම.
(7) පිරිවැය අඩු වීම.
(8) තරගයට මුහුණ දිය හැකි වීම.
(9) සන්නිවේදන ක්‍රියාවලිය පහසු වීම.
(10) පාරිභෝගිකයන් හෝ සේවාදායකයින් වෙත පහසුවෙන් ප්‍රවේශ විය හැකි බව.
(11) අන්තර්ජාතික වෙළෙඳාම ප්‍රසාරණය වීම.
(12) ප්‍රවර්ධනය පහසු වීම.

(½ × 4 = ලකුණු 02යි)

(ii) (අ) ව්‍යාපාරිකයෙක් තම ව්‍යාපාර කටයුතු සඳහා අන්තර්ජාලය භාවිත කිරීමට අදහස් කරයි. අන්තර්ජාලය භාවිත කිරීමෙන් ඔහුගේ ආයතන කටයුතු පහසුකර ගත හැකි ආකාර හතරක් විස්තර කරන්න.

(1) නිෂ්පාදිත ප්‍රවර්ධනය පහසු වීම.
(2) සේවක ආකර්ෂණය පහසු වීම.
(3) වෙළෙඳ ගනුදෙනු කාර්යක්ෂමව සිදු කළ හැකි වීම/ වෙළෙඳපොල සොයා ගැනීමට හැකි වීම.
(4) දත්ත ගබඩා කර තබා ගත හැකි වීම.
(5) සන්නිවේදන කටයුතු පහසුවෙන් කළ හැකි වීම/ ක්ෂණිකව තොරතුරු ලබා ගැනීමට හැකි වීම.
(6) ව්‍යාපාර කටයුතු බාහිර පාර්ශ්වයන්ට පවරා සිදු කළ හැකි වීම.
(7) ව්‍යාපාර කටයුතු අධීක්ෂණය හා නියාමනය පහසු වීම.
(8) G. P. S තාක්ෂණය භාවිත කිරීමෙන් ව්‍යාපාර කටයුතු පහසුකර ගත හැකි වීම.
(9) ජංගම සේවක පිරිසක් පවත්වා ගත හැකි වීම.
(10) පිරිවැය අඩු කර ගැනීමට හැකි වීම.
(11) කඩදාසි භාවිතය අවම කර ගත හැකි වීම.
(12) විද්‍යුත් තැපැල භාවිතයට ඇති හැකියාව.

(½ × 4 = ලකුණු 02යි)

(ආ) වලාකුළු (CLOUD) තාක්ෂණය භාවිත කිරීමෙන් ආයතනයකට ලබා ගත හැකි වාසි දෙකක් සඳහන් කරන්න.

(1) අන්තර්ජාලයට පිවිසීමට උපකරණ ඇති ඕනෑම ස්ථානයක දී ලිපිගොනුවකට ඇතුල් විය හැකි වීම / ඕනෑම විද්‍යුත් උපකරණයක් භාවිත කර ලිපිගොනුවකට ප්‍රවේශ වීමේ හැකියාව.
(2) අන්තර්ජාල සැපයුම්කරුවෙකු හෝ විශාල පරිගණක පද්ධතියක් අනවශ්‍ය වීම.
(3) දත්ත පද්ධති නඩත්තු කිරීමේ පිරිවැය අඩු වීම.
(4) තාක්ෂණික හා විදුලිය ඇණහිටීම් ආදී හේතු නිසා දත්ත පද්ධතියට හානි සිදු නොවීම.
(5) ධාරිතාවයේ සීමාවක් නැත.
(6) ආරක්ෂා සහිත වීම (දත්ත) / (Back up system)

(1 × 2 = ලකුණු 02යි)

(iii) ව්‍යාපාර සැලැස්මේ අලෙවි සැලසුමට ඇතුළත් කළ යුතු ප්‍රධාන උපාය මාර්ග මොනවා ද?

(1) නිෂ්පාදිත උපාය මාර්ග
(2) මිල උපාය මාර්ග
(3) බෙදා හැරීමේ උපාය මාර්ග
(4) ප්‍රවර්ධන උපාය මාර්ග

(1 × 4 = ලකුණු 04යි)

(iv) මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් සකස් කිරීමේ වැදගත්කම පැහැදිලි කිරීමට කරුණු දෙකක් දක්වා, ව්‍යාපාරයක මුදල් ගලායාමට අදාළ අයිතම තුනක් ලියන්න.

(1) අනාගත කාලච්ඡේදයක් තුළ දී ව්‍යාපාරයට මුදල් ගලා ඒම් සහ ගලා යාම් පුරෝකථනය කළ හැකි වීම.
(2) කාලච්ඡේදය අවසානයේ මුදල් ශේෂය පුරෝකථනය කළ හැකි වීම.
(3) මුදල් ගලා ඒම් සහ ගලා යෑම්වල ප්‍රවණතා හා රටා කලින් හඳුනා ගත හැකි වීම
(4) මුදල් ලබාගත හැකි හා මුදල් යෙදවිය යුතු මාර්ග පිළිබඳව කලින් සැලසුම් කර ගත හැකි වීම.
(5) මුදල් ගලා යාම් හා ගලා ඒම් පිළිබඳව අවබෝධයක් ලබා ගත හැක.

(1 ½ × 2 = ලකුණු 02යි)

අයිතම

(1) ඉඩම් හා ගොඩනැගිලි මිලට ගැනීම්
(2) යන්ත්‍ර හා උපකරණ මිලට ගැනීම්
(3) අමුද්‍රව්‍ය මිලට ගැනීම්
(4) අලෙවි වියදම්
(5) පරිපාලන වියදම්
(6) ණය වාරික ගෙවීම්
(7) ආදායම් බදු ගෙවීම්
(8) ණය පොලී ගෙවීම්

(අයිතම 3කට 01යි)

(අයිතම 2කට ½යි)

(අයිතම 1කට ලකුණු නැත)

(v) සමන් දැනට කරගෙන යනු ලබන ව්‍යාපාරයට අමතරව සත්ත්ව ගොවිපලක් ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. ඒ සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීමට ඔබට භාර දී ඇත. එම ව්‍යාපෘති වාර්තාවේ සාරාංශය තුළ ඔබ විසින් ඇතුළත් කරනු ලබන්නේ මොනවා දැයි සඳහන් කරන්න.

(1) ඇස්තමේන්තුගත පිරිවැය
(2) ආදායම් ප්‍රකාශය
(3) මුදල් ප්‍රවාහ ප්‍රකාශය
(4) ණය ආපසු ගෙවීමේ සටහන
(5) ඇස්තමේන්තුගත ශේෂ පත්‍රය
(6) අරමුණු
(7) විධායක සාරාංශය, ව්‍යාපාර විස්තරය, අලෙවි සැලැස්ම, මෙහෙයුම් සැලැස්ම, මානව සම්පත් සැලැස්ම, මූල්‍ය සැලැස්ම

(1 × 4 = ලකුණු 04යි)

8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



8 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 41%කි. (ප්‍රස්තාරය 2) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 48%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 40%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 10%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 2 %ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 12%කි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් අතරින් පහසුතාව වැඩිම කොටස (iv) වන අතර එහි පහසුතාව 56%කි. එසේම පහසුතාව අඩුම කොටස් වන්නේ (iii) හා (v) කොටස් වන අතර එහි පහසුතාව 16%කි. සෙසු අනුකොටස්වල පහසුතාවය මෙම ප්‍රස්තාරයෙහි දැක් වේ.

අටවන ප්‍රශ්නයෙහි (i) (අ) අනුකොටසෙහි පහසුතාව 31%කි. මෙසේ පහසුතාව අඩු වීමට හේතුව තොරතුරු කළමනාකරණ තාක්ෂණය පිළිබඳ අපේක්ෂකයන් තුළ මනා දැනුමක් නොමැති වීමයි. එහෙයින් තොරතුරු කළමනාකරණ තාක්ෂණය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා අවබෝධයක් සිසුන්ට ලැබෙන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතු ය.

අටවන ප්‍රශ්නයෙහි (ii) (අ) අනුකොටසෙහි පහසුතාව 44%කි. මෙසේ පහසුතාවය අඩු වීමට හේතුව අන්තර්ජාලය ඇසුරෙන් ආයතනයක කටයුතු පහසු කළ හැකි ආකාර පිළිබඳව අපේක්ෂකයින්ට මනා දැනුමක් නොතිබීමයි. එහෙයින් අන්තර්ජාල භාවිතය පිළිබඳ ප්‍රායෝගික දැනුම ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සංවිධානය කළ යුතු ය.

අටවන ප්‍රශ්නයෙහි (ii) (ආ) අනුකොටසෙහි පහසුතාව 21%කි. මෙසේ පහසුතාවය අඩු වීමට හේතුව වලාකුළු තාක්ෂණය භාවිත කිරීමෙන් ආයතනයකට ලබා ගත හැකි වාසි පිළිබඳ අපේක්ෂකයන්ට දැනුමක් නොතිබීමයි. එහෙයින් නව තාක්ෂණයේ ප්‍රවණතා පිළිබඳව අපේක්ෂකයින් දැනුවත් කිරීමේ ප්‍රායෝගික වැඩමුළු සංවිධානය කළ යුතු ය.

අටවන ප්‍රශ්නයෙහි (iii) කොටසෙහි පහසුතාව 16%කි. මෙසේ පහසුතාවය අඩු වීමට හේතුව ව්‍යාපාර සැලැස්මේ අලෙවි සැලසුමට ඇතුළත් කළ යුතු ප්‍රධාන උපාය මාර්ග පිළිබඳ මනා දැනුමක් නොතිබීමයි. එහෙයින් ව්‍යාපාර සැලැස්ම අපේක්ෂකයින් ලවා ප්‍රායෝගිකව සැකසිය යුතු අතර ඒ තුළින් අවශ්‍ය දැනුම හා අවබෝධය ලබා දිය යුතු ය.

අටවන ප්‍රශ්නයෙහි (iv) අනුකොටසෙහි පහසුතාව 44%කි. මෙසේ පහසුතාවය අඩු වීමට හේතුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් සකස් කිරීමේ වැදගත්කම පිළිබඳව මනා දැනුමක් නොතිබීමයි. එහෙයින් අපේක්ෂකයන් පන්ති කාමර තුළ මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කිරීමට හුරුකර එහි වැදගත්කම පිළිබඳ මනා දැනුමක් හා අවබෝධයක් ලබා ගත යුතු ය.

අටවන ප්‍රශ්නයෙහි (v) කොටසෙහි පහසුතාව 16%කි. මෙසේ පහසුතාවය අඩු වීමට හේතුව ව්‍යාපෘති වාර්තාවක කොටස් තුළ ඇති අන්තර්ගත කරුණු පිළිබඳ අපේක්ෂකයින් තුළ මනා දැනුමක් නොතිබීමයි. එහෙයින් අපේක්ෂකයින් හට ප්‍රායෝගිකව ව්‍යාපෘති සැලසුම් සකස් කර එහි අඩංගු කරුණු පිළිබඳව නිශ්චිත අවබෝධයක් ලබා දීමට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කළ යුතු ය.

2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 1, 2, 3 හා 4 යන ප්‍රශ්න I වන කොටසට අයත් වේ. ප්‍රශ්න 5, 6, 7 හා 8 යන ප්‍රශ්න II කොටසට අයත් වේ. එම කොටස් දෙකෙන් අවම වශයෙන් එක කොටසකින් ප්‍රශ්න දෙකක් බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු වේ.

I කොටසේ 63%ක් වූ ඉහළම පහසුතාවක් දැකිය හැක්කේ තුන්වන ප්‍රශ්නයට වන අතර, අඩුම පහසුතාව වූ 49% දැකිය හැක්කේ දෙවන ප්‍රශ්නයට ය.

II කොටසේ 46%ක් වූ ඉහළම පහසුතාව හයවන ප්‍රශ්නය සඳහාත්, අඩුම පහසුතාව වූ 31% අටවන ප්‍රශ්නය සඳහාත් දැකිය හැකි ය.

I හා II කොටස්වල සමස්ත පහසුතාව විමසා බැලීමේ දී I කොටසේ සමස්ත සාමාන්‍ය පහසුතාව 53%කි. එමෙන්ම II කොටසේ සාමාන්‍ය සමස්ත පහසුතාව 40%කි.

2018 වර්ෂයේ සිසුන්ගේ පිළිතුරු පත්‍රවල දක්නට ලැබුණු පොදු දුර්වලතා හා ඒ සඳහා විසඳුම් නිරීක්ෂණ හා යෝජනා

ප්‍රශ්න අංක 01.

ප්‍රශ්නය 01.

(i) (අ) **අවශ්‍යතා, වුවමනා සහ නිෂ්පාදිත යන පද නිර්වචනය කර, ඒවා අතර පවතින සම්බන්ධතාව පැහැදිලි කරන්න.**

පිළිතුර

(i) අ) - මිනිසා විසින් අත්‍යවශ්‍යයෙන්ම සපුරා ගත යුතු කායික හා මානසික සාධකයන් අවශ්‍යතා වේ. (1/2)
උදා:- ආහාර, ඇඳුම්, නිවාස, ආරක්ෂාව.
- අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ස්වරූපයන් වුවමනා වේ. (1/2)
උදා:- * ආහාර → බත්, පාන්, පිට්ටු
* ඇඳුම් → සාය, ගවුම, කලිසම.
- ඒ අනුව අවශ්‍යතා ~~නිසා~~ නිසා වුවමනා හට ගනී. ඒ අනුව අවශ්‍යතා හා වුවමනා අතර සම්බන්ධයක් පවතී.
- මිනිස් අවශ්‍යතා හා වුවමනා සාක්ෂාත් කිරීම සඳහා වෙළෙඳපොළට ඉදිරිපත් කරනු ලබන ඕනෑම දෙයක් නිෂ්පාදිත වේ. (1/2)
උදා:- සාරියක්, චොකලට්, හාල්
- ඒ අනුව නිෂ්පාදිත යනු අවශ්‍යතා හා වුවමනා සාක්ෂාත් කරන්නකි. අවශ්‍යතා හා වුවමනා සපුරා ගන්නා දෑ වේ.
- ඒ අනුව අවශ්‍යතා, වුවමනා හා නිෂ්පාදිත අතර ඉතා සම්බන්ධයක් ඇත.

නිරීක්ෂණ හා යෝජනා

ප්‍රශ්නයෙන් විමසා ඇති අවශ්‍යතා, වුවමනා, නිෂ්පාදිත යන පද හඳුන්වා ඇති නමුත් මේවා අතර පවත්නා සම්බන්ධතාවය නිශ්චිතව දැක්වීමට අපොහොසත් වී ඇත.

ප්‍රශ්නය **01.**

(i) (ආ) නිෂ්පාදන ක්‍රමය සෘජු නිෂ්පාදනයේ සිට වක්‍ර නිෂ්පාදනය දක්වා මාරු වීමට බලපෑ ප්‍රධාන හේතු **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

පිළිතුර



(ආ) i) 1. ජනගහනය වර්ධනය වීම - කාලීනව ලෝකය තුළ නාගරික ජනගහනය වර්ධනය වෙමින් මිනිසුන්ගේ අවශ්‍යතා හා වුවමනාද වර්ධනය විය. එම නිසා සෘජු නිෂ්පාදනයේ සිට වක්‍ර නිෂ්පාදනයට මාරු විය.

2. වුවමනා වල සංකීර්ණතාවය වැඩි වීම, කාර්මිකරණය සමඟ දියුණු යුගයේ දී ජනයාගේ වුවමනා හා වෙනත් ජනයාගේ වුවමනා අතර [illegible] නැත.

3. වෙළඳපල කාර්මිකරණය - වෙළඳපල තුළ නිසි නිෂ්පාදක හා වෙනත් නිෂ්පාදක අතර චලිතයක් ඇත. වෙළඳපලට වලංගු නිෂ්පාදනද ව්‍යාප්ත ව ඇත. එම නිසා සෘජු නිෂ්පාදනය වක්‍ර නිෂ්පාදනයක් විය.

4. දියුණු නිෂ්පාදනය - දියුණු ජනය තමාට [illegible] තමාම නිෂ්පාදනය කළද 2013 විය. එම නිසා සෘජු නිෂ්පාදනය වක්‍ර නිෂ්පාදනය කරා ගත් විය.

02

නිරීක්ෂණ හා යෝජනා

ප්‍රශ්නය හරිහැටි අවබෝධ කර නොගෙන ඊට අදාළ නොවන පිළිතුරු ලබා දී ඇත.

ප්‍රශ්නය **01.**

(ii) (අ) **නව පරපුර කෘෂිකර්මාන්තයේ නියුක්ත වීමට අකමැත්තක් දක්වනු ලැබේ. මෙසේ වීමට බලපා ඇති හේතු හතරක් දක්වන්න.**

පිළිතුර



නිරීක්ෂණ හා යෝජනා
මෙම පිළිතුරේ එක් කරුණක් පමණක් දක්වා ඇත. විමසා ඇති කරුණු නිශ්චිතව දැක්වීමට අපොහොසත් වී ඇත

ප්‍රශ්නය **01.**

(ii) (ආ) **සාර්ව පරිසරයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න.**

පිළිතුර


ආ) 1. අවශ්‍ය භාණ්ඩ ගැනීමට හැකි වීම.
සාර්ව පරිසරය අධ්‍යයනය තුළින් ව්‍යාපාර
සඳහා අවශ්‍ය සොයා ගත හැක.
2. නිර්මිත භාණ්ඩ ගැනීමට හැකි වීම.
සාර්ව පරිසර අධ්‍යයනය තුළින් ව්‍යාපාරයට
ලාභකාරී නිර්මිත භාණ්ඩ ගත හැක.
23:- තරඟකාරී ව්‍යාපාර වල පරිසරය.

නිරීක්ෂණ හා යෝජනා

ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කර නොගෙන එමගින් විමසා ඇති සාර්ව පරිසරයේ ලක්‍ෂණ නොමැති ව එහි වැදගත්කම දක්වා ඇත. සාර්ව පරිසරයේ විශේෂ ලක්‍ෂණ නිශ්චිත ව දැක්වීමට තරම් ප්‍රමාණවත් අවබෝධයක් නොමැති ව පිළිතුරු සපයා ඇත.

ප්‍රශ්නය **01.**

(iii) **ගෝලීයකරණය යනු කුමක් දැ'යි අර්ථකථනය කර, එය දේශීය ව්‍යාපාර කෙරෙහි ඇති කරන ධනාත්මක හා සෘණාත්මක බලපෑම් දෙක බැගින් විස්තර කරන්න.** **(ලකුණු 04 යි)**

පිළිතුර

බාහිර පරිසරය ව්‍යාපාරිකයාට පාලනය කල නොහැකි වූ බාහිර පරිසරය අවස්ථාවන් ~~[illegible]~~ & අවදානම් හා තර්ජන ගෙන ගැනීමට හැකි වේ. (1)

ලෝකයේ සියලුම රටවල් අතර බැඳියාවෙන් යුතු තනි ආර්ථිකයක් ලෙස සකස් කිරීම ගෝලීයකරණය ලෙස හැඳින්වේ. (2)

ගෝලීයකරණයේ ධනාත්මක බලපෑම් වේ.

1. වෙළෙඳපොළ පුළුල් වීම. (½)
2. නව දැනුම හා තාක්ෂණය භාවිතා කර ගැනීමට හැකි වීම. (½)

සෘණාත්මක බලපෑම් වේ.

1. ව්‍යාපාර තරඟකාරීත්වයට මුහුණ දීමට සිදු වීම.
2. ආනයන භාණ්ඩ අඩු මිල නිසා දේශීය ලෙසා නිෂ්පාදන විකිණීමට අපහසු වීම. (½)
3. ලෝකයේ රටවල ව්‍යාපාර මත අවධානය ලෙස යැපීමට සිදු වේ.

නිරීක්ෂණ හා යෝජනා
ප්‍රශ්නය නිවැරදිව අවබෝධකරගෙන ගෝලීයකරණය හඳුන්වා එහි ධනාත්මක හා සෘණාත්මක බලපෑම් පරිසරයන් දක්වා ඇති නිසා නියමිත ලකුණ ලබා ගෙන ඇත.

ප්‍රශ්නය 01.

(iv) (අ) **'සංවිධාන සංස්කෘතිය' යන්න අර්ථකථනය කරන්න.**

පිළිතුර


සංවිධානයේ පුද්ගලයන් අතර බෙදා ගන්නා වූ
සම්ප්‍රදාය, රටා, ආකල්ප, විශ්වාස, වටිනාකම්
සිරිත් විරිත්, අගනාකම් සංවිධාන සංස්කෘතිය
ලෙස හැඳින්වේ.

නිරීක්ෂණ හා යෝජනා
සංවිධාන සංස්කෘතිය පැහැදිලිව අර්ථකතනය කර ඇත.

ප්‍රශ්නය 01.

(iv) (ආ) **සංවිධාන සංස්කෘතිය තුළ ඇති ශක්තියක් හා දුර්වලතාවයක් එක් උදාහරණය බැගින් දක්වමින් පැහැදිලි කරන්න.** **(ලකුණු 04 යි)**

පිළිතුර


සංවිධාන සංස්කෘතියේ ඇති ශක්තීන් ලෙස.
01. ව්‍යාපාරය සතු සත්‍යවාදීත්වය ඇති විට ගනුදෙනුකරුවා
ව්‍යාපාරය සතු කෙරෙහි ඇති විශ්වාසය
වැඩි වේ.
02. සේවක සේවන කාලය අඩු වීම - එනම් සංවිධාන
සංස්කෘතියත් පැවතීම නිසා කාලය අඩු වේ.
මෙය ව්‍යාපාරයට ශක්තියකි.
03. ව්‍යාපාරය සතුව ස්වයං විනයක් ඇති වීම.

සංවිධාන සංස්කෘතියේ ඇති දුර්වලතා ලෙස.
~~01. සේවක සේවන කාලය වැඩි~~
01. සේවක සේවන කාලය වැඩි වීම - එනම් සංවිධාන
සංස්කෘතියක් නොමැති වීම නිසා සේවක කාලය
වැය වේ. මෙය ව්‍යාපාරයට දුර්වලතාවකි.
02. සංවිධානය තුළ විවිධ උප සංස්කෘතීන් බිහි වීම.
03. සංවිධානය තුළ විවිධ අදහස් ව්‍යාප්ත වීම.

නිරීක්ෂණ හා යෝජනා
ප්‍රශ්නයෙන් විමසා ඇති සංවිධාන සංස්කෘතිය තුළ ඇති ශක්තීන් හා දුර්වලතාවයන් නිශ්චිත ව දක්වා ඇති පිළිතුරකි.

ප්‍රශ්නය **01.**

(v) ව්‍යාපාර සමාජ වගකීම් යනු කුමක් දැ'යි පැහැදිලි කර, වර්තමාන සමාජය තුළ එය වැදගත්වීමට හේතු **තුනක්** ලියන්න. (ලකුණු 04 යි)

පිළිතුර

(v) - ව්‍යාපාර ආයතනය වෙළෙඳපොළ තුළ කටයුතු
කිරීමේ දී [illegible] හා, පාරිභෝගිකයන් මෙන්ම
සමාජ මුළු මහත් සමාජයම එක් පාර්ශවයක් ලෙස
ලෙස සලකා එම පාර්ශවයට ගැලපෙන පරිදි
තම ව්‍යාපාර කටයුතු කරන වීම ව්‍යාපාර
සමාජ වගකීම වේ.
- සමාජ වගකීම වැදගත් වීමට හේතු,
1. වර්තමාන සමාජයේ, මත්ද්‍රව්‍ය වෙළෙඳාම් කරන
ව්‍යාපාර කොටස්කරුවන් අද සමාජ තුළ දක්නට ලැබීම
එම ව්‍යාපාරය තුළින් වන්නේ කරදර, [illegible]
[illegible] කාර්යය [illegible] සහ අඩක් ලෙස සමාජ
විරෝධීමට හේතු වීම.
2. ව්‍යාපාර හිමිකරුවන් මෙන්ම ප්‍රජාවද තම
දිවිපෙවෙත ඉතා සාර්ථක අයුරින් ගත කිරීමට
ව්‍යාපාර [illegible] නියුක්තියට දක්වන ආයතනවල
තුළ [illegible] ජීවනයට [illegible] හේතු වීම.

නිරීක්ෂණ හා යෝජනා

ප්‍රශ්නයෙන් විමසා ඇති ආකාරයට ව්‍යාපාර සමාජ වගකීම් යනු කුමක්දැයි පැහැදිලිකර නොතිබීම හා සමාජය තුළ එය වැදගත් වීමට හේතු නොසලකා ඇති පිළිතුරකි.

ප්‍රශ්න අංක **02.**

(ii) **කෘෂි නිෂ්පාදන සඳහා පනවනු ලබන ආනයන බදු තුළින් බලපෑම් ඇති වන පාර්ශ්ව හතරක් නම් කර, එමගින් එක් එක් පාර්ශ්වයට ලැබෙන වාසි එක බැගින් ලියන්න.** (ලකුණු 04 යි)

පිළිතුර



ආනයන බදු පැනවීම නිසා බලපෑමක් ඇතිවන පාර්ශව වනුයේ.
01. දේශීය කෘෂි නිෂ්පාදකයන්.
02. පාරිභෝගිකයන්
03. රජය.
04. ආනයන කරුවන්
05. ගොවීන්

01. කෘෂි නිෂ්පාදකයන්ට ඇති වාසි ලෙස.
1. ආනයන භාණ්ඩ [illegible]
2. [illegible]

පාරිභෝගිකයන්ට - 01. දේශීය වෙළඳපොළ තිබෙන නැවුම් හා ගුණාත්මක ආහාර පරිභෝජනයට අවස්ථාව ලැබීම වේ.

රජය - 01. ආනයන බදු නිසා රජයේ ආදායම ඉහළ යාම.

ගොවීන්ට - 01. දේශීය කෘෂි නිෂ්පාදන ආරක්ෂා වීම නිසා [illegible] හැකියාවක් ඇති වීම.

නිරීක්ෂණ හා යෝජනා
ප්‍රශ්නයේ විමසා ඇති ආකාරට ආනයන බදු තුළින් බලපෑම් ඇති කරන පාර්ශව හතරක් නිවැරදි ව දක්වා ඇත. එක් එක් පාර්ශ්වයට ලැබෙන වාසි පාර්ශව තුනකට පමණක් ලියා ඇත.

ප්‍රශ්න අංක **03.**

(i) රැකියාවක් කිරීමට වඩා තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ඔබගේ මිතුරෙකුට කැමැත්තක් පවතින නමුත් ඔහු තුළ ඒ සඳහා බියක් ද පවතී. රැකියාවක් කිරීමට වඩා ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ වාසි ඔහුට පැහැදිලි කිරීමට කරුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

පිළිතුර

i) 1. තමාගේම රැකියාවක් කිරීම තුලින් ස්වයං වින්දනය
- වෙනත් ආයතනයක් තුල රැකියාවක් කරනවාට වඩා
තමාගේම රැකියාවක් කිරීම හා තමන්ගේ ලාභ
බුක්තිය තුලින් ස්වයං ලෙස සතුට ඇති වීම. (01)

2. සියලු ලාභය තමා සතු වීම.
- ව්‍යාපාරය තමන් සතු වන්නේ සියලුම ලාභ තමා
සතු වීම.

3. පවුලේ සුබයද දායක කර ගත හැකි වීම.
- තමන්ගේ ව්‍යාපාරයක් නම් තම පවුලේ සුබයද
ලබා ගත හැකි වීම.

4. විශ්‍රාමය ගිහිම විටදී ව්‍යාපාරය ආරම්භ කර
හැකි වීම.
- තමන්ගේ ව්‍යාපාරයක් නම් ආරම්භ කිරීමේ
හා දියුණු කිරීමේ පහසුව (01)

නිරීක්ෂණ හා යෝජනා

රැකියාවක් කිරීමට සාපේක්ෂව ව්‍යාපාරයක් පවත්වාගෙනයාමෙන් ඇති වාසි තර්කානුකූලව සිතාබලා ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇත.

ප්‍රශ්න අංක **03.**

(v) "විද්‍යුත් මුදල් භාවිතය තුළින් වාසි මෙන් ම අවාසි ද සිදු වේ." මෙම ප්‍රකාශය විද්‍යුත් මුදල් භාවිතයේ වාසි හා අවාසි **දෙක** බැගින් දක්වමින් තහවුරු කරන්න. (ලකුණු 04 යි)

පිළිතුර

(01)

v) විද්‍යුත් මුදල් භාවිතයේ වාසි

1. ඕනෑම ස්ථානයක සිට භාවිතයෙන් ගෙවීම් කටයුතු පහසුවෙන් සිදු කළ හැකි වීම.
2. කාර්යක්ෂමකාරී වීම (01)
3. පහසු වීම (01)
4. ATM යන්ත්‍ර හරහා මුදල් ලබා ගත හැකි වීම.

විද්‍යුත් මුදල් භාවිතයේ අවාසි

1. තාක්ෂණික දැනුම අවශ්‍ය වීම. (01)
2. භාවිතය ගැටලු ඇතිවීම මගින් ගනුදෙනුව අවදානම් වීම.

නිරීක්ෂණ හා යෝජනා

විද්‍යුත් මුදල් භාවිතයේ දී ඇති අවාසි දැක්වීමේ දී ඊට අදාළ ව ඇති එක් අවාසියක්, අවාසි දෙකක් ලෙසට ඉදිරිපත් කර ඇති පිළිතුරකි.

ප්‍රශ්න අංක **04.**

පිළිතුර

(i) රක්ෂණය කළ **නොහැකි** අවදානම් **හතරක්** සඳහා උදාහරණ සපයන්න.

1. විනිමය අනුපාත වෙනස් අවදානම (01)
2. ආදායම් බදු වෙනස් අවදානම (01)
3. ස්වාභාවික අවදානම් (නායයෑම්, ගංවතුර ආදිය) (01)
4. තම ආයතනයේ සේවකයන් වර්ජනය කිරීම.

නිරීක්ෂණ හා යෝජනා

රක්ෂණය කළ හැකි හා නොහැකි අවදානම් නිශ්චිත ව හඳුනාගෙන එම අවධානම්වලට අදාළ උදාහරණ 4 ක් ඉදිරිපත් කර ඇති පිළිතුරකි.

ප්‍රශ්න අංක **05.**

(iv) **සංවිධානකරණයේ පියවර නම් කර, ඉන් පියවර තුනක් කෙටියෙන් විස්තර කරන්න.**

පිළිතුර

01. කාර්යය හඳුනා ගැනීම.
02. වැඩ බෙදීම.
03. දෙපාර්තමේන්තුකරණය.
04. අධිකාරිය හා වගකීම් පැවරීම.
05. වැඩ කිරීමේ ක්‍රම ඇති කිරීම.
06. සම්පත් ලබා දීම.
07. සමායෝජනය.

01. කාර්ය හඳුනා ගැනීම.
- ව්‍යවසායකයා සතුවෙන් ඉලක්ක වල කාර්යයන් මෙහිදී හඳුනා ගත යුතුය.

02. දෙපාර්තමේන්තු කරණය.
- රැකියාවල ස්වභාව / ගුණ ලක්ෂණ මත රැකියා කාණ්ඩගත කිරීම.

07. සමායෝජනය.
- විවිධ දෙපාර්තමේන්තු / අංශ අතර ~~තිබෙන~~ පවතින අරමුණු හා කාර්යයන් සමාගමේ පොදු අරමුණු ඉටු කර ගැනීමට ඒකාබද්ධ කිරීම.

නිරීක්ෂණ හා යෝජනා

සංවිධානකරණයේ පියවර අනුපිළිවෙලින් පැහැදිලි ව නම් කර තිබීම සහ ඉන් පියවර 3ක් පැහැදිලි ව විස්තර කර ඇති පිළිතුරකි.

ප්‍රශ්න අංක **06.**

(iv) විවිධ අරමුණු සඳහා ව්‍යාපාර විසින් ප්‍රචාරණය භාවිත කරනු ලැබේ. ප්‍රචාරණයේ අරමුණු **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

පිළිතුර


iv අ. භාණ්ඩය හෝ සේවාව පිළිබඳ පාරිභෝගිකයන් දැනුවත් කිරීම.
ආ. පාරිභෝගිකයන් පෙළඹවීම සඳහා / යොදාගැනීම
ඇ. පාරිභෝගිකයන් භාණ්ඩය සඳහා ආකර්ෂණය කර ගැනීම

නිරීක්ෂණ හා යෝජනා

න්‍යායාත්මක දැනුම විමසා බැලීම සඳහා ප්‍රචාරණයේ අරමුණු 4ක් සෘජුව විමසා ඇති ප්‍රශ්නයකි. අරමුණු දෙකක් පමණක් නිවැරදිව දක්වා ඇති පිළිතුරකි.

III කොටස

3 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

පොදු උපදෙස් :

- ⋆ ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද කුමන ප්‍රශ්න අනිවාර්ය වේ ද කොපමණ ලකුණු ලැබේ ද කොපමණ කාලයක් ලැබේ ද යන කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර, ප්‍රශ්න හොඳින් කියවා පිළිතුරු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන ප්‍රශ්න පිළිබඳව නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන පිළිතුරු ලිවිය යුතුය.
- ⋆ I පත්‍රයේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය දෙකයි.
- ⋆ II පත්‍රයේ I හා II උප කොටස්වලින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරාගෙන මුළු ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. කාලය පැය තුනයි.
- ⋆ සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.
- ⋆ අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.
- ⋆ ප්‍රශ්න අංක හා අනුකොටස් අංක නිවැරදිව සඳහන් කළ යුතුය.
- ⋆ සියලුම ප්‍රශ්න හොඳින් කියවා පිළිතුරු ලිවිය යුතුය. ප්‍රශ්න යටතේ දී ඇති තොරතුරුත්, ලබා ගත යුතු පිළිතුරු හෝ සාධනය කළ යුතු ප්‍රතිඵල කවරේ ද යන්නත් පැහැදිලිව අවබෝධ කර ගත යුතුය.
- ⋆ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී දී ඇති කාලය නිසි පරිදි කළමනාකරණය කර ගැනීමට වග බලා ගත යුතුය.
- ⋆ පැහැදිලි අත් අකුරින් පිළිතුරු සැපයිය යුතුය. පිළිතුරු ලිවීමේදී නිල් පාට හෝ කළු පාට පෑන් පමණක් භාවිත කළ යුතුය. අනෙකුත් පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතුය.
- ⋆ නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවලදී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවලදී කෙටි පිළිතුරු සැපයීමද නොකළ යුතුය.

විශේෂ උපදෙස් :

- * ප්‍රශ්න අංක 01 සිට 30 දක්වා බහුවරණ ප්‍රශ්න සඳහා නියමිත ස්ථානයේ නිවැරදි වරණයේ අංකය පෑනකින් සටහන් කළ යුතු යි.
- * ප්‍රශ්න අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළ හිස්තැනෙහි සුදුසු වචන ලියා හිස්තැන් පිරවිය යුතු යි.
- * ප්‍රශ්න අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු අදාළ ස්ථානයේ ලිවීම කළ යුතු යි.
- * ඒ ඒ ප්‍රශ්නය යටතේ ප්‍රශ්න අනු කොටස් සියල්ලටම නිවැරදි ඉලක්ක ගත පිළිතුරු ලිවිය යුතු ය.

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා

* ව්‍යාපාර අධ්‍යයනය විෂයයේ ස්වභාවය පිළිබඳ ව ගුරුවරයා ගැඹුරු හා පුළුල් අවබෝධයකින් ද යාවත්කාලීන වූ දැනුමකින් ද යුතුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට ප්‍රවේශ විය යුතුය. ව්‍යාපාර අධ්‍යයනය දිනෙන් දින වෙනස් වන විෂයය කරුණු රාශියකින් යුක්ත වේ. එමනිසා එම වෙනස්වීම් පිළිබඳ ව දැනුවත් වීමට ගුරුවරයා සමත් විය යුතුය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂයය න්‍යායාත්මක දැනුමෙන් ඔබ්බට විහිදෙන විෂයයකි. එම නිසා එම විෂයයට ආදරය කිරීමටත් එම විෂයය ක්ෂේත්‍රය තුළ ජීවත්වීමටත් (Love & Live) ගුරුවරයා සමත් විය යුතු අතර ඒ සඳහා අපේක්ෂකයින්ට මග පෙන්වීමක් ද කළ යුතුය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂයය උගන්වන ගුරුවරයා පන්ති කාමරය තුළ සිදුවන සාමාන්‍ය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට අමතරව කණ්ඩායම් ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර චාරිකා, ව්‍යාපෘති, ප්‍රදර්ශන, ඉදිරිපත් කිරීම් වැනි ක්‍රියාකාරකම් සමන්විත විවිධ ක්‍රම වේද විෂයය පිළිබඳ ව දැනුවත් කිරීම සඳහා භාවිත කළ යුතුය. විෂයය තුළ පවතින සංකල්ප තහවුරු කිරීමට හැකි සෑම අවස්ථාවකදී ම සිද්ධි අධ්‍යයනයන් යොදා ගත යුතුය. මෙම ක්‍රියාකාරකම්වලදී අපේක්ෂකයින්ගේ උපරිම සහභාගිත්වය සඳහා ඉඩ සැලසෙන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය. ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් විෂය කොටස් අවබෝධයට හා භාවිතයට අපේක්ෂකයින්ට ඉඩ ප්‍රස්ථා ලබා දිය යුතුය.

* නූතන ව්‍යාපාර ලෝකයේ ව්‍යාපාර කටයුතු අන්තර්ජාලය වැනි නූතන තාක්ෂණය හරහා සිදු වන බැවින් විෂයය දැනුම තහවුරු කිරීමේදී පහසුකම් අනුව වීඩියෝ දර්ශන, පරිගණක මෘදුකාංග, අන්තර්ජාල භාවිතය වැනි අවස්ථාද බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර සුහුරු පන්ති කාමර (SMART CLASS ROOM)වැනි නවීන තාක්ෂණික ක්‍රමවේද භාවිත කිරීම වඩා සුදුසුය.

* විෂයය අවබෝධය හා දැනුම යාවත්කාලීන කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව සහ අනෙකුත් ප්‍රකාශන, වාර්ෂික අයවැය යෝජනා, විෂය කරුණුවලට අදාළ අණ පනත්, නියෝග, නීතිරීති, ආයතනික පහසුකම් සපයන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වැනි සංවිධානවල නිල ප්‍රකාශන පරිශීලනය කළ යුතුය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශයේ අභිමතාර්ථ පරීක්ෂා කිරීමේදී ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් ඉටුකර ගත යුතු සුවිශේෂී අභිමතාර්ථ පද්ධතියක් ඇත. එම අභිමතාර්ථ ප්‍රධාන වශයෙන් එදිනෙදා ජීවිතයට අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප ලබාදෙන පරිදි සකස් කර ඇත. මීට අමතරව අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනැගෙන ජීවන පුරුදු බවට ඉගෙනුම් ඵලය සකස් විය යුතුය. එම අභිමතාර්ථ සාක්ෂාත් කරගත හැකිවන පරිදි ව්‍යාපාර අධ්‍යයනය විෂය ඉගැන්වීමේදී විවිධ ක්‍රම අනුගමනය කිරීමට ගුරුවරයා සැලකිලිමත් විය යුතුය. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය මගින් පෙන්වා දෙන මඟපෙන්වීම් ඔස්සේ ගුරුභවතා විසින් උචිත ක්‍රමවේද භාවිත කිරීම සාර්ථක ඉගෙනුම්- ඉගැන්වීම් වැඩ පිළිවෙළකට හේතුවනු ඇත.

* ගුරුවරයා තම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුරදී අපේක්ෂකයින් ඇගයීමට ලක්කළ යුතුය. පන්ති කාමරය තුළ අපේක්ෂකයින් ඉගෙනීමෙහි යෙදී සිටින අතරතුරදී ගුරුවරයාට ඔවුන්ගේ ඉගෙනුම් හැකියා, නොහැකියා හා ප්‍රවීණතා පිළිබඳ ව අවබෝධ කරගැනීමට එමගින් හැකියාව ලැබෙනු ඇත. ඒ අනුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුරදීම අපේක්ෂකයින්ගේ දුර්වලතා හඳුනා ගෙන ඒ සඳහා ප්‍රතිපෝෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගත යුතුය.

* ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි අඩංගු අභ්‍යාස කිරීමට අපේක්ෂකයින්ගේ අවධානය යොමුවන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමට උනන්දු විය යුතුය.

* ප්‍රශ්නයේ සඳහන් වන නිර්වචනය, අර්ථකථනය යන පද එකිනෙකට වෙනස් බව පෙන්වා දිය යුතුය. එමෙන්ම විමසන්න, පැහැදිලි කරන්න, විස්තර කරන්න, හඳුන්වන්න යන පද එකනෙකට වෙනස් අර්ථ දක්වන බව අපේක්ෂකයින්ට අවබෝධ කර දෙමින් එකිනෙකට වෙනස් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට ඔවුන් යොමු කරවිය යුතුය.

* ගුරුවරයා තමන්ගේ දැනුම භාවිත කරමින් කුඩා සිද්ධි අධ්‍යයන නිර්මාණය කර ඒ සඳහා න්‍යායාත්මක දැනුම යොදා ගන්නා ආකාරය අපේක්ෂකයින් සමඟ සාකච්ඡා කිරීම තුළින් එවැනි ප්‍රශ්න සඳහා ඔවුන් සූදානම් කළ හැකිය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂයේ II ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් සමන්විතය. මෙහි I කොටස 12 ශ්‍රේණියටත් II කොටස 13 ශ්‍රේණියටත් අදාළ වේ. සමස්ත ඇගයීම් දෙස බලන විට පෙනී යන්නේ I කොටස සඳහා වැඩිපුර ලකුණු ලබා ගෙන ඇති තත්ත්වයක් වුව ද II කොටස සඳහා අඩු ලකුණු ප්‍රමාණයක් ලබා ඇති තත්ත්වයකි. එම නිසා 13 ශ්‍රේණියට අදාළ පාඩම් ඒකක කෙරෙහි වැඩි අවධානයක් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යොමු කළ යුතුය. ඒ සමගම II කොටසේ ප්‍රශ්නවලට අපේක්ෂකයින් වැඩියෙන් පුරුදු පුහුණු කිරීමේ අවශ්‍යතාවයක් පවතින බව වටහාගත යුතුව ඇත.

* බ්ලූම්ගේ වර්ගීකරණයට අනුව දැනුම, අවබෝධය, භාවිතය, විග්‍රහය, ඇගයීම හා නිර්මාණය යන ඉගෙනුම් මට්ටම් II ප්‍රශ්න පත්‍රයේ සාධන තත්වයන් සමඟ සැසඳීමේ දී එතරම් සාර්ථකත්වයක් දැකිය නොහැකිය. එහි නිර්මාණය හා ඇගයීම යන ඉගෙනුම් මට්ටම් ඉතා අඩු ප්‍රතිශතයක ද දැනුම, අවබෝධය, භාවිතය හා විග්‍රහය සඳහා මධ්‍යස්ථ ප්‍රතිශත තත්වයක් ද පෙන්වන අතර ඉතා හොඳ සාධනීය තත්වයක් කිසිම මට්ටමක දී දක්නය නොලැබුණි. එම නිසා දැනුම, අවබෝධය, භාවිතය, විග්‍රහය, ඇගයීම හා නිර්මාණය යන සියළුම නිපුණතාවන් අපේක්ෂකයන්ට ලැබෙන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කළ යුතු වේ.

  අ.පො.ස. (උසස්.පෙළ) ව්‍යාපාර අධ්‍යයනය ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු සපයා ඇති ආකාරය දෙස බලන විට ව්‍යාපාර අධ්‍යයනය විෂයය හා සම්බන්ධ සංකල්ප, පාරිභාෂික පද, නව ප්‍රවණතා පිළිබඳ ව අපේක්ෂකයින් තුළ ඇති දැනුම ප්‍රමාණවත් නොවන බව පෙනී යයි. එමෙන්ම පිළිතුරු නිවැරදි ව ගළපා පැහැදිලි ව ඉදිරිපත් කිරීමට අපේක්ෂකයින් නිපුණතාව ලබා නොමැති බවද පෙනී යන තවත් කරුණකි. එම නිසා එම කරුණු කෙරෙහි පන්ති කාමර ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියේදී අවධානය යොමු කළ යුතුය.